

# වාර්ෂික වාර්තාව

# 2023

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# වාර්ෂික වාර්තාව 2023

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය



# පටුන


දැක්ම හා මෙහෙවර ..... 03

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් ..... 04

විගණන කමිටුවේ සාමාජිකයන් හා නිරීක්ෂකයන් ..... 05

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය ..... 05

ප්‍රවර්ධන හා අළෙවිකරණ කමිටුවේ සාමාජිකයන් ..... 06

සභාපතිතුමාගේ පණිවිඩය ..... 07

මූලික දත්ත ..... 09

ආයතනයේ පසුබිම ..... 10

ආයතන ව්‍යුහය හා සිදුකළ ක්‍රියාකාරකම් ..... 11

- තේ කොමසාරිස් අංශය ..... 12
- තේ අපනයන ඒකකය ..... 20
- තේ ප්‍රවර්ධන අංශය ..... 23
- තේ රසබැලීමේ ඒකකය ..... 37
- විශ්ලේෂණ විද්‍යාගාරය ..... 39
- පරිපාලන අංශය ..... 41
- අභ්‍යන්තර විගණන ඒකකය ..... 43
- තොරතුරු තාක්ෂණ ඒකකය ..... 43

කර්මාන්ත පැතිකඩ ..... 44

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම ..... 61

මූල්‍ය සමාලෝචනය ..... 63

විගණකාධිපතිතුමාගේ වාර්තාව ..... 97

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල ..... 106



**තැපැල් ලිපිනය** : **ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංකය** : **+94-11-2587814/ 2582121/ 2583687**

**විද්‍යුත් තැපෑල** : **teaboard@pureceylontea.com**

**වෙබ් අඩවිය** : **www.srilankateaboard.lk**
**www.pureceylontea.com**

## දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ
“වඩාත් ආකර්ෂණීය පානය”
බවට පත් කිරීම

## මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මඟින් රටට ලැබෙන
විදේශ විනිමය ඉපැයීම් වැඩිකර ගැනීම සහ එමඟින්
වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය
සුරක්ෂිත කිරීම

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් - 2023

## සභාපති

**නිරාජ් ද මෙල් මයා**
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ලේකම්

**එස්.ඒ. සිරිවර්ධන මයා**
අධ්‍යක්ෂ ජනරාල් (2023 මැයි දක්වා)

**ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා**
අධ්‍යක්ෂ ජනරාල් (වැඩ) (2023 මැයි සිට දෙසැ දක්වා)
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාමාජිකයන්

**ඩබ්.එම්.ඩි.වී. වික්‍රමසිංහ මිය**
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**ඩී. ජීවනාදන් මයා**
අතිරේක ලේකම්
වෙළඳ අමාත්‍යාංශය

**ජේ.පී.පී. ලියනගේ මිය**
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

**තුෂාර ප්‍රියදර්ශන මයා**
සභාපති (2023 සැප්. දක්වා)
**ඩී.පී. මහීපාල මයා**
සභාපති (නොවැ සිට දෙසැ දක්වා)
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**වයිෂාන් ප්‍රනාන්දු මයා**
සභාපති (2023 මාර්තු දක්වා)
**අනිල් කුක් මයා**
සභාපති (2023 අප්‍රේල් සිට)
කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

**ලයනල් හේරත් මයා**
සභාපති
ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය

**සේනක අලවත්තේගම මයා**
සභාපති
ලංකා වැවිලි කරුවන්ගේ සංගමය

**සන්ජේ හේරත් මයා**
සභාපති
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**ජේ.එස්. පතිරණ මයා**
සභාපති (2023 ජනවාරි දක්වා)
**කේ.එල්. ගුණරත්න මයා**
සභාපති (2023 පෙබරවාරි සිට)
ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

**ගනේෂ දෙවනායගම් මයා**
සභාපති
තේ අපනයනකරුවන්ගේ සංගමය

**ඩබ්ලිව්. එච්. එස්. සමරසේන මයා**
අමාත්‍ය නියෝජිත

## නිරීක්ෂකයන්

**අනිල් අල්විස් මයා**
අධ්‍යක්ෂ ජනරාල්
සීමා සහිත පෝතටුව තේ කම්හල (පුද්ගලික) සමාගම

# විගණන කමිටුවේ සාමාජිකයන් - 2023

## සභාපති

**ප්‍රියංගනී ලියනගේ මිය**
අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශය

## කැඳවුම්කරු

**එස්.ඒ. සිරිවර්ධන මයා**
අධ්‍යක්ෂ ජනරාල් (2023 මැයි දක්වා)
**ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා**
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) (2023 මැයි සිට දෙසැ. දක්වා)
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## නිරීක්ෂකයන්

**වී.ඩී. සීතා මිය**
ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

**කේ.ඒ.සී. ශාමන්ත මයා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක
වැවිලි අමාත්‍යාංශය

## සාමාජිකයන්

**ඩබ්.එම්. ඩී.ටී. වික්‍රමසිංහ මිය**
අතිරේක ලේකම්
වැවිලි අමාත්‍යාංශය

**ඩී. ජීවනාදන් මයා**
අතිරේක ලේකම්
වෙළඳ අමාත්‍යාංශය

**ගනේෂ් දෙවනායගම් මයා**
සභාපති
තේ අපනයනකරුවන්ගේ සංගමය

**සංජය හේරත් මයා**
සභාපති
ලංකා තේ වෙළඳුන්ගේ සංගමය

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2023

**අධ්‍යක්ෂ ජනරාල්** — එස්.ඒ. සිරිවර්ධන මයා (2023 මැයි දක්වා)
ඊ. ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා (වැ.බ) (2023 මැයි සිට දෙසැ. දක්වා)

**තේ කොමසාරිස්** — ඊ.ඒ.ජේ කේ. එදිරිසිංහ මයා

**අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)** — එච්.එල්.පවිත්‍රි පීරිස් මිය

**අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා)** — තුෂාරා ගුරුගේ මිය

**අධ්‍යක්ෂ (මුදල්)** — පී.ඒ. හිරොෂ් ජයංග මයා

# ප්‍රවර්ධන හා අළෙවි කමිටුවේ සාමාජිකයන් - 2023

## සභාපති

**නිරාජ් ද මෙල් මයා**
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාමාජිකයන්

**ඩබ්.එම්. ඩී.ටී. වික්‍රමසිංහ මිය**
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්)
වැවිල කර්මාන්ත අමාත්‍යාංශය

**එස්.ඒ. සිරිවර්ධන මයා**
අධ්‍යක්ෂ ජනරාල්
**ජයන්ත එදිරිසිංහ මයා**
වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**පවිත්‍රි පිරිස් මිය**
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

**විශ්ව ගොවින්දසාමි මයා**
කළමනාකරණ අධ්‍යක්ෂ
සන්ෂයින් හෝල්ඩින් පුද්. සමාගම

**සංජය හේරත් මයා**
සභාපති
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**ගනේෂ් දෙවනායගම් මයා**
සභාපති
තේ අපනයනකරුවන්ගේ සංගමය

**ජයන්ත කරුණාරත්න මයා**
හිටපු සභාපති
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**මුෆද්දල් ජෆර්ජී මයා**
නියෝජිත
තේ අපනයනකරුවන්ගේ සංගමය

**රොමේෂ් මොරායස් මයා**
උපදේශක / තේ අලෙවිකරණ විශේෂඥ
ෆින්ලේ සමාගම

**අවී ද සිල්වා මයා**
උපදේශක
එක්ටෙරා (පුද්) සමාගම

**අනිල් කුක් මයා**
ප්‍රධාන විධායක නිලධාරී
ආසියා සියාකා කොමඩිටීස් පුද්ගලික සමාගම

**ෆියාඩ් අක්බරලි මයා**
කළමනාකරණ අධ්‍යක්ෂ
අක්බාර් සමූහය

**දිල්හාන් සී. ප්‍රනාන්දු මයා**
අධ්‍යක්ෂ
MJF සමූහය

**චමින්ද ජයවර්ධන මයා**
කළමනාකරණ අධ්‍යක්ෂ
ලුම්බිණි තේ කම්හල

## නිරීක්ෂක

**අජිත් ද අල්විල් මයා**
ලේකම් ජනරාල්
ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය

# සභාපතිතුමාගේ පණිවිඩය



නිෂ්පාදනයේ වර්ධනයක් අත්කර ගැනීම වසර ආරම්භයේ දී පටන් ම කර්මාන්තයේ අපේක්ෂාව වූ අතර කුඩා තේ වතු හිමියන් ඇතුළු තේ නිෂ්පාදකයින් වැඩි වශයෙන් පොහොර භාවිත කරනු ඇතැයි යන පුර්ව නිගමනය මත එසේ බලාපොරොත්තු විය. මීට අමතරව, වල්නාශක භාවිතය තහනම් කිරීම හේතුවෙන් සැලකිය යුතු අන්දමින් වර්ධනය වී තිබූ වල් පැලෑටි ඉවත් කිරීම සඳහා ග්ලයිෆොසේට් භාවිතයට මුදාහැරීම හේතුවෙන් ද ප්‍රාදේශීය වැවිලි සමාගම් වතුවල පොහොර භාවිතය දෙගුණ විය. කෙසේ වෙතත්, පසුගිය වසර දෙක තුළ පොහොර භාවිත නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2022 වසරට සාපේක්ෂව සමාලෝචිත වසරේ ඇතැම් මාසවල නිෂ්පාදනයේ ඍජු වර්ධනය යම් මට්ටමකින් අඩාල වෙමින් තේ වගාවට සෘණාත්මක බලපෑමක් ඇතිවිය. අගෝස්තු මාසයේ ඇතිවූ අධික නියගයෙන් පසුව සැප්තැම්බර් සිට වසර අවසානය දක්වා ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය. කුඩා තේ වතු හිමියන් බෙහොමයක් පොහොර භාවිත කිරීමට කැමැත්තක් නොදැක්වූ හෙයින් විශේෂයෙන්ම වර්ධනය අඩු ප්‍රදේශවල නිෂ්පාදන ලාභ සඳහා වැඩි කර ගැනීම සඳහා දරනු ලබන ප්‍රයත්නයන් තව දුරටත් පසුබෑමකට ලක් විය. 2022 වසර හා සැසඳීමේ දී තේ මිලෙහි විශාල පහත වැටීමක් දක්නට ලැබුනද, කුඩා වතු හිමියන් සඳහා කිලෝ ග්‍රෑම් 50 පොහොර මිටියක මිල තවමත් දැරිය නොහැකි මට්ටමක පවති. ඉහළ සහ මධ්‍යම උන්නතාංශ ප්‍රදේශවල නිෂ්පාදනය ඉහල යාම හේතුවෙන් ප්‍රධාන වශයෙන් 2022 වසරට වඩා කිලෝ ග්‍රෑම් මිලියන 4.2ක වර්ධනයක් සමාලෝචිත වසර අවසානයේ දක්නට හැකිවිය. 2022 වසරට සාපේක්ෂව පහළ උන්නතාංශ ප්‍රදේශවල නිෂ්පාදනය කිලෝ මිලියනයකින් අඩුවිය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර මැද දී තේ මිල විශාල වශයෙන් පහත වැටීමට පටන් ගන්නා ලදී. සමාලෝචිත වසරේ තේ මිල 2022 වසරේ අදාළ කාලවල පැවති තේ මිල මට්ටම්වලට වඩා අඩු වීමට මෙම තත්වය හේතු වූ අතර වසර අවසානය දක්වාම තේ මිලෙහි අඩු වීමක් දක්නට හැකිවිය.

## තේ නිෂ්පාදනය

පෙර වසරේ වූ කිලෝ මිලියන 251.5 ට සාපේක්ෂව 2023 වසර තුළ වාර්තා වූ වාර්ෂික තේ නිෂ්පාදනය වූ කිලෝ මිලියන 256ක ප්‍රමාණය, වසර මුලදී පුරෝකථනය කළ කිලෝ මිලියන 265 - 270 අතර ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩුවිය. සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය 90% ක කොටසක් වන අතර ශ්‍රී ලංකාවේ CTC තේ නිෂ්පාදනය 9% කි. තේ කර්මාන්තයේ සමස්ත වාතාවරණය හා මෙම වාර්තාවේ සඳහන් කරුණු අනුව තේ නිෂ්පාදනය අකාර්ෂණීය ලෙස ඉහල ගොස් නොමැති බව සාරාංශයක් වශයෙන් සඳහන් කළ හැකිය.

## තේ අපනයනය

2022 වසරේ දී උපයාගත් රුපියල් බිලියන 411ක ප්‍රමාණය ඉක්මවමින් රුපියල් බිලියන 428ක තේ අපනයන ආදායමක් මෙම වසරේ දී ලබා ගැනීමට හැකිවිය. 2022 වසරේ ඩොලර් බිලියන 1.265ක් වූ ශ්‍රී ලංකාවේ තේ අපනයන ආදායම ඩොලර් බිලියන 1.31 දක්වා ඉහළ ගොස් ඇති බව සඳහන් කිරීම සතුටට කරුණකි. ඉපැයීම්වල මෙම වැඩිවීම් සිදු වුයේ අපනයන 3.3% ක ප්‍රමාණයකින් පහත වැටී තිබූ පසුබිමක් තුළය. නිෂ්පාදනයේ අඩු වර්ධනයක් සහිත වසරක දී කිලෝ මිලියන 250.5ට සාපේක්ෂව කිලෝ මිලියන 241.9ක ප්‍රමාණයක් අපනයනය කිරීම යම් ආකාරයකින් අපේක්ෂා භංගත්වයක් වන අතර එය 2022 වසරේ දක්නට ලැබුන සෘණාත්මක බව 2023 වසර දක්වා ඉදිරියට ගෙනයාමක් වශයෙන් සඳහන් කළ හැකිය.

2022 වසර තුළ වාර්තා වූ තේ කිලෝවක මිල වූ ඇමරිකානු ඩොලර් 5.03 ඉක්මවමින් FOB තේ කිලෝවක මිල ඇමරිකානු ඩොලර් 5.41ක් විය. තේ ආනයනකරුවන් විසින් 2023 දී සිලෝන් තේ සඳහා ඉහළ මිලක් ගෙවීමට කරුණු 2 ක් හේතු විය. එනම්, එහි සුවිශේෂී ස්වභාවය වූ තේ අතර ජනප්‍රියත්වය මෙන්ම සීමිත සැපයුම ය.

## ජාත්‍යන්තර තේ වෙළඳපල තුළ සිලෝන් තේ හි කාර්ය සාධනය

ශ්‍රී ලංකාව විසින් ගෝලීය නිෂ්පාදනයෙන් 5%ක කොටසක් හා සැපයුම්වල (අපනයන) 14%ක ප්‍රමාණයක් සඳහා අඛණ්ඩව උරුමකම් කියනු ලබයි. විශාලතම ගෝලීය නිෂ්පාදකයින් දෙදෙනා වන චීනය සහ ඉන්දියාව තම වාර්ෂික නිෂ්පාදනයෙන් 80%ක් පමණ අභ්‍යන්තරව පරිභෝජනය කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ශ්‍රී ලංකාව හා ඉරානය අතර 2023 වසරේ අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලද තේ සඳහා තෙල් නුවමාරු යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ තේ සම්බන්ධයෙන් දක්නට හැකි තවත් සුවිශේෂී කරුණක් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉරාන තේ ආනයනකරුවන් වැඩි වැඩියෙන් සිලෝන් තේ ආනයනය කිරීමට යොමු විය. සිලෝන් තේ සඳහා ඉරාන තේ පාරිභෝගිකයින් තුළ පවතින සුවිශේෂී රුචිකත්වය මෙයින් තහවුරු වේ.

## තේ වෙළඳාම

තේ කිලෝවක සාමාන්‍ය මිල රු. 1171ක් වශයෙන් පවත්වා ගනිමින් සමාලෝචිත වර්ෂය තුළ තේ කිලෝ මිලියන 249.65ක් අලෙවි කර ඇත. 2022 වර්ෂය තුළ තේ කිලෝවක සාමාන්‍ය සමස්ත මිල වුයේ රු. 1234කි.

## සංවර්ධන කටයුතු

මෙම වසරේ දී සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරන ලද අතර, පසුගිය වසරවල සිට පැවත එන ඇතැම් ව්‍යාපෘති අබණ්ඩව ක්‍රියාත්මක විය. එනම්, කර්මාන්තශාලාවලට සපයනු ලබන තේ දළුවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා වන B 60 වැඩසටහන, තේ අගයදාම කළමනාකරණ පද්ධතිය (TVMS) ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම, තේ ඉඩම් ලියාපදිංචි කිරීම යාවත්කාලීන කිරීම, පිළිගත් ප්‍රමිතියට අනුව තේ තවාන් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

මීට අමතරවල පහත සඳහන් ව්‍යාපෘති ද අබණ්ඩව සිදු කරන ලදී.

- 2019 දී ආරම්භ කරන ලද ආදර්ශ තේ වගා පිහිටුවීම.
- 2021 දී ආරම්භ කරන ලද පල සම්පාදන ව්‍යාපෘතිය.
- 2021 දී ආරම්භ කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ අවසන් ගෙවීම් කටයුතු.
- 2020 දී ආරම්භ කරන ලද තේ වතුවල උස් සෙවණ ස්ථාපිත කිරීමේ වැඩසටහන.
- යාන්ත්‍රිකකරණය භාවිත කිරීමේ අරමුණින් හඳුන්වාදුන් නැවත වගා කිරීමේ වැඩසටහන.
- වගාකරුවන්ට පොහොර බෙදා හැරීම සඳහා තේ කර්මාන්තශාලා වෙත හඳුන්වාදුන් මාස 3 කින් ආපසු ගෙවිය හැකි පොලී රහිත ණය යෝජනා ක්‍රමය.
- සෘජු රෝපණ කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ලබා දෙමින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට සහාය වීමේ වැඩසටහන.
- කර්මාන්තශාලා නවීකරණය සඳහා සහනාධාර ලබා දීමේ වැඩසටහන.
- නැවත වගාකිරීම, නව පැළ සිටුවීම හා පාලු සිටවීමේ වැඩසටහන.

## ප්‍රවර්ධනය හා වෙළඳාම

ප්‍රවර්ධන හා අලෙවි කරණ කමිටුව (PMC) විසින් හඳුනාගෙන අනුමත කරන ලද වෙළඳ ප්‍රදර්ශන සඳහා එකී සමාගම් සහභාගී වීමේ දී ඒ සඳහා අවැසි සහාය හා පහසුකම් ලබා දීම මෙන්ම PMC සහ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර අනුමත කරන ලද තේ සමාගම්වල සන්නාම ප්‍රවර්ධන වැඩසටහන් සඳහා 50% ක ආධාර ලබා දීම යනාදිය වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

මීට අමතරව පෙර වසර තුළ වර්ධනයක් පෙන්නුම් කර ඇති සිංහ ලාංඡනය සහිත ශ්‍රී ලංකාවට අයත් සන්නාම අලෙවි කරන අපනයනකරුවන්ට තම අපනයන වැඩිවීමේ වටිනාකමින් 5%ක දිරි දීමනාවක් ලබා දීම පසුගිය වසර කිහිපය තුළ ක්‍රියාත්මක වූ තවත් වැඩසටහනක් වේ.

කෙසේවෙතත්, තෝරාගත් ප්‍රධාන රටවල් අතර පවතින බොහෝ අවහිරතාවයන් හේතුවෙන් සහ විශේෂයෙන් වසර තුළ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එල්ල වූ විවේචන හේතුවෙන් ගෝලීය ප්‍රවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. සිදුකර ඇති කාර්යයන් ඇගයීමට හා ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට ප්‍රවර්ධන සහ අලෙවි ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කරන ලෙස කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය තේ පර්යේෂණ ආයතනයෙන් ඉල්ලා ඇත.

## GI වැඩසටහන

GI වැඩසටහන සර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, යුරෝපා සංගම් කලාපයේ GI සහතිකය ලබා ගැනීම සඳහා වන අයදුම්පත 2024 මුල් භාගයේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී, ආචාර්ය ඩෙල්ෆින් මාරි විවියනගේ නොමද සහාය ලද CIRAD ප්‍රංශ නියෝජිතායතනය විසින් ලබා දෙන ලද තාක්ෂණික සහාය හා මගපෙන්වීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශේෂ ඇගයීමට පාත්‍ර වේ. AFD ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය වෙතින් ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 1.1 ක මූල්‍ය සහය සමස්ත ශ්‍රී ලංකා තේ කර්මාන්තය විසින් පිළිගනු ලබන අතර එය ඉහලින් අගය කරනු ලැබේ.

## තුති පිදුම

නියාමන, සංවර්ධන හා ප්‍රවර්ධන යනාදී වශයෙන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට පැවරී ඇති වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන මෙහෙය අගය කොට සලකනු ලැබේ. නැවත වරක් මෙරට තේ කර්මාන්තයේ ඉහළ ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා ඔවුන්ගේ කැපවීම සහ වගවීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මහෝපකාරී වී ඇත. එකී කර්තව්‍යය සඳහා උර දී කටයුතු කරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සියලුම අංශයන්හි සියලුම නිලධාරීන්ට සහ සහායක කාර්ය මණ්ඩලයට මගේ කෘතඥතාව පුදකරමි.



නිරාජ් ද මෙල්
සභාපති

# මූලික දත්ත

| වර්ගය | ඒකක | 2021 | 2022 | 2023 | 2022 සහ 2023 වෙනස (%) |
|---|---|---|---|---|---|
| සමස්ථ තේ නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලි | 299.49 | 251.50 | 256.09 | 1.69 |
| උන්නතාංශය අනුව වර්ගීකරණය | | | | | |
| උඩරට | කි.ග්‍රෑ. මිලි | 65.33 | 56.30 | 58.64 | 2.96 |
| මැදරට | කි.ග්‍රෑ. මිලි | 50.99 | 40.20 | 42.34 | 6.58 |
| පහතරට | කි.ග්‍රෑ. මිලි | 183.18 | 155.00 | 155.11 | (0.03) |
| සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය | | | | | |
| සාම්ප්‍රදායික (පෙරව ඇතුළුව) | කි.ග්‍රෑ. මිලි | 270.72 | 227.10 | 231.19 | 1.65 |
| සී.ටී.සී. තේ | කි.ග්‍රෑ. මිලි | 26.19 | 22.60 | 22.62 | 0.12 |
| හරිත තේ | කි.ග්‍රෑ. මිලි | 2.57 | 1.80 | 2.28 | 26.18 |
| | | | | | |
| ක්ෂණික තේ නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලි | 3.64 | 4.47 | 3.20 | 28.35 |
| **තේ අලෙවිය (රාජ්‍ය, සෘජු, පෞද්ගලික විකුණුම් ඇතුළුව)** | | | | | |
| සමස්ථ තේ විකුණුම් | කි.ග්‍රෑ. මිලි | 295.79 | 248.64 | 249.65 | 0.41 |
| උඩරට | කි.ග්‍රෑ. මිලි | 63.52 | 53.72 | 56.47 | 5.12 |
| මැදරට | කි.ග්‍රෑ. මිලි | 52.34 | 42.08 | 41.87 | (0.50) |
| පහතරට | කි.ග්‍රෑ. මිලි | 179.94 | 152.84 | 151.31 | (1.00) |
| සමස්ථ තේ විකුණුම් | රු / කි.ග්‍රෑ. | 615.44 | 1,234.24 | 1,171.29 | (5.10) |
| උඩරට | රු / කි.ග්‍රෑ. | 587.13 | 1,093.10 | 1,072.48 | (1.89) |
| මැදරට | රු / කි.ග්‍රෑ. | 550.80 | 1,030.82 | 1,012.35 | (1.79) |
| පහතරට | රු / කි.ග්‍රෑ. | 644.23 | 1,339.86 | 1,252.15 | (6.55) |
| **තේ අපනයන** | | | | | |
| තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන හැර) | කි.ග්‍රෑ. මිලි | 276.00 | 241.65 | 231.46 | (4.22) |
| ප්‍රවර්ග අනුව වර්ගීකරණය | | | | | |
| කළු තේ | කි.ග්‍රෑ. මිලි | 270.76 | 236.77 | 226.75 | (4.23) |
| හරිත තේ | කි.ග්‍රෑ. මිලි | 2.27 | 1.85 | 1.99 | 7.29 |
| ක්ෂණික තේ | කි.ග්‍රෑ. මිලි | 2.97 | 3.02 | 2.72 | (10.12) |
| තේ අපනයන වටිනාකම (ප්‍රති අපනයන හැර) | රු.බිලි. | 249.10 | 389.50 | 401.84 | 3.17 |
| ප්‍රවර්ග අනුව අපනයන ආදායම | | | | | |
| කළු තේ | රු.බිලි. | 238.86 | 374.22 | 384.56 | 2.76 |
| හරිත තේ | රු.බිලි. | 5.07 | 7.25 | 8.02 | 10.63 |
| ක්ෂණික තේ | රු.බිලි. | 5.16 | 8.04 | 9.26 | 15.27 |
| **සමස්ත තේ අපනයන ප්‍රමාණය** | **කි.ග්‍රෑ. මිලි** | **285.87** | **250.17** | **241.91** | **(3.30)** |
| **සමස්ත තේ අපනයන වටිනාකම** | **රු.බිලි.** | **263.35** | **411.05** | **428.29** | **4.19** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව

කි.ග්‍රෑ. මිලි - කිලෝ ග්‍රෑම් මිලියන

# 1. ආයතනයේ පසුබිම

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29, 2006 අංක 44 සහ 2018 අංක 13 දරණ පනත් මගින් සංශෝධිත 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ තේ පාලන දෙපාර්තමේන්තුව - 1957 අංක 51 දරණ තේ පාලන පනත, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය- 1925 තේ පර්යේෂණ ආඥාපනත සහ ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය ඒකාබද්ධ කරමින් 1976 ජනවාරි පළමු වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. 1993 දී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, 1993 අංක 52 දරණ තේ පර්යේෂණ පනතේ කළමනාකරණය යටතට පත්විය. ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන නීති හා රෙගුලාසි හැඩගස්වා ගැනීමේ අවශ්‍යතාවයන් මත පදනම්ව ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි හා තේ පාලන පනතෙහි සංශෝධනයන් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීමට පෙර, ගෝලීය සන්දර්භය තුළ පුද්ගලික අංශය විසින් සිදු කරන ලද ශ්‍රී ලංකා තේ (සිලෝන් තේ) ප්‍රවර්ධනය කිරීමේ කාර්යය තේ ප්‍රචාරක මණ්ඩලය විසින් මෙහෙයවන ලදී. 1976 දී, තේ ප්‍රචාරක මණ්ඩලය පාර්ලිමේන්තුව මගින් අහෝසි කරන ලද අතර තේ ප්‍රචාරක මණ්ඩලය තේ කර්මාන්තයට ඇති බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය බවට පරිවර්තනය කරන ලදී.

නියාමන ආයතනය ලෙස තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. එනම්, නිෂ්පාදනය, වගා කිරීම වැඩි දියුණු කිරීම, නැවත සිටුවීම, පැරණි වතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම ආදියයි. එයට අමතරව, තේ වතු කළමනාකරණයෙහි සහ දේශීය හා විදේශීය තේ නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයෙහි නියැලි සිටින සියලුම ආයතන සහ සංවිධාන පාලනය කිරීම මෙන්ම මෙහෙයවීම මෙමගින් සිදු කෙරේ. සිලෝන් තේවල ගුණාත්මකභාවය, පවත්වා ගැනීම සඳහා කර්මාන්තශාලාවේ සිට බෙදා හැරීමේ අවස්ථාව දක්වා වූ සමස්ත ක්‍රියාවලියම අධීක්ෂණය කර ඇගයීමට ලක් කර ඇති අතර විකුණුම්, පුර්ව බෙදාහැරීම, තැරැව්කරුවන්ගේ ගබඩාවන්, මිශ්‍ර කරන්නන්, අපනයනකරුවන් සහ මිශ්‍රණය සහ ගබඩා කිරීම සනිපාරක්ෂකව කිරීම පිළිබඳ උපදේශන සේවා සැපයීම යන අවස්ථාවන්හි තේවල ගුණාත්මක ප්‍රමිතීන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ආරම්භ කර තිබේ.

සංවර්ධන කාර්යයන් යටතේ, වගාකරුවාගේ සිට අපනයනකරුවන් දක්වා අගය දාමයේ සියලුම ස්ථාන ආවරණය වන පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර , දැනුවත් කිරීමේ වැඩසටහන් සහ උපදේශන වැඩසටහන් සඳහා පහසුකම් සපයයි. සහනාධාර, තේ වගාකරුවන්, කර්මාන්තශාලා සහ පෙව පොහොර නිෂ්පාදකයින් සඳහා දැනුවත් කිරීම් වලට අමතරව තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමට, අමු තේ සහ තේවල ගුණාත්මක බව ඉහළ නැංවීමට සහ අවසානයේ තේ කෝප්පයකට නැතහොත් තේ කිලෝවකට වඩාත් හොඳ මිලක් ලබාගැනීම සඳහා සංවර්ධන වැඩසටහන් රැසක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 සිට ක්‍රියාත්මක කෙරේ.

සංවේදී හා රසායනික නියැදි විශ්ලේෂණ මගින් වෙන්දේසිට පෙර සහ පසු තේ සාම්පල ඇගයීමට ලක් කිරීම තේ රස බැලීමේ ඒකකය මගින් සිදු කෙරේ. නියාමන සහ සංවර්ධන කාර්යයන් හරහා ලැබෙන තේ සාම්පල සඳහා තත්ව සහතික නිකුත් කිරීම සහ කර්මාන්ත පාර්ශවකරුවන් ආවරණය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරනු ලබයි.


ගෝලීය වශයෙන් උපාය මාර්ගික ප්‍රවේශයන් ඔස්සේ සිලෝන් තේ සම්බන්ධ අලෙවිකරණ හා ප්‍රවර්ධනය කටයුතු ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් සිදු කරනු ලබයි. ලොව පුරා පවතින අස්ථාවර ආර්ථික තත්වය සහ පාරිභෝගිකයින්ගේ පරිභෝජන රටාවන් සහ මිලදී ගැනීමේ හැකියාවන් වෙනස් කරමින්, තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ විදේශ විනිමය ඉපැයීම් සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සිලෝන් තේවල ස්ථාවරබව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රයත්න දරනු ලබයි.

කර්මාන්තයේ ප්‍රමුඛතම ආයතනය ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනය, අලෙවිකරණය, අපනයන, තේ සම්බන්ධ ගෝලීය තත්වයන් සහ ඉදිරි වසර සඳහා ඉලක්ක සම්බන්ධ සංඛ්‍යාලේඛන සපයයි.

තේ කර්මාන්තයට අදාළ තීරණ සහ ක්‍රියාත්මක කිරීම් අවසාන වශයෙන් අනුමත කරනු ලබන්නේ පාර්ශ්වකරුවන් සහ රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ඇතුලු බලධාරීන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම හා ඒ සඳහා උපදෙස් ලබා දීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර විශේෂයෙන් එමගින් භාණ්ඩාගාර ප්‍රදාන සඳහා නිර්දේශ සහ අනුමැතින් ලබා දේ.

# 2. ව්‍යුහය සහ සිදු කළ ක්‍රියාකාරකම්



# 2.1.තේ කොමසාරිස් අංශය

තේ කොමසාරිස්වරයා ගේ මුලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ විධිවිධාන යටතේ කොමසාරිස් පත් කරනු ලැබේ. 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත මගින් පාලනය වන නියාමන සහ අධීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු මෙම අංශය විසින් පාලනය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් තේ කොමසාරිස් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. නියාමන, සංවර්ධන හා අපනයන යන ප්‍රධාන අංශ තුනකට තේ කොමසාරිස් අංශයේ කටයුතු බෙදනු ලැබේ. තේ අපනයන අංශය වෙනම ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර එහි කටයුතු මෙම වාර්තාවේ තේ අපනයන අංශය පිළිබඳ කොටසේදී විස්තරාත්මකව දක්වා ඇත.

ගම්පොල, බණ්ඩාරවෙල, රත්නපුර, මාතර, බදුරලිය, ගාල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 07ක් වෙතට තේ කොමසාරිස් අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

- තේ නිෂ්පාදකයන් සහ කර්මාන්තශාලා ලියාපදිංචිය සහ අලුත් කිරීම
- හරිත තේ දළු වෙළෙන්දන් ලියාපදිංචිය සහ අධීක්ෂණය
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය සහ අධීක්ෂණය
- කර්මාන්ත ශාලා සහ වෙළෙන්දන් මගින් දළු සැපයුම්කරුවන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය කිරීම
- තේ කර්මාන්තශාලාවල හා ගබඩාවල යහපත් නිෂ්පාදන ක්‍රම (GMP) පිළිබඳව අධීක්ෂණය
- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත රැස් කිරීම හා අදාළ ආයතනවලට ඒවා ලබා දීම
- තේ කර්මාන්තශාලාවල, වෙළෙඳුන්ගේ මධ්‍යස්ථානවල සහ කසළ තේ සැකසුම් මධ්‍යස්ථානවල විශේෂ විමර්ශන පැවැත්වීම
- තේ වගා කරනු ලබන ප්‍රදේශවල තේ නිෂ්පාදනය, තේ දළු එකතු කිරීම, කසල තේ සැකසීම පිළිබඳ නියාමනය හා උපදේශන සේවා ලබා දීම
- B 60 වැඩසටහන දිගටම කරගෙන යාමෙන් හරිත තේ දළුවල තත්වය ඉහළ දැමීම සඳහා සහ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- තම යන්ත්‍ර ධාරිතාව හා කර්මාන්ත ශාලාවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහාය ලබා දෙනු වස්, කර්මාන්තශාලා නවීකරණය සඳහා සහනාධාර ලබා දීම
- තේ නැවත වගාව, අලුතෙන් වගා කිරීම, පාළු සිටවීම ආදිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය
- යන්ත්‍ර ආධාරයෙන් නෙලීම කේන්ද්‍ර කරගත් බඩවැට පේලි සිටුවීම සහ නැවත වගා කිරීමේ වැඩසටහන් දිරිමත් කිරීම
- තේ වතු ආශ්‍රිත චාරිමාර්ග පද්ධති සවිකිරීම සඳහා සහනාධාර ලබාදීම
- තේ ක්ෂේත්‍රයේ කාබනික පොහොර නිෂ්පාදකයින් දිරිමත් කිරීමට ආරම්භ කරන ලද පෙව පොහොර ව්‍යාපෘති සඳහා සහනාධාර ලබා දීම අබණ්ඩව සිදු කිරීම
- සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය අබණ්ඩව ක්‍රියාත්මක කිරීම
- තෙතමන මීටර් මිලදී ගැනීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- ආහාර සුරක්ෂිතතා සහතික කිරීම (HACCP) සඳහා සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- 8% ක වාර්ෂික පොලී පදනම යටතේ තේ දළු සැපයුම්කරුවන් සඳහා පොහොර මිලදී ගැනීම සඳහා තේ තැරැව්කරුවන් මගින් තේ කර්මාන්තශාලා වෙතට මෘදු ණය යෝජනා ක්‍රමය ආරම්භ කිරීම
- තේ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රියාත්මක කිරීම
- නියාමන කටයුතුවල නියැලී සිටින ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිසිය හා ආරක්ෂක අංශ වෙත සහයෝගය ලබා දීම.
- තේ ඉඩම් ලියාපදිංචිය ක්‍රියාත්මක කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීම

## 2.1.1.නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකිණීම සඳහා ද තේ නිෂ්පාදකයින් තේ කොමසාරිස් අංශයෙහි ලියාපදිංචි විය යුතුයි. නිමි තේ නිෂ්පාදනය කරන ලියාපදිංචි සියලුම කර්මාන්තශාලා විසින් ගොඩනැගිලි, උපකරණ සහ කර්මාන්තශාලා මෙහෙයුම් කටයුතු අවම තත්ත්ව ප්‍රමිතීන් අනුව පවත්වා ගත යුතු මෙම ප්‍රමිතීන් මගින් නිෂ්පාදනය වන තේ උසස් ගුණාත්මක තත්වයේ තේ බවට කරනු ලැබේ.

වගුව 2.1.1: මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

| තත්වය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි තේ කර්මාන්තශාලා ගණන | 205 | 244 | 566 | 1,015 |
| 2023 වසරේ ක්‍රියාත්මක තේ කර්මාන්තශාලා ගණන (සම්ප්‍රදායික/CTC/හරිත ) | 157 | 112 | 385 | 654 |
| ලියාපදිංචි අතින් සාදන තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | 5 | 8 | 27 | 40 |
| ලියාපදිංචි කසල තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | 31 | 88 | 41 | 160 |
| ලියාපදිංචි ප්‍රදර්ශන තේ කම්හල් සංඛ්‍යාව | - | 1 | - | 1 |
| 2023 වසරේ දී ක්‍රියාත්මක නොවන තේ කම්හල් සංඛ්‍යාව | 12 | 35 | 113 | 160 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### අතින් සාදන තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම

තේ පාලන පනතේ විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ අතින් සාදන තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම සඳහා නව යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම කටයුත්ත මගින් මූලික වශයෙන් කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට සහාය වීමට අරමුණු කරයි. සුවිශේෂී ගුණාත්මක භාවය සහ අද්විතීය නිෂ්පාදන ක්‍රම හේතුවෙන් අතින් සාදන තේ සඳහා ගෝලීය වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම තේ සාමාන්‍යයෙන් අතින් නෙලන අතර සාම්ප්‍රදායික, කාබනික හෝ තිරසාර පිළිවෙත් භාවිතයෙන් වගා කෙරේ. අද වන විට අතින් සාදනු ලබන තේ නිෂ්පාදකයින් 40 දෙනෙකු මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇත.

## 2.1.2.මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවිය හැකි සාධාරණ මිල ගණන්

මිලදී ගත් දළු සකස් කරනු ලබන කර්මාන්තශාලා තේ කොමසාරිස්වරයාගේ සාධාරණ මිල සූත්‍රයට අනුව ඒ සඳහා ගෙවීම් කළ යුතු බව තේ පාලන පනත මගින් නියම කරනු ලබයි. මෙම කර්මාන්තශාලා එසේ ගෙවීම් කරනු ලබන බව තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය තේ පරීක්ෂකවරුන් විසින් මාසිකව පරීක්ෂණ පවත්වනු ලබයි. සෑම ප්‍රදේශයකම සහකාර තේ කොමසාරිස්වරු විසින් මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබයි. ගෙවීම් පැහැර හැරීම් හෝ ප්‍රමාද වූ ගෙවීම් පිළිබඳ ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කටයුතු කරයි. එවැනි පැමිණිලි විමර්ශනය කිරීමෙන් පසු ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වෙන්දේසියෙන් ලැබෙන මුදලින් නියමිත මුදල් අය කරගෙන ඒවා දළු සැපයුම්කරුවන් වෙත ලබා දෙයි.

### ප්‍රමාද වූ ගෙවීම්

සමාලෝචිත වර්ෂය තුළ 2023 ජනවාරි පළමු දිනට හරිත තේ දළු සපයන්නන් සඳහා ගෙවීමට තිබූ මුළු අගය වූයේ රුපියල් මිලියන 972 කි. අමතරව, රුපියල් මිලියන 70.3 ක් අයකර ගෙන දළු සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සිදු කර ඇත.

වගුව 2.1.2: ගෙවීමට ඇති ගාස්තු පිළිබඳ විස්තරය (රුපියල්)

| ප්‍රදේශය | 2023.01.01 දිනට මුදල | 2023 වර්ෂයේදී එකතු-වූ මුදල | පියවාගත් සහ ගෙවන ලද මුදල | 2023.12.31 දිනට කුඩා තේ වත හිමියන්ට ගෙවිය යුතු ශේෂය (රු) | ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු) | වසා දමන ලද කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු) |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 415,538,692.71 | 147,589,175.89 | 3,935,002.33 | 559,192,866.27 | 353,267,759.66 | 187,801,400.93 |
| මාතර | 64,139,582.78 | 41,886,390.65 | 2,719,171.13 | 103,306,802.30 | 100,476,534.48 | 2,830,267.82 |
| ගම්පොල | 126,156,618.64 | 6,546,949.35 | 9,674,583.89 | 123,028,984.10 | 102,059,889.04 | 20,969,095.00 |
| ගාල්ල | 221,117,032.52 | 29,021,564.19 | 1,534,660.30 | 249,884,987.29 | 181,584,406.28 | 56,039,156.33 |
| බදුරලිය | 47,868,679.49 | - | - | 47,868,679.49 | 28,110,194.30 | 19,758,485.19 |
| නුවර එළිය | 67,021,494.05 | 5,839,702.69 | 39,174,431.15 | 33,686,765.59 | 14,009,665.95 | 19,677,099.64 |
| බණ්ඩාරවෙල | 20,751,291.72 | - | 13,297,605.99 | 7,453,685.73 | 7,370,094.18 | 83,591.55 |
| **එකතුව** | **972,593,391.91** | **230,883,782.77** | **70,335,454.79** | **1,124,422,770.77** | **786,878,543.89** | **307,159,096.46** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.1.3. තේ දළුවල තත්ත්ව ආරක්ෂා කිරීම

### අ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා “B leaf 60” වැඩසටහන

නිමි තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය වන්නේ තේ වගුව 2.1.3: ප්‍රාදේශීය වෙළෙඳුන්ගේ තේ දළු ප්‍රමිතීන් දළුය. හොඳ තත්ත්වය් නිමි තේ නිෂ්පාදනය සඳහා අමු තේ දළුවල ගුණාත්මකබව ඉතා වැදගත් වේ.

| ස. තේ. කෝ. ප්‍රදේශය | වඩාත්ම හොඳ | වඩාත්ම හොඳ මට්ටම් වඩා පහල | බාල තත්වයේ |
|---|---|---|---|
| ගම්පොල | 35 | 18 | 47 |
| ගාල්ල | 40 | 12 | 48 |
| බදුරලිය | 30 | 23 | 47 |
| මාතර | 44 | 16 | 40 |
| රත්නපුර | 51.5 | 23.8 | 24.7 |
| නුවර එළිය | 36 | 25 | 39 |
| බණ්ඩාරවෙල | 28 | 38 | 34 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

අමු තේ දළුවල තත්ව පාලනය සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින පළකර තිබේ. ගැසට් නිවේදනය අනුව අවම වශයෙන් 60% ක හොඳ තේ දළු සැකසීමේ ප්‍රතිශතයක් අවශ්‍ය වේ. මෙම නියමය අනුව, B60 වැඩසටහන 2023 වර්ෂය පුරාවට ක්‍රියාත්මක විය. දැනුවත්බව ප්‍රවර්ධනය කිරීම සඳහා, තේ වගා කරන සියලුම කලාප තුළ පුළුල් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් මගින් තේ කර්මාන්තශාලා හිමියන්, දළු එකතු කරන්නන් සහ තේවගාකරුවන් ඉලක්ක කරන ලදී. මීට අමතරව, ගුවන්විදුලි නාලිකා, පුවත්පත් සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා රටපුරා දැනුවත් කිරීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කරන ලදී. තේ දළු නෙලීමේ අවස්ථාවේ පටන් තේ කෝප්පය දක්වා සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය පුරාම තේ වල ගුණාත්මකබව පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කිරීම ඉලක්කය විය. අලෙවිකරුවන් හා සම්බන්ධ වීමේ දී තේ දළුවල තත්වය ඇගයීම වඩාත්ම හොඳ, වඩා හොඳම හා බාල තත්වය ලෙස ප්‍රධාන නිර්ණායක තුනකට වර්ගීකරණය කර ඇත.

### ආ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම

තේ පාලන පනතට අනුව, තේ දළු වෙළඳාමේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය අතර වාර්ෂිකව එය අලුත් කර ගත යුතුය. ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එකතු කිරීමේ මධ්‍යස්ථානවල හා තේ දළු ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන වාහනවල ප්‍රමිතිය සම්පව නියාමනය කරනු ලැබේ.

වගුව 2.1.4: 2023 වසර තුළදී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව

| ස.තේ.කෝ ප්‍රදේශය | 2023.01.01 දිනට බලපත්‍ර ලබා දුන් වෙළෙඳුන් | බලපත්‍ර අලුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර | 2023.12.31 දිනට තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 185 | 180 | 07 | 187 |
| ගම්පොල | 179 | 173 | 04 | 177 |
| මාතර | 258 | 250 | - | 250 |
| ගාල්ල | 239 | 243 | 01 | 244 |
| රත්නපුර | 504 | 487 | 09 | 496 |
| බදුරලිය | 232 | 222 | 05 | 227 |
| නුවර එළිය | 106 | 98 | 07 | 105 |
| **එකතුව** | **1703** | **1653** | **33** | **1686** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඇ) උත්සව සමයේදී බෝග කළමනාකරණය කිරීමේ වැඩසටහන

උත්සව සමයේ දී දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීම හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. 2023 වර්ෂය තුළ ද තේ කොමසාරිස් අංශයේ දැඩි උත්සාහය තුළින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. තේ කර්මාන්ත ශාලා වසා දැමීමේ කාලය අප්‍රේල් 10 සිට අප්‍රේල් 17 දක්වා සීමා කිරීම හෝ හැකි සෑම අවස්ථාවකම කර්මාන්තශාලා ක්‍රියාත්මකව පවත්වා ගැනීම එයට ඇතුළත් විය. මීට අමතරව, නිවාඩු සමය ආරම්භ වීමට පෙර තේ වගාකරුවන්ට වැඩි වැඩියෙන් දළු නෙලීමේ නිරත වන ලෙස උපදෙස් ලබා දෙන ලදී. තවද, උත්සව සමය ආරම්භ වීමට ප්‍රථම ශ්‍රේණිගත කිරීම් අවසන් කර තම නිෂ්පාදන අනුමත ක්‍රම ඔස්සේ පමණක් අලෙවි කරන ලෙස සියලුම තේ කර්මාන්තශාලා වෙත උපදෙස් නිකුත් කරන ලදී. මෙම උපාය මාර්ගික ක්‍රියාමාර්ග තුළින් තේ කර්මාන්තයේ තිරසාර ඵලදායිතාව සහතික කිරීම සහ බෝග හානි අවම කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.

### ඈ) "ආදර්ශ තේ බිම්" ව්‍යාපෘතිය

ලංකාවේ තේ වගාව සඳහා යාන්ත්‍රිකරණය සහිත තිරසර බව ප්‍රවර්ධනය කිරීම. මෙම වැඩසටහනේ අරමුණ වේ. ඉඩම් 26ක් සඳහා රුපියල් මිලියන 7.8 ක මුළු සහනාධාර ප්‍රමාණයක් ලබා දෙමින් මෙම වසරේ දී ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. 2023 වර්ෂය සඳහා එක් නව අයදුම්පතක් ලැබුන අතර එය සලකා බලන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් තේ ඉඩම් සහ ක්ෂේත්‍රය තුළ ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම, වර්ෂය පුරාවට ස්ථාවර සහ අඛණ්ඩ අස්වැන්නක් සහතික කිරීම, තේ වතුවල ආර්ථික ආයු කාලය දීර්ඝ කිරීම, සහ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ දළු නෙලීමේ වියදම් 60% කින් අඩු කිරීම අපේක්ෂා කරන ලදී.

මීට අමතරව, මෙම ව්‍යාපෘතියේ අරමුණ වුයේ තේ වතු සඳහා දළු ප්‍රමිතින් මධ්‍යස්ථ මට්ටමක පවත්වා ගැනීම සහ ප්‍රමිතින් හඳුන්වා දීම, වැසි වනාන්තර සන්ධාන සහතිකය (Rain Forest Alliance) වැනි සහතික අත්කර ගැනීමට පහසුකම් සැලසීමයි. මෙම ප්‍රයත්නයන් තුළින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දිගුකාලීන ශක්‍යතාව සහ තරගකාරිත්වය සහතික කරන අතරම එහි තිරසාර බව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට ව්‍යාපෘතිය මගින් උත්සාහ ගන්නා ලදී.

වගුව 2.1.5: ආදර්ශ තේ බිම් සඳහා සහනාධාර ගෙවීම්

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| ගම්පොල | 4 | 1,005,000 | 13 |
| බණ්ඩාරවෙල | 1 | 150,000 | 03 |
| රත්නපුර | 3 | 700,000 | 17 |
| බදුරලිය | 3 | 750,000 | 12 |
| මාතර | 4 | 1,150,000 | 43 |
| ගාල්ල | 9 | 3,892,000 | 20 |
| නුවර එළිය | 2 | 250,000 | 11 |
| **එකතුව** | **26** | **7,897,000** | **119** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය

තේ නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම හා වගා බිම්වල පාළු සිටුවීම සඳහා සහනාධාර සැපයීම මගින් තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2023 වර්ෂය තුළදී රුපියල් මිලියන 53.8 ක් වෙන් කර තිබේ. ඒ අනුව, වාණිජ්‍ය හා පුද්ගලික ක්ෂේත්‍රයේ අක්කර 10ට වැඩි වතු සඳහා සහනාධාර ලබා දීම සඳහා මෙම මුදල් භාවිත කරමින් පවතී. තේ නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීම, තේ ඉඩම්වල ඵලදායිතාව වැඩි කිරීම, තේ නැවත වගා කිරීමේ 3% ජාතික ඉලක්කය සපුරාලීම සහ එමගින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ සමස්ත වර්ධනයට සහ තිරසාරභාවයට දායක වීම යන අරමුණු සහිතව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

වගුව 2.1.6: නැවත වගා කිරීමේ සහනාධාර ගෙවීම්

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) | ප්‍රමාණය (හෙක්) | කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගම්පොල | 80 | 7,918,800 | 50.55 | 92 |
| බණ්ඩාරවෙල | 10 | 1,572,700 | 7.11 | 09 |
| රත්නපුර | 33 | 15,169,650 | 72.34 | 128 |
| බදුරලිය | 7 | 3,648,400 | 14.99 | 45 |
| මාතර | 14 | 5,638,800 | 19.25 | 132 |
| ගාල්ල | 23 | 5,570,950 | 26.22 | 110 |
| නුවර එළිය | 20 | 12,901,550 | 76.43 | 94 |
| **එකතුව** | **187** | **52,420,850** | **266.89** | **610** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඊ) විසිරි ජල බිඳු වාරි පද්ධති සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

තේ වගාව සඳහා නව තාක්ෂණයන් හඳුන්වාදීම හා දේශගණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ අරමුණු සහිතව මෙම ව්‍යාපෘතිය 2021 වසරේ ආරම්භ කරන ලදී. තේ වගාව සඳහා ජලාපවාහන හා විසිරි ජල බිඳු තාක්ෂණය යොදා ගැනීම දිරිමත් කරමින් මධ්‍ය පරිමාණ තේ ඉඩම් හිමියන් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. ලබාදුන් සහනාධාර මුදල අක්කරයකට රුපියල් 120,000 කි. 2023 වර්ෂය තුළ ප්‍රතිලාභීන් 06 දෙනෙකු සඳහා රුපියල් මිලියන 5.19ක් ගෙවා ඇත.

### උ) යාන්ත්‍රිකව අස්වනු නෙලීම හා නැවත වගා කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

ආදර්ශ තේ ඉඩම් සංකල්පය ක්ෂේත්‍රය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සහනාධාර ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඉඩම් සකස් කිරීම, කොම්පෝස්ට් කිරීම, සුදුසු වාරිමාර්ග පද්ධතියක් (බිංදු හෝ විසිරි ජල බිඳු) සැකසීම සහ යාන්ත්‍රික අස්වනු නෙලීමේ පිළිවෙත් සමඟ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා ද්විත්ව පේලි ක්‍රමයකට තේ සිටුවීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිත කිරීම මෙම මඟින් සිදු කරයි.

වගුව 2.1.7: යාන්ත්‍රිකව අස්වනු නෙලීම හා නැවත වගා කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

| ප්‍රදේශය | ගෙවීම් කරන ලද ඉඩම් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලියන ) |
|---|---|---|
| ගම්පොල | 3 | 2,638,350 |
| බණ්ඩාරවෙල | - | - |
| රත්නපුර | 2 | 3,697,500 |
| බදුරලිය | 3 | 1,123,125 |
| මාතර | 3 | 2,137,500 |
| ගාල්ල | 6 | 3,067,500 |
| නුවර එළිය | 2 | 448,125 |
| **එකතුව** | **19** | **13,112,100** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඌ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

දිවයිනේ සියලුම තේ ඉඩම් නියාමන අවශ්‍යතාවයක් වශයෙන් තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි කිරීම අවශ්‍ය විය. තේ ඉඩම් 485,000කට ආසන්න ප්‍රමාණයක් මේ වන විට ලියාපදිංචි කර තිබේ. තේ ඉඩම් සම්බන්ධ සියලු තොරතුරු පරිගණක ගත කරන ලද අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංශෝධන දැන්වීම් වසරක් හැර වසරක් නිකුත් කරනු ලැබේ.

වගුව 2.1.8: ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි තේ ඉඩම්

| ඉඩම් වර්ගය | ඉඩමේ ප්‍රමාණය (අක්කර) | ඉඩම් ගණන |
|---|---|---|
| 0 < 5(අක්කර) | 366,577.49 | 415,596 |
| 5< 10(අක්කර) | 24,283.76 | 3,392 |
| 10< 50 (අක්කර) | 59,283.44 | 2,803 |
| 50< (අක්කර) | 42,282.06 | 253 |
| **එකතුව** | **492,426.75** | **422,044** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### එ) තේ තවාන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

එක් තවානක් සඳහා වෙන් කරන ලද සහනාධාර මුදල රු. මිලියන 1.5 ක් වන අතර අදාළ අදියර අවසන් වූ පසු ලබා දෙන ලදී. තේ තවානක් ස්ථාපනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි විස්තර කරමින් ප්‍රතිලාභීන්ට විස්තරාත්මක මාර්ගෝපදේශ සපයන ලදී. ඇතැම් තවාන් වල විවිධ අවධීන් සඳහා ගෙවීම් වත්මන් වර්ෂය තුළද සිදු කරන ලදී.

වගුව 2.1.9: තේ තවාන් සහනාධාර ගෙවීම් 2023

| ප්‍රදේශය | ගෙවීම් කරන ලද තවාන් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ගම්පොල | 2 | 1,450,000 |
| රත්නපුර | 2 | 1,250,000 |
| බදුරලිය | 1 | 750,000 |
| මාතර | 3 | 1,200,000 |
| ගාල්ල | 1 | 750,000 |
| **එකතුව** | **09** | **14,650,000** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඒ) කාබනික පොහොර සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

රජයේ ප්‍රතිපත්ති තීරණයට අනුව, තේ වගා කරනු ලබන ප්‍රදේශවල කාබනික පොහොර නිපදවන්නන් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැඩසටහනක් ආරම්භ කරන ලදී. පසේ සාරවත්බව හා පසෙහි කාබනික පදාර්ථ අන්තර්ගතය වැඩි දියුණු කිරීම සඳහා වූ උපකාරක වැඩසටහනක් වශයෙන් එය ක්‍රියාත්මක වේ. කාබනික පදාර්ථ පසට එකතු කිරීමෙන් පමණක් රසායනික පොහොර නැවත අවශෝෂණය වීම වර්ධනය වීමෙන් තේ ඉඩම්වල ඵලදායිතාවය වර්ධනය කරන ලදී.

වගුව 2.1.10: කාබනික පොහොර සහනාධාර යෝජනාක්‍රමය 2023

| ප්‍රදේශය | ගෙවීම් කරන ලද එකක සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලියන) |
|---|---|---|
| ගම්පොල | 2 | 200,000 |
| බණ්ඩාරවෙල | 1 | 100,000 |
| රත්නපුර | 1 | 100,000 |
| බදුරලිය | 4 | 800,000 |
| මාතර | 2 | 500,000 |
| ගාල්ල | - | - |
| නුවර එළිය | 1 | 200,000 |
| **එකතුව** | **11** | **1,900,000** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඓ) තේ ඉඩම්වල උස් සෙවණ සහිත ගස් සිටුවීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

ඉදිරි වසර දෙක තුළ තේ පැල උදුරා දැමීම හෝ නැවත වගා කිරීම සිදු නොකරන ආදායම් උපදවන තේ ඉඩම් සඳහා මෙම සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. අනුමත සහනාධාර මුදල් ඉහළ සෙවණ ගසක් සඳහා රු. 100.00 ක් වූ අතර අක්කරයකට උපරිම වශයෙන් ගස් 28 කි. මෙම යෝජනා ක්‍රමය යටතේ මාතර, ගාල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල පිහිටි වතු 6 ක් සඳහා රුපියල් 286,500ක් ලබා දී ඇත.

## 2.1.4. තේ කර්මාන්තශාලාවල තත්වය ඉහල නැංවීමේ ක්‍රියාකාරකම්

ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ක්‍රමවේද ආදිය සුදුසු තත්වයේ පැවතීම නිම් තේ වල උසස් තත්ත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විසින් නිකුත් කරන ලද සම්මත මාර්ගෝපදේශ සහ නියෝග පිළිපැදීම කර්මාන්ත ශාලාවේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. උසස් තත්ත්වයේ නිම් තේ නිෂ්පාදනය සඳහා ඉහත සඳහන් කළ තත්වයන් හිතකර නොවන්නේ නම් එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගු කිරීමට තේ කොමසාරිස් වරයාට බලය ඇත. ප්‍රාදේශීය සහකාර තේ කොමසාරිස්වරුන් විසින් ඉහත අවශ්‍යතා නියාමනය කිරීම සඳහා පරීක්ෂණ පවත්වනු ලබන අතර ඔවුන්ගේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මත පදනම්ව නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. තවද, ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් විසින් උක්ත අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා උපදේශන සේවා සපයනු ලබයි. ඒ අනුව, තේ කර්මාන්තශාලාවල හා එහි නිෂ්පාදනවල තත්වය ඉහල නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

අ) තේ කර්මාන්තශාලා සහ ගුදම්වල මනා නිෂ්පාදන පිළිවෙත් ස්ථාපිත කිරීම

ආ) හදිසි අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

ඇ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය

ඈ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම හා කසල තේ මධ්‍යස්ථානවල මනා නිෂ්පාදන පිළිවෙත් වර්ධනය කිරීම

ඉ) කසළ තේ පිරිසකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය ලබා දීම

### අ) තේ කර්මාන්තශාලා සහ ගුදම්වල යහපත් නිෂ්පාදන පිළිවෙත් ස්ථාපිත කිරීම

තේ කම්හල්වල ප්‍රමිතීන් ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා සහනාධාර යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත.

### i. යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) වැඩසටහන

තේ නිෂ්පාදන ක්‍රියාවලීන්හි ගුණාත්මක ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා අත්‍යාවශ්‍ය මගපෙන්වීම් ලබාදීම සඳහා සකස් කරන ලද මනා නිෂ්පාදන පිළිවෙත් (GMP) යනු එක් මූලපිරිමකි. මෙම වැඩසටහන යටතේ තේ නිෂ්පාදන ක්‍රියාවලීන්හි ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හේතු වූ සමස්ත නක්සේරු 536ක් සිදු කරන ලදී.

වගුව 2.1.11 : ප්‍රාදේශීය වශයෙන් තේ කර්මාන්තශාලාවල මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරු කිරීම

| ප්‍රදේශය | මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව | කර්මාන්තශාලා ශ්‍රේණිගත කිරීම | | |
|---|---|---|---|---|
| | | විශිෂ්ට | හොඳ | සාමාන්‍යය |
| බණ්ඩාරවෙල | 61 | 29 | 32 | - |
| ගම්පොල | 84 | 44 | 37 | 03 |
| රත්නපුර | 89 | 38 | 42 | 08 |
| මාතර | 27 | 16 | 09 | 02 |
| ගාල්ල | 95 | 65 | 30 | - |
| බදුරලිය | 50 | 15 | 29 | 08 |
| නුවර එළිය | 88 | 59 | 26 | 03 |
| **එකතුව** | **494** | **266** | **205** | **24** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ii. කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය

තේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, තේ කර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වාදීම සහ තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීම අරමුණු කරගත් තේ කර්මාන්තශාලා සඳහා මෙම වැඩසටහන මඟින් මූල්‍ය ආධාර ලබා දේ.

වගුව 2.1.12: කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් කළ කර්මාන්තශාලා ගණන | ගෙවූ මුදල (රු) | සිදු කළ විමර්ශන ගණන |
|---|---|---|---|---|
| ගම්පොල | 05 | 07 | 5,484,617.49 | 17 |
| බණ්ඩාරවෙල | 01 | 02 | 894,999.67 | 03 |
| රත්නපුර | 10 | - | - | 22 |
| බදුරලිය | 03 | 06 | 5,289,314.33 | 05 |
| මාතර | 05 | 05 | 2,687,766.33 | 18 |
| ගාල්ල | 07 | 03 | 2,264,834.33 | 20 |
| නුවර එළිය | 12 | 02 | 363,400.00 | 13 |
| **එකතුව** | **43** | **25** | **16,984,932.15** | **98** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### iii. ලියාපදිංචි තේ කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා සහතිකය (ISO 22000/HACCP) සඳහා සහනාධාර සහාය

ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් තේ පාරිභෝගිකයන් අතර පවතින දැඩි සැලකිලිමත්බව හේතුවෙන්, ජාත්‍යන්තරව පිළිගත් ආයතන විසින් නිකුත් කරනු ලබන ISO 22000/HACCP වැනි ආහාර සුරක්ෂිතතා සහතික ලබා දීම අත්‍යවශ්‍ය වී ඇත. එවැනි සහතික ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමක් වශයෙන් පමණක් නොව ඵලදායී අලෙවිකරණ මෙවලම් ලෙසද ක්‍රියා කරයි. එබැවින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය කර්මාන්තශාලා ඒ සඳහා පහසුකම් සලසා දී ඇත. සියලුම ක්‍රියාත්මක තේ කර්මාන්තශාලා විසින් ආහාර සුරක්ෂිතතා

සහතිකය ලබා තිබීම අනිවාර්ය සාධකයක් ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සලකනු ලබයි. ලියාපදිංචිය අලුත් කිරීමේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය කරන අතර අනුකූලතාව සහතික කිරීම සහ අත්පත් කර ගැනීම පහසු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ලැබේ. සහතිකකරණය ක්‍රියාත්මක කිරීම සහ ලබා ගැනීම දිරිමත් කිරීමේ සාධකයක් වශයෙන් තේ කම්හලක් සඳහා සහතික කිරීමේ ගාස්තුව (රු. 75,000.00) සඳහා සහනාධාර ක්‍රමයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලදී. වසර පුරාවට මෙම වැඩසටහන යටතේ තේ කර්මාන්ත ශාලා 13ක් සඳහා රුපියල් 926,900ක මුළු මුදලක් ලබා දෙන ලදී.

වගුව 2.1.13: තත්ත්ව සහතික ලබා ගත් කර්මාන්තශාලා ගණන

| ප්‍රදේශය | HACCP | ISO 22000 | වෙනත් සහතික ** |
|---|---|---|---|
| බණ්ඩාරවෙල | 61 | 61 | 21 |
| ගම්පොල | 04 | 05 | - |
| රත්නපුර | 44 | 46 | 10 |
| මාතර | 26 | 49 | 18 |
| ගාල්ල | 50 | 04 | 12 |
| බදුරලිය | 07 | 24 | 08 |
| නුවර එළිය | 02 | 91 | 16 |
| **එකතුව** | **194** | **280** | **85** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
**සටහන - RA/CQC/GMP

### iv. තේ කර්මාන්තශාලා සහ ගබඩාවල වහලය මත සූර්ය බලශක්තිය සවිකිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

තේ අංශයේ විදුලි සැපයුමේ ගැටලුවට ප්‍රතිචාර වශයෙන් සහ එම ක්ෂේත්‍රය තුළ පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලියාපදිංචි නිෂ්පාදකයින්, අපනයනකරුවන් සහ තැරැව්කරුවන් සඳහා සහනාධාර ක්‍රමයක් 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද්දේය. වත්මන් වර්ෂයේදී, සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා අබණ්ඩව සහනාධාර ගෙවන ලද අතර, ලියාපදිංචි තේ නිෂ්පාදකයින් 31ක් සහ අපනයනකරුවන්ගේ ගබඩා 3ක් අතර රුපියල් මිලියන 14.076ක මුදලක් බෙදා දෙන ලදී.

### v. ලියාපදිංචි තේ නිෂ්පාදකයින් සඳහා තෙතමන මීටර් මිලදී ගැනීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

තේවල තෙතමන මට්ටම් පවත්වා ගැනීම සහ කර්මාන්තශාලා මට්ටම්න් ඒවා නිවැරදිව සටහන් කිරීම ඉතා වැදගත්කමකින් යුක්තය. තේවල තෙතමනය වැඩි වීම ක්ෂුද්‍රජීවී වර්ධනයට හේතු විය හැක. එහි ප්‍රතිඵලයක් වශයෙන් අලෙවියේ දී ගුණාත්මක බව පිළිබඳ ගැටළු ඇති වේ. එබැවින්, කර්මාන්තශාලාවලින් තේ පිටට යැවීමේ දී තෙතමන මට්ටම 6.5% හෝ ඊට අඩු මට්ටමක පවත්වා ගැනීම අනිවාර්ය කර ඇත. මෙම අවශ්‍යතාවයට අනුකූල වීම දිරිමත් කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා තෙතමන මීටර මිලදී ගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර ලබා දෙන ලදී.

වගුව 2.1.14: තෙතමන මීටර් බෙදාහැරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

| ප්‍රදේශය | ගෙවීම් කරන ලද ඒකක සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලියන) |
|---|---|---|
| ගම්පොල | 07 | 700,000 |
| බණ්ඩාරවෙල | 03 | 300,000 |
| රත්නපුර | 23 | 2,300,000 |
| බදුරලිය | - | - |
| මාතර | 10 | 976,875 |
| ගාල්ල | 12 | 1,200,000 |
| නුවර එළිය | 06 | 600,000 |
| **එකතුව** | **61** | **6,076,875** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ආ) හදිසි අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

තේ කර්මාන්තයේ අවභාවිතාවන් පාලනය කිරීම කාර්ය කණ්ඩායම් මෙහෙයුම් මගින් සිදු කරනු ලබන අතර ජාවාරම් විරෝධී සම්බන්ධීකාරක (ATC) විසින් කාර්ය කණ්ඩායම් මෙහෙයුම් සඳහා නායකත්ව දෙනු ලැබේ. කණ්ඩායමක් 2023 වසරේ දී තේ කොමසාරිස් අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් විවිධ තේ කර්මාන්තශාලාවල හදිසි අධීක්ෂණ 126ක් සිදු කරන ලදී.

වගුව 2.1.15: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| ප්‍රදේශය | සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| බණ්ඩාරවෙල | 03 |
| ගම්පොල | 16 |
| රත්නපුර | 18 |
| මාතර | 42 |
| ගාල්ල | 60 |
| බදුරලිය | 15 |
| නුවර එළිය | 26 |
| **එකතුව** | **180** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඇ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල මනා නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

කසල තේ පිරිසැකසීම යනු කසල තේ වලින් භාවිත කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ අලෙවි කරන වෙළෙඳුන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය. කසළ තේ මධ්‍යස්ථානවල ප්‍රමිතීන් ඉහල නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් සැපයීමේ අරමුණෙන් මනා නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. කසල තේ ප්‍රවාහනය සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතු අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එම ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

වගුව 2.1.16 : කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන සහ 2023 වර්ෂය සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන 2023

| ප්‍රදේශය | 2021.01.01 දිනට ලියාපදිංචි සැකසුම්කරුවන් | වර්ෂය තුළ අලුත් කිරීම් | වර්ෂය තුළ අලුතින් නිකුත් කිරීම් | 2022.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 2022.12.31 දිනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර මගින් වෙළෙඳුන් විසින් මිලදී ගන්නා ලද තේ ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 01 | 01 | 02 | 03 | 747 | 3,345,724 |
| ගම්පොල | 120 | 105 | 01 | 106 | 445 | 2,561,218 |
| මාතර | 4 | 04 | - | 04 | 230 | 720,908 |
| ගාල්ල | 3 | 02 | - | 02 | 392 | 811,855 |
| රත්නපුර | 4 | 05 | 03 | 08 | 753 | 2,909,525 |
| බදුරලිය | 9 | 08 | 01 | 09 | 1,178 | 5,062,402 |
| නුවර එළිය | 2 | 02 | 01 | 03 | 1,959 | 12,210,676 |
| **එකතුව** | **143** | **127** | **08** | **135** | **5,704** | **27,622,308** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඇ) කසල තේ සකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය

කසල තේ සැකසුම්කරුවන් හට වෙන්දේසි අයිතිවාසිකම් ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදයක් සැලසුම් කර ඇත. වෙන්දේසි අයිතිවාසිකම් අයදුම් කිරීම සඳහා, කසල තේ සැකසුම් මධ්‍යස්ථානය තුළ මනා නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ ප්‍රමිතියෙන් 80% ක් තිබිය යුතුය. 2023 වසරේ දී වෙන්දේසි අයිතිය ලබා දුන් නව කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන 8ක් පවතී.

## 2.1.5.නැවුම් තේ මංගල්‍යය 2023

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය තුළ වැදගත් සංස්කෘතික අංගයක් වන වාර්ෂික නැවුම් තේ මංගල්‍යය තේ වගා කරනු ලබන සියලුම දිස්ත්‍රික්කවල විවිධ ආගමික ස්ථානවල ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම වසරේ දී පවත්වන ලදී. විවිධ ආගමික ස්ථාන නියෝජනය වන පරිදි තේ කර්මාන්තයේ සමෘධිමත් කිරීම උදෙසා ආශීර්වාද එක් කිරීම මෙම උත්සවයේ අරමුණ විය.

උත්සවයේ වැදගත් අංගයක් වුයේ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයට ඉක්බිතිව නෙලා ගත් පළමු තේ අස්වැන්නෙන් නිෂ්පාදනය කරන ලද තේ පන්සල්, ක්‍රිස්තියානි පල්ලි, මුස්ලිම් පල්ලි හා කෝවිල් වැනි ආගමික ස්ථානවලට වෙසක් පෝයට සමගාමීව පූජා කිරීමයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය, තේ කර්මාන්තශාලා හිමියන්, හරිත තේ දළු වෙළෙන්දන් හා කුඩා තේ වතු හිමියන් ඇතුළුව තේ කර්මාන්තයට අනුබද්ධ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් ප්‍රධාන උත්සවය කොටපොල ඓතිහාසික ගැටබරු රජමහ විහාරයේ දී පැවැත්විණි සියලු ආගම් එකම දිනයක නියෝජනය කරමින් ප්‍රාදේශීය උත්සව විවිධ ආගමික ස්ථානවලදී පවත්වනු ලැබිණි.





## 2.2. තේ අපනයන අංශය

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනතේ බලතල හා කාර්යන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පවතින රෙගුලාසි පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය විසිනි.

තේ අපනයනකරුවන්, තේ ඇසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් ලියාපදිංචි කිරීම මෙන්ම තේ ඇසුරුම් වර්ගීකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම් යටතට ගැනේ. එයට අමතරව, තේ ලබා ගැනීම, තේ සඳහා අවම ප්‍රමිති පැනවීම, තේ අපනයනය සඳහා අනුමැතිය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා තේ වල කීර්තිනාමය තහවුරු කරමින් තේ අපනයනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ සාමූහික ප්‍රයත්නයක් වශයෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව සමග එක්ව ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ දී තේ තොග සම්බන්ධයෙන් ඒකාබද්ධව විමර්ශන පවත්වනු ලැබේ.

තවද, සියලුම අපනයනකරුවන්ගේ ගබඩාවල තේ සැකසීමේ ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා, HACCP තත්ත්ව සහතිකය ලබා ගැනීම ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අමතරව, සියලු අපනයන ගබඩාවන් හි දී යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පිළිබඳ ඇගයීම් සිදු කරනු ලැබේ.

අපනයන ඇසුරුම් කර්මාන්තශාලා දිරිමත් කිරීම සඳහා 2021 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද සහන පොලී ක්‍රමය 2023 වසරේ දී ද අබණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

### 2.2.1. ලියාපදිංචි කිරීම්

වගුව 2.2.1: අපනයනකරුවන්, අසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් සහ නිෂ්පාදන තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන

| ලියාපදිංචි කිරීම් | 2023.01.01 දිනට | නව ලියාපදිංචි කිරීම් | 2023.12.31 දිනට මුළු එකතුව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 401 | 58 | 421 |
| ඇසුරුම්කරුවන් | 703 | 157 | 670 |
| ගබඩාවන් | 283 | 28 | 292 |
| ආනයනකරුවන් | 103 | 03 | 111 |
| නිෂ්පාදන තැරැව්කරුවන් | 8 | - | 8 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනයට අවසර ලබා ගැනීම සඳහා ස්වයංක්‍රිය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා තේ අපනයන අංශයට වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECs) බාර දිය යුතුය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපනයනය කිරීමට සුදානම් තේ තොගය අපනයනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින්නේ ද යන්න සොයා බලනු ලැබේ.

ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රිත වෙනත් සම්භවයක් සහිත විශේෂිත තේ අඩංගු සිල්ලර බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන හා අපනයන) 1981 යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බහාලුම් /ඇසුරුම් මත "ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද ශ්‍රී ලාංකීය හා වෙනත් සම්භවයක් සහිත තේ" හෝ" ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද වෙනත් සම්භවයක් සහිත තේ" යන්න පමණක් සඳහන් කළ යුතු අතර සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුය.

අදාළ තේ අපනයනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව පවතින්නේ ද යන්න තහවුරු කිරීම සඳහා සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් ස්වයංක්‍රිය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECs) තේ අපනයන අංශයට බාර දිය යුතුය.

## 2.2.2. තේ ආනයනයන

තේ කිලෝ ග්‍රෑම් 6,938,451.50ක් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආනයන බලපත්‍ර 521ක් නිකුත් කර ඇත. කෙසේවෙතත්, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සැබෑ ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 6,558,843.64කි.

වගුව 2.2.2: තව්‍ය ආනයන - 2023

| රට | වර්ගය | ආනයන ප්‍රමාණය (කි.ග්‍රෑ) | පිරිවැය, රක්ෂණ හා ප්‍රවාහන අගය (රු.) | අගය (රු.) |
|---|---|---|---|---|
| චීනය | හරිත තේ | 1,006,899.50 | 765.71 | 770,995,318.02 |
| | හරිත තේ - විශේෂ | 982,517.00 | 1,020.74 | 1,002,894,184.67 |
| | කළු තේ - විශේෂ | 26,996.00 | 2,514.11 | 67,870,806.80 |
| | අනු එකතුව | **2,016,412.50** | **913.38** | **1,841,760,309.49** |
| ඉන්දියාව | කළු තේ - CTC | 2,227,123.25 | 765.99 | 1,705,943,534.79 |
| | කළු තේ - විශේෂ | 979,977.73 | 1,363.00 | 1,335,710,011.59 |
| | හරිත තේ | 10,490.00 | 3,439.60 | 36,081,439.50 |
| | හරිත තේ - විශේෂ | 2,000.00 | 1,394.00 | 2,788,000.00 |
| | අනු එකතුව | **3,219,590.98** | **956.81** | **3,080,522,985.88** |
| කෙන්යාව | කළු තේ - CTC | 1,282,404.16 | 693.96 | 889,939,173.06 |
| | අනු එකතුව | **1,282,404.16** | **693.96** | **889,939,173.06** |
| අප්‍රිකාව | කළු තේ - CTC | 2,396.00 | 1,442.60 | 3,456,469.60 |
| | අනු එකතුව | **2,396.00** | **1,442.60** | **3,456,469.60** |
| ජපානය | හරිත තේ | 410.00 | 4,407.31 | 1,806,995.20 |
| | හරිත තේ - විශේෂ | 11,850.00 | 5,156.65 | 61,106,247.70 |
| | අනු එකතුව | **12,260.00** | **5,131.59** | **62,913,242.90** |
| නේපාලය | කළු තේ - CTC | 120.00 | 14,700.00 | 1,764,000.00 |
| | අනු එකතුව | **120.00** | **14,700.00** | **1,764,000.00** |
| එක්සත් රාජධානිය | කළු තේ - විශේෂ | 310.00 | 1,119.84 | 347,150.00 |
| | හරිත තේ | 125.00 | 1,204.74 | 150,592.25 |
| | අනු එකතුව | **435.00** | **1,144.24** | **497,742.25** |
| වියට්නාමය | හරිත තේ | 23,170.00 | 440.59 | 10,208,400.00 |
| | අනු එකතුව | **23,170.00** | **440.59** | **10,208,400.00** |
| නායිවානය | හරිත තේ - විශේෂ | 30.00 | 19,082.00 | 572,460.00 |
| | අනු එකතුව | **30.00** | **19,082.00** | **572,460.00** |
| මියන්මාරය | කළු තේ - විශේෂ | 445.00 | 1,191.40 | 530,173.00 |
| | හරිත තේ | 1,300.00 | 1,280.00 | 1,664,000.00 |
| | හරිත තේ - විශේෂ | 280.00 | 1,280.00 | 358,400.00 |
| | අනු එකතුව | **2025.00** | **1,260.53** | **2,552,573.00** |
| **මුළු එකතුව** | | **6,276,439.48** | **898.66** | **5,894,187,356.18** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.2.3. සාදන ලද තේ සඳහා ISO 3720 අවම තත්ව ප්‍රමිතිය පවත්වා ගැනීම

දෙන ලද සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලාවලින් ලබා ගන්නා ලද සියලුම තේ නියැදි, ආනයනයෙන් පසු ලබා ගන්නා ලද තොග හා අපනයනය සඳහා සුදානම් කරන ලද තොග ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ කමිටුව විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. එනම්, අදාළ තේ වර්ගය අවසර ලත් වර්ගයට අයත් වේ ද, ISO 3720 ප්‍රමිතියට අනුකූල වේ ද, කිසිදු අපවිත්‍රතාවයකින් තොර වේ ද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා එකී පරීක්ෂාව සිදු කරන අතර එහිදී අපනයනයට සුදුසු තේ සඳහා පමණක් අවසර දෙනු ලබයි.

වගුව 2.2.3: එක් එක් නියැදිවල ගුණාත්මකබව සම්බන්ධ දෝෂ

| නියැදි වර්ගය | නියැදි ගණන | ISO ප්‍රමිතියට පහලින් පවතින සහ අපවිත්‍රතා සහිත බවට හඳුනාගත් ප්‍රමාණය |
|---|---|---|
| වෙන්දේසියට පෙර අපනයන අංශය මගින් ලබාගත් නියැදි | 3783 | 260 |
| වෙන්දේසියට පෙර ඉවත් කරන ලද නියැදි (කමිටුව විසින්) | 2839 | |
| නැවිගත කිරීමට පෙර | 10482 | 7 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### අ) පරිභෝජනයට නුසුදුසු තේ විනාශ කිරීම

පූර්ව වෙන්දේසි, පූර්ව බෙදා හැරීම් සහ විශේෂ පරීක්ෂණ මට්ටම්වලදී මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හඳුනා ගන්නා ලද තේවල විනාශ කිරීම අපනයන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. මෙම අංශය මගින් 2023 වසරේ දී තේ කිලෝ ග්‍රෑම් 141,360.44ක් මෙසේ විනාශ කිරීම සඳහා භාජනය කරන ලදී.

### ආ) තේ නැවත ලබා ගැනීම

විදේශීය ගැනුම්කරු විසින් යම් තේ තොගයක් ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්, දේශීය අපනයනකරුට එය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නැවත ලබා ගැනීමට සිදු වේ. අපනයනය / නැවත භාවිත කිරීම සඳහා අවසර ලබා දීමට පෙර මෙම තොගය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

### ඇ) නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන කාර්ය සාධනය

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා විශේෂිත තිරු බදු සහන අනුපාතයක් (TRQ) ශ්‍රී ලංකාව තුළ පවතී. කෙසේ වෙතත්, තිරු බදු සහනයේ සැලකිය යුතු උපයෝජනයක් 2023 වර්ෂය තුළ දී වාර්තා වී නොමැත.

වගුව: 2.2.4: නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ සඳහා විශේෂිත තිරු බදු සහනය

| නිදහස් වෙළඳ ගිවිසුම | වසරකට වෙන් කරන ප්‍රමාණය (කි.ග්‍රෑ) | මුළු අපනයන (කි.ග්‍රෑ) |
|---|---|---|
| ඉන්දු- ශ්‍රී ලංකා | 15,000,000 | 45,620.35 |
| පාකිස්තාන-ශ්‍රී ලංකා | 10,000,000 | 0 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ඇ) තේ තොග ඉවත් කිරීම

සංයුක්ත ගාස්තු ප්‍රතිලාභය මත පදනම්ව ඉහළ අමු තන්තු මට්ටමක් (16.5% ට වඩා වැඩි) සහිත තේ තොග වැඩි දියුණු කිරීම සඳහා තේ වත්ත සඳහා නිදහස් කරනු ලැබේ. වැඩි දියුණු කිරීමෙන් පසු නිෂ්පාදකයාට එම ඉන්වොයිස් අංකයෙන්ම නැවත නාමාවලියක් සකස් කළ හැකිය.

## 2.2.5.තේ අපනයන ඇසුරුම් කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම හෝ නවීකරණය කිරීම සඳහා සහන පොලී යෝජනා ක්‍රමය

අපනයනකරුවන්ට පහසුකම් සලසමින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහන පොලී ක්‍රමයක් දියත් කර ඇත. එහිදී වසර 5ක කාලයක් සඳහා රුපියල් මිලියන පහක් දක්වා වාර්ෂිකව ගෙවිය යුතු පොලියෙන් උපරිම 50%ක පොලී සහනාධාරයක් සහ 10% ක හමාර කිරීමේ උපරිම පොලී සහනාධාරයක් අපනයනකරුට හිමිවේ. ගෝලීය තේ වෙළෙඳපොළ තුළ පාරිභෝගික අවශ්‍යතා සහ උවමනාවන් සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය, තත්ත්වය ඉහල නැංවීම, ඉහළ අගය එකතු කිරීම උසස් මට්ටමකට ගෙන ඒම සහනාධාර යෝජනා ක්‍රමයේ අරමුණ වේ.

වසර අවසානයේ දී සහනාධාර ලැබූ අපනයනකරුවන්ගේ සංඛ්‍යාව 10ක් බවට පත් කරමින් 2023 වර්ෂය තුළදී තවත් අපනයනකරුවන් දෙදෙනෙකු යෝජනාක්‍රමය තුළ ලියාපදිංචි විය.

# 2.3.තේ ප්‍රවර්ධන අංශය

දේශීය හා විදේශීය වෙළඳපොළවල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ වගකීම වන අතර එය පහත දැක්වෙන පුළුල් කාණ්ඩ යටතේ වර්ගීකරණය කළ හැක

I. සමාජ මාධ්‍යය, මහජන සම්බන්ධතා සහ අළෙවිකරණය ඔස්සේ ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය
II. තේ වර්ගීය ප්‍රවර්ධනය
III. ශ්‍රී ලංකාව සතු සිංහ ලාංඡනය සඳහා සන්නාම ප්‍රවර්ධනය
IV. ජාත්‍යන්තර ආහාර හා පාන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම
V. තේ පරිභෝජනය කරන සියලුම ප්‍රධාන පෙළේ රටවල උපායමාර්ගික වෙළඳපල පිළිබඳ විස්තර සම්පාදනය කිරීම හා බෙදා හැරීම
VI. තේ කේෂත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාශයට සහයෝගය දැක්වීම
VII. තරඟකරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණය
VIII. සිංහ ලාංඡන වෙළඳ ලකුණු ලියාපදිංචිය, අධීක්ෂණය සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
IX. භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් තේ සම්බන්ධ ප්‍රාදේශීය නාමයන් / ලාංඡන ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය
X. ඕසෝන් හිතකාමී හා පිරිසිදු ශ්‍රී ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
XI. සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක ලබා ගැනීම සඳහා AFD, CIRAD සහ SLTB සමග ත්‍රෛපාර්ශවිය ව්‍යාපෘතිය
XII. අගය එකතු කළ තේ අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා 5% දිරි දීමනා යෝජනා ක්‍රමය
XIII. ඉරානය සහ ශ්‍රී ලංකාව අතර තේ සඳහා බොර තෙල් හුවමාරු යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම
XIV. දේශීය තේ ප්‍රවර්ධනය

## 2.3.1. ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය

ඒක ජාතිය ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය යනු වෙනත් සම්භවයන් ඇති තේ සමග තරඟකාරීව ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රචාරණය හා ප්‍රසිද්ධිය ලබා දීමයි. විදේශයන්හි පිහිටුවා තිබෙන තේ ප්‍රචාරණ ඒකක සහ නානාපති සේවාවන්හි ක්‍රියාත්මක වාණිජ්‍ය අංශ මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විදේශීය වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකා තේ සඳහා ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් (TTL & Social/Digital). එළිමහන් ප්‍රචාරණයන්, තේ පැන් සංග්‍රහ, තේ සම්බන්ධ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙන්ම වෙනත් පොදු මහජන ක්‍රියාකාරකම් ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් ප්‍රධාන වේ.

## 2.3.2. ජාත්‍යන්තර තේ දිනය 2023

මෙවර ජාත්‍යන්තර උත්සවයේ තේමා පාඨය වුයේ ‘‘ලංකා තේ සඳහා නව පරිච්ඡේදයක් ’’ යන්නයි. ජාත්‍යන්තර තේ දින සැමරුම් උත්සවයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිවරයා විසින් දේශීය තේ කර්මාන්තය මුහුණ දෙන අභියෝග පිළිබඳ සඳහන් කරන ලදී. අභියෝගවලට මුහුණ දීමට හා ඔරොත්තු දීමට කුඩා තේ වතු හිමියන්ට ඇති හැකියාවට ගෞරව දැක්වීම මෙවර සැමරුම් උත්සවයේ අරමුණ බව ඔහු අවධාරණය කළේය. වසංගතය හේතුවෙන් ඇති වූ දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා ඔවුන්ගේ හැකියාව සුවිශේෂී වූ අතර වර්තමානය වන විට ඔවුන් නැවත වරක් ඉහළ ලාභදායී මට්ටමක් ලබා ගැනීමට සමත් වී ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දක්වන දායකත්වය අගයමින් 400,000 කට අධික කුඩා තේ වතු හිමියන් සහ ඔවුන්ගේ පවුල් මෙදින ඇගයීමට ලක් කරන ලදී. රටේ විශිෂ්ටතම අපනයන තේ වලින් 70% ක් නිෂ්පාදනය කරන මෙම පුද්ගලයින් සියලු කර්මාන්ත පාර්ශවකරුවන් සහ FAO සමග පැවැත්වූ සැමරුම් උත්සවයකදී ද , ඇගයීමට ලක් කරනු ලැබිය.

ජාත්‍යන්තර තේ දිනය සමරමින් මුහුණු පොතේ පල කරන ලද දැන්වීමක්.




ජාත්‍යන්තර තේ දින සැමරුමට පසුව ශ්‍රී ලංකාවේ චීන සංස්කෘතික මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය එක්ව තේ ප්‍රදර්ශන සැසියක් සංවිධානය කරන ලදී.

සෞදි ආරාබිය, තුර්කිය, එක්සත් ආරාබිය එමීර් රාජ්‍යය, ජර්මනිය, ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, චිලි, ඉතාලිය , ප්‍රංශය, පොලන්තය, දකුණු කොරියාව, තායිවානය, නවසීලන්තය, හොංකොං, කැනඩාව හා ශ්‍රී ලංකාව යන රටවල් 18ක් ඉලක්ක කොට ගනිමින් ජත්‍යන්තර තේ දිනය සැමරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඩිජිටල් මාධ්‍ය ප්‍රචාරණයක් දියත් කරන ලදී. එය පරිපාලකයින් 3,277,646 දක්වා ළඟා වී ඇති අතර, 3,279,811 වරක් පරිශීලක ආකර්ෂණයට ලක් ව ඇත.

ඊට සමගාමීව ජාත්‍යන්තර තේ දිනය සැමරීම වස් ශ්‍රී ලංකාවේ චීන සංස්කෘතික කේන්ද්‍රය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඒකාබද්ධ ව තේ ආදර්ශන සැසියක් සංවිධානය කරන ලදී.



## 2.3.3. වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම

2013 වසරේ දී තෝරාගත් රටවල පැවති ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගි වූ ශ්‍රී ලංකාවේ අපනයන සමාගම්වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහසුකම් සලසනු ලැබිය. මෙම සහභාගිත්වය තුළින් එසේ සහභාගි වූ සමාගම් සතු සුවිශේෂී සන්නාම මෙන්ම ජාතික සන්නාමය වශයෙන් සිලෝන් තේ සන්නාමය ප්‍රදර්ශනය කිරීම අපේක්ෂා කරනු ලැබිය. ශ්‍රී ලංකා තේ සන්නාම සහනාධාර මගින්, කුටි ඉදි කිරීම හා බිම් කුලිය යන දෙයාකාරටම අදාල වියදම්න් අඩක්ම දරනු ලැබිය. ඉතිරි වියදම් හා ආශ්‍රිත ගෙවීම් තෝරාගත් සමාගම් විසින් දරනු ලැබිය. 2023 වසර පුරාවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර ලබාදුන් හා සහභාගි වූ වෙළඳ ප්‍රදර්ශන පිළිබඳ විස්තර පහත දැක්වේ.

• Gulfood 2023 වෙළඳ ප්‍රදර්ශනය, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

පෙබරවාරි 20 සිට 24 දක්වා ඩුබායි හි පැවති Gulfood 2023 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ මණ්ඩපයක් සංවිධානය කරන ලදී. මෙම මණ්ඩපය තුළ ශ්‍රී ලංකාවේ තේ අපනයන සමාගම් 15ක් සඳහා පහසුකම් සැලසී ඇති අතර, නව ව්‍යාපාරික නායකයන් ගොඩ නැගීමට සහ ඔවුන්ගේ පවතින ගෝලීය සේවාදායක පදනම පුළුල් කිරීම සඳහා සිලෝන් තේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට පහසුකම් සලසා ඇත. මැද පෙරදිග සහ ගල්ෆ් කලාපයේ විශාලතම ජාත්‍යන්තර ආහාර පාන ප්‍රදර්ශනය ලෙස ගල්ෆුඩ් පිළිගැනේ.




• රුසියාවේ මොස්කව් හි පිහිටි Prodexpo 2023 හි සිලෝන් තේ භාවිත කිරීම




• ජපානයේ Foodex 2023 හි සිලෝන් තේ භාවිත කිරීම




• 2023 මාර්තු 16 සිට 18 දක්වා මොස්කව්හි පැවැත්වූ ජාත්‍යන්තර සංචාරක සහ ආගන්තුක සත්කාර ප්‍රදර්ශනයේ සිලෝන් තේ ප්‍රවර්ධනය.



• මොස්කව්හි Coffee Tea Cacao Russian Expo 2023 තුළ සිලෝන් තේ ප්‍රවර්ධනය (2023 අප්‍රේල් 12 - 14)

• ශ්‍රී ලංකා තේ මණ්ඩලය Origin Tea Exports (Pvt) Ltd, Regency Teas (Pvt) Ltd සහ Hedleyzs Tea (Pvt) Ltd සමඟ ටොරොන්ටෝ හි පැවති SIAL Canada 2023 ප්‍රදර්ශනයට සහභාගි විය. ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය තේ තොරතුරු කවුළුවක් සංවිධානය කරන ලදී. අමුත්තන් සඳහා සිලෝන් තේ සංග්‍රයක් ද ලබා දෙන ලදී.




• මැයි 18 සිට 20 දක්වා චීනයේ ෂැංහයි හි පැවැත්වෙන SIAL China හි සිලෝන් තේ ප්‍රදර්ශනය කිරීම.

• 2023 මැයි 17 සිට 19 දක්වා අසර්බයිජානයේ බාකු හි පැවති Ceylon Tea Interfood Azerbaijan සහ Ceylon Tea Sampling - Brand Activation යන අවස්ථා වන්හි දී සිලෝන් තේ ප්‍රවර්ධනය.

• 2023 Food Taipei ප්‍රදර්ශන තුළ සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.

• විශිෂ්ටතම තේ වර්ග නියෝජනය කරමින් පුළුල් පරාසයක සිලෝන් තේ නිෂ්පාදන Summer Fancy Food Show 2023 තුළ සිලෝන් තේ මණ්ඩපයේ දී ප්‍රදර්ශනය කරන ලදී.



- රුසියාවේ Kursk කලාපයේ ''Kursk Korensk Fair - 2023'' හි සිලෝන් තේ ප්‍රවර්ධනය (2023 ජුනි 17 - 18)
- 2023 සැප්තැම්බර් 26 සිට 28 දක්වා චිලි හි සන්තියාගෝ හි ශ්‍රී ලාංකික සමාගම් 12ක් සමග Espacio 2023 Chile ප්‍රදර්ශන-යේදී සිලෝන් තේ ප්‍රවර්ධනය.
- රුසියාවේ මොස්කව් හි ක්‍රොකස් සිටි එක්ස්පෝ මධ්‍යස්ථානයේ (2023 සැප්තැම්බර් 19 - 22) World Food Moscow 2023 හි සිලෝන් ප්‍රදර්ශනයට තැබීම.
- Erbil හි Agro Pack Iraq 2023 තුළ සිලෝන් තේ භාවිතයට තැබීම
- Foodex Saudi Expo 2023 හි සිලෝන් තේ ප්‍රවර්ධනය.
- 2023 සැප්තැම්බර් 15 සිට 17 දක්වා ශාන්ත පීටර්ස් බුබර්ග් හි පැවති තේ සහ කෝපි උත්සවයේදී සිලෝන් තේ භාවිත කිරීම.
- චීනයේ බීජිං හි තේ ප්‍රවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද SIAL Shenzhen 2023 හිදී සිලෝන් තේ භාවිත කිරීම.
- FoodAg 2023 Karachi හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මණ්ඩපය, 2023 අගෝස්තු 10 සිට 12 දක්වා පකිස්ථානයේ වෙළඳ ප්‍රදර්ශනය.
- හොන්කොන් ඉන්ටර්නැෂනල් වෙළඳ ප්‍රදර්ශනය 2023 සහ හොන්කොන් ඉන්ටර්නැෂනල් තේ තරගය 2023 හි සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.
- රුසියාවේ මොස්කව්හි තේ ප්‍රවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද 2023 සැප්තැම්බර් 15 සිට 17 දක්වා ශාන්ත පීටර්ස් බුබර්ග් හි පැවති තේ සහ කෝපි උත්සවයේදී සිලෝන් තේ යොදා ගැනීම.
- 2023 නොවැම්බර් 27 සිට 29 දක්වා අබුඩාබි ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශනයට සිලෝන් තේ එකතු කිරීම.
- කසකස්ථානයේ Almaty ys Food Expo (2023 නොවැම්බර් 1 සිට 3 දක්වා) තුළ සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.
- 2023 නොවැම්බර් 14 සිට 16 දක්වා රුසියාවේ ශාන්ත පීටර්ස්බුබර්ග් හි Peterfood 2023 ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.
- 2023 වසරේ ෂැංහයි හි පැවති චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනයේ සිලෝන් තේ ප්‍රවර්ධනය - ශ්‍රී ලංකාව සඳහා වූ මණ්ඩපය.
- මොස්කව්හි පැවති ''චෂ්කා'' තේ උත්සවයේ දී සිලෝන් තේ ප්‍රවර්ධනය (2023 ඔක්තෝබර් 21 - 22).
- Xiamen 2024 හි දී සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.
- ජර්මනියෙ ANUGA 2023 හි සිලෝන් තේ ප්‍රදර්ශනයට තැබීම.

## 2.3.4.විදේශිය මාධ්‍ය නිලධාරීන් සමඟ තේ ප්‍රවර්ධන වැඩසටහන

### i. 2023 අප්‍රේල් 28 සිට මැයි 11 දක්වා ඩැන් බෝල්ටන් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය

Tea Journey සඟරාවේ නිර්මාතෘ ඩැන් බෝල්ටන් මහතා 2023 අප්‍රේල් 28 සිට මැයි 11 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. තම සංචාරය තුළදී ඔහු තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් සමඟ එලදායී සංචාර හා රැස්වීම් ගණනාවක් පැවැත්විය. බෝල්ටන් මහතාගේ සංචාරය තේ කර්මාන්තයේ හා ශ්‍රී ලංකාවේ තේ සංචාරක ව්‍යාපාරයේ නිරසාරභාවය සම්බන්ධ විශාල වපසරියක් ආවරණය කිරීමට සමත් විය.

- Asia Siyaka සමාගම නැරඹූ අතර අනිල් කුක් මහතා හමුවී නව වෙන්දේසි ක්‍රමය පිළිබඳව සාකච්ඡා කළේය. පොඩ්කාස්ට් සහ බ්ලොග් සටහනක් ප්‍රකාශයට කරන ලදී.
- තේ පර්යේෂණ ආයතනයට ගොස් එහි අදාළ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්විය. පොඩ්කාස්ට් සහ බ්ලොග් සටහනක් ප්‍රකාශයට පත් කරන ලදී.
- CTTA, T.E.A , P.A සහ කර්මාන්ත පාර්ශවකරුවන් සඳහා නිෂ්පාදනය, පරිභෝජනය සහ තේ වෙළඳපල ප්‍රවණතා පිළිබඳ සාර්ව ආර්ථික ඉදිරි දර්ශනය පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.
- පහත ප්‍රදේශ ආවරණය වන පරිදි Tea Journey සඟරාවට හා Tea Biz podcasts සඳහා ලිපි සපයන ලදී.
  - රත්නපුර ෆොරස්ට් හිල් තේ වත්ත, කර්මාන්ත ශාලාව සහ එහි මෙහෙයුම් කටයුතු.
  - බදුල්ලේ නැවුම් තේ දළු උත්සවය
  - නෙළුවේ මඩගම තේ කම්හල සහ කුඩා තේ වතු සහ වගාකරුවන් නැරඹීම
  - අක්කර 98 ක නිවාඩු නිකේතනය, Ravana Zipline, Ravana Pool Club නැරඹීම, ශ්‍රී ලංකාවේ තේ සංචාරක ව්‍යාපාරයේ මාවත් පිලිබඳ විශේෂයෙන් ඉස්මතු කර දක්වන ලදී.



### ii. 2024 ඔක්තෝබර් 5 සිට 15 දක්වා ගාබ්‍රියෙලා ස්කාර්පා මහත්මියගේ ශ්‍රී ලංකා සංචාරය

ඉතාලියේ AR-Tea Academy හි තේ විශේෂඥ වන ගාබ්‍රියෙලා ස්කාර්පා (Gabriella Scarpa) මහත්මිය 2023 ඔක්තෝම්බර් මාසයේ දින දහයක කාලයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ උපදෙස් හා සහයෝගය සහිතව කර්මාන්තයේ පාර්ශවකරුවන් සමඟ එලදායී චාරිකා සහ රැස්වීම් මාලාවක් පවත්වමින් විශේෂිත තේ නිෂ්පාදනය, අපනයනය සහ තේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධ පුළුල් ලෙස ගවේෂණය කිරීමට ඇයට හැකි විය.

- තේ අපනයනකරුගේ භූමිකාව පිළිබඳ දැනුම ලබාගැනීම සඳහා ඇය ඇතැම් අපනයනකරුවන් හමු විය. උදා: Basilur Tea Exports iy Amazon Tea Exports සහ අගය එකතු කළ තේවල රස බැලූ අතර අගය එකතු කළ තේ ඇසුරුම් කිරීමේ ක්‍රියාවලිය ද නැරඹීය.
- තේ දළු නෙලීමේ සිට තේ සෑදීම දක්වා තේ සැකසීමේ අත්දැකීම ලබා ගැනීම සඳහා ඇය පිටිගල අතුකෝරල තේ කම්හල, මාතර හඳුනුගොඩ අතින් ශිල්පිය කම්හල සහ නිවිතිගල විතානකන්ද තේ කම්හල වෙත සංචාරය කළේය. මෙම චාරිකා අතරතුර, අදාළ වතු වෙත ක්ෂේත්‍ර චාරිකා සිදු කරන ලද අතර, පිළිවෙළින් කළු සහ අතින් සාදන ලද තේ නිෂ්පාදන ක්‍රියාවලිය

නිරීක්ෂණය කිරීම සඳහා කර්මාන්තශාලා නැරඹීම ද සිදු කරන ලදී.

- Asia Siyaka හි ප්‍රධාන විධායක නිලධාරී සමඟ රැස්වීමකට සහභාගි වූ අතර නව මාර්ගගත වෙන්දේසි ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඉහත ස්ථාන වලට අමතරව ඇය විසින් කඩවත අක්බාර් ක්ෂණික තේ කර්මාන්ත ශාලාවටද සංචාරය කරන ලදී.



ඇය එම්පයර් ටී එක්ස්පෝර්ට්ස් සමාගමට අයත් කොළඹ පිහිටි Tea Avenue හි විවිධ තේ වර්ගවල රස හා ශ්‍රී ලාංකික ආහාර පිසීමේ කලාව ගැන අත්දැකීම් ලබා ගත්තාය. MJF අපනයන ආයතනය මගින් කළමනාකරණය කරනු ලබන තේ අවන් හල් වල සැබෑ ස්වරූපය අත්විඳීමට ඇය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිවරයා සමග කොළඹ Dilmah Tea Launch වෙත සංචාරය කළාය. එහිදී ඇය විවිධ කෑම වර්ග සහිත තේ පැන් සංග්‍රහ අවස්ථාවන් සහ තේ පානය සහිත ඉතාලි ආහාර පිළිබඳ අත්දැකීම් ලැබුවාය.

ඉහත ස්ථාන වලට අමතරව ඇය සිලෝන් තේ කෞතුකාගාරය නැරඹූ අතර, කෞතුකාගාරයේ තැන්පත් කර ඇති පැරණි තේ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ උපකරණ සියැසින් දැක ගත්තාය. එම ගමනේදී ඇය ගලහ, ලුල්කඳුර තේ වත්ත, දම්රෝ ලබුකැලේ තේ වත්ත සහ කර්මාන්ත ශාලාව, යුනිලිවර් ක්ෂණික තේ කම්හල, ආගරපතන සහ ඇම්බා ශිල්පිය තේ කම්හල යන ස්ථාන ද නරඹන ලදී. ඇයගේ සංචාරයේදී ඇය මහනුවර පින්නවල අලි අනාථාගාරයට සහ දළදා මාලිගාව වෙත ගොස් අක්කර 98 නිවාඩු නිකේතනවලට ගොස් සංස්කෘතියේ, වතුකරයේ සහ සංචාරක ව්‍යාපාරයේ සුන්දරත්වයේ විවිධත්වය විඳ ගත්තාය.



නම සෑම නැවතුමකින්ම පසු, සිලෝන් තේ වල වටිනාකම, ගුණාංග සහ වැදගත්කම, ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන සමඟ ඉස්මතු කරමින් සමාජ මාධ්‍ය සටහනක් පළ කිරීම ඇයගේ සංචාරයේ විශේෂතම කරුණ විය.

### iii. ජොයිස් මෙයිනා (Joyce Maina) මහත්මිය (යුරෝපීය විශේෂිය තේ සංගමයේ අධ්‍යක්ෂ) විසින් සිදු කළ ශ්‍රී ලංකාවේ විශේෂිත සහ අතින් සෑදූ තේ පරිසර පද්ධති වැඩමුළුව

යුරෝපීය විශේෂ තේ සංගමයේ අධ්‍යක්ෂ සහ Cambridge Tea Consistency හි නිර්මාතෘවරිය වන Joyce Maina මහත්මිය විසින් විශේෂිත තේ අංශයේ ගෝලීය ප්‍රවණතා සහ අවස්ථා මෙන්ම සෘජු අපනයන සබඳතා ගැන්වීම සහ ශ්‍රී ලංකාවේ අතින් සෑදූ / ශිල්පීය තේ නිෂ්පාදකයින් සඳහා වෙළඳපල ප්‍රවේශ අවස්ථා ගවේෂණය කිරීම පිළිබඳ සැසියක් පවත්වන ලදී. මෙම සැසිය 2023 දෙසැම්බර් 14 වැනි දින ලංකා වාණිජ මණ්ඩලයේදී තේ අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.





ජොයිස් මෙයිනා මහත්මිය ‘‘විශේෂ තේ වෙළෙඳපොළේ ගෝලීය ප්‍රවණතාව’’ මැයෙන් සිය සැසිවාරයට පෙර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පැවති විශේෂ සිලෝන් තේ රස බැලීමේ සැසියට ද සහභාගි වුවාය.



## 2.3.5.සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සිංහ ලාංඡනය සහිත තේ අපනයනකරුවන්ට ඔවුන්ගේ සන්නාම ප්‍රවර්ධනය කිරීම සඳහා මුල්‍යාධාර සැපයීමයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ස්ථාපිත ප්‍රවර්ධන සහ අලෙවිකරණ බද්දෙන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල් ලබා දේ.

සන්නාම ප්‍රවර්ධන ව්‍යාපෘති කාලසීමාව 2023 මාර්තු 31 වන දින අවසන් විය. සමාගම් 10ක අයදුම්කරුවන් ව්‍යාපෘති 23ක් ඇගයීම සඳහා ලේඛන ඉදිරිපත් කරන ලදී. මෙම සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සඳහා ඇගයීම් ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. සමාගම් 02ක් විසින් ව්‍යාපෘති 03ක් සඳහා ඉදිරිපත් කරන ලද සන්නාම ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර බෙදා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට හැකියාවක් නොතිබුණි. ඉතිරි ව්‍යාපෘති 20න්, අමාත්‍යාංශයේ පත් කරන ලද ගණකාධිකාරි-වරයා විසින් අදාළ විනිමය අනුපාත සමග අගය තහවුරු කිරීමට යටත්ව පහත සඳහන් ව්‍යාපෘතිවල ඇගයීම අවසන් කරන ලදී.

- Finlays Colombo Ltd. (Alwazah Tea) - සෞදි අරාබියේ වෙළඳසැල
- Akbar Brothers Exports (Pvt) Ltd. “Algaza leen Brand” ජෝර්දානය
- Basilur Tea Exports (Pvt) Ltd. “Basilur Brand” - බෝල්ටික්ස් (ලැට්වියා)
- ජෝර්දානය සඳහා Akbar Brothers Exports (Pvt) Ltd. “Alghaza leen Brand” to Jordan

## 2.3.6. අගය එකතු කළ තේ සඳහා 5% දිරි දීමනා යෝජනාක්‍රමය (කි.ග්‍රෑම් 3ට අඩු)

අගය එකතු කළ තේ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2022 දී අගය එකතු කළ තේ (කි.ග්‍රෑම් 3ට අඩු) සඳහා 5% දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. අගය එකතු කළ තේ අපනයනය කරන තේ අපනයනකරුවන් මෙම යෝජනා ක්‍රමය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබා ඇත.

2021 සහ 2019 කාල වකවානුව සලකා බලා අගය එකතු කරන ලද තේ අපනයනකරුවන් 290 දෙනෙකු සඳහා මෙම ඇගයීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද යෝජනා ක්‍රමයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව, ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක භාවිත කරන ලදී.

- ලිත් වර්ෂය සඳහා තේවල අගය එකතු කළ කාණ්ඩයේ මුළු ආදායම පාදක වර්ෂයට වඩා වැඩි විය යුතුය (ශුද්ධ ආදායම ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතය ලෙස)

- අගය එකතු කළ තේ කාණ්ඩයෙන් (සිරියාව සඳහා පමණක් තේ බෑග්, කි.ග්‍රෑම් 3ට අඩු තේ පැකට්, ක්ෂණික තේ සහ පානය සඳහා සුදානම් කළ තේ සහ කිලෝග්‍රෑම් 5 ට අඩු තේ ඇසුරුම්) උපයාගන්නා ලද අපනයනවල වර්ධක වටිනාකම මත 05%දිරි දීමනාවක් ගෙවනු ලැබේ.


දිරි දීමනා ක්‍රමය අදාළ වන්නේ අගය එකතු කළ තේවල අපනයන ආදායම මත පමණි. ඉහත නිර්ණායක මත පදනම්ව, සුදුසුකම් ලත් අගය එකතු කළ තේ අපනයනකරුවන් 92 දෙනෙකු තෝරා ගන්නා ලදී. මෙම අගය එකතු කළ අපනයනකරුවන් 92 සඳහා 5% දිරි දීමනාව සඳහා රු. 571,715,266.49 ක මුදලක් අවශ්‍ය වේ. අගය එකතු කළ අපනයනකරුවන් 79ක් සඳහා වසර තුළ රු.561,174,382.89ක් නිකුත් කරන ලදී

## 2.3.7. ප්‍රවර්ධන අවස්ථා හා ක්‍රියාකාරකම්

• වියානා හි සංචාරක කර්මාන්තය හා සිලෝන් තේ ප්‍රවර්ධනය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය තානාපති කාර්යාලය සහ ස්ථිර දූත මණ්ඩලය ශ්‍රී ලංකාවේ වියානා තානාපති කර්‍යාලය සමග එක්ව 75 වැනි නිදහස් සංවත්සරය සැමරීම සඳහා අපනයන ගමනාන්ත ප්‍රවර්ධන වැඩසටහනක් පසුගියදා උත්කර්ෂවත් අන්දමින් Wien Mitte ඒකක හි දී සංවිධානය කරන ලදී.




• උස්බෙකිස්තානයේ ටස්කන්ට් හි Eco Bazar තුළ පැවති සිලෝන් තේ සිංහ ලාංඡන සන්නාම (Akbar” Impra” Dilmah” Tudor) ප්‍රවර්ධනය
2023 මාර්තු 27 සිට 30 දක්වා මොස්කව්හි තේ ප්‍රවර්ධන ඒකකය විසින් පවත්වන ලදී.




• එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මහ කොමසාරිස් කාර්යාලයේදී සිලෝන් තේ, සහ ශ්‍රී ලංකාවෙන් ලොවට දායාද කරන ලද විශිෂ්ටතම ඕතඩොක්ස් තේ ප්‍රවර්ධනය කරන ලද අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව 2023 මාර්තු 15 දින විදේශ අමාත්‍ය අලි සබ්රි මහතාගේ එක්සත් රාජධානි සංචාරය අතරතුර වෙස්ට්මිනිස්ටර් මාලිගයේ ටෙරස් මණ්ඩපයේ දී දහවල් තේ පැන් සංග්‍රහයක් සංවිධානය කරන ලදී.



- සිලෝන් තේ ටොරොන්ටෝ තේ උත්සවය තේ Toronto Reference Library Tea Festival යනු තේ ලෝලීන් සඳහා කැනඩාවේ විශාලතම උත්සවය වන අතර එය 2023 ජනවාරි මාසයේ දින දෙකක දී පැවැත්විණි.




- මොස්කව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ තේ ප්‍රවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද Unique Russia ප්‍රදර්ශනය 2023 ජනවාරි 24 සිට පෙබරවාරි 05 දක්වා පැවැත්විය.
- මොස්කව්හි තේ ප්‍රවර්ධන ඒකකය මගින් පහසුකම් සැලසූ රුසියාවේ Chelyabinsk, South Ural State University හි සිලොත් තේ සංග්‍රය සමග අලුත් අවුරුදු සැමරුම සිදු කිරීම.
- බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ප්‍රදාර්ශනය -2023 දී බ්‍රසීලයේ ජාත්‍යන්තර ආහාර සහ සංස්කෘතික බසාර් හි දී ශ්‍රී ලංකික සංචාරක කර්මාන්තය, තේ සහ ආහාර වර්ග ප්‍රවර්ධනය කරනු ලැබිය.



- ටෙහෙරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2023 ජාත්‍යන්තර තේ දිනයේදී සිලෝන් තේ ප්‍රවර්ධනය කරනු ලැබිය.




- මොස්කව්හි පැවති 9 වැනි ජාත්‍යන්තර යෝග දින'' උත්සවයේ දී සිලෝන් තේ ප්‍රවර්ධනය.
- පැරිසියේ යුනෙස්කෝ මූලස්ථානයේ ජාත්‍යන්තර තේ දිනයේදී ශ්‍රී ලංකාව විසින් සිලෝන් තේ සන්නාමය ප්‍රදර්ශනය කිරීම.
- 2023 ජූලි 10 වන දින ක්‍රවුන් ප්ලාසා හෝටලයේ පැවති ආසියානු සහයෝගිතා සංසද දින පිළිගැනීමේ උත්සවයට සමගාම්ව කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තේ ප්‍රවර්ධන වැඩසටහනකට සහභාගි විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මගපෙන්වීම යටතේ සිලෝන් තේ ප්‍රදර්ශනය කරන ලදී. නරඹන්නන් සිය ගණනකට විවිධ ප්‍රභේදවලින් යුත් සිලෝන් තේ පිරිනමන ලදී.
- තිරසාර, පෝෂණ ගුණයෙන් යුත් සහ සෞඛ්‍ය සම්පන්න පානයක් සඳහා ඕස්ට්‍රේලියානුවන්ගේ වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් 'සිලෝන් හරිත තේ' ප්‍රවර්ධනය කිරීම සඳහා සිලෝන් තේ කුටියක් ද ස්ථාපිත කරන ලදී.
- කැනඩාවේ සිටින ශ්‍රී ලාංකිකයන් විසින් කැනඩාවේ Folkfest Saskatoon හි සිලෝන් තේ ප්‍රවර්ධන කවුළුවක් සංවිධානය කරන ලදී. උත්සවය දින 3 ක් පැවතුනි. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, Tea Legacy Pvt Ltd, Unicom Tea සහ Prana Wellness විසින් තේ සාම්පල සහ නිෂ්පාදන ලබා දෙමින් අනුග්‍රහය දක්වනු දැක්විය.
- ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වෙමින් (2023 සැප්තැම්බර් 12 සිට 14 දක්වා) මොස්කව්හි ''OTDYKH'' ජාත්‍යන්තර රුසියානු සංචාරක වෙළඳපොළ ප්‍රදර්ශනයේදී පැවැත්වූ සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන.
- ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග සහයෝගයෙන්, ටෙහෙරාන් ජාත්‍යන්තර ප්‍රදර්ශන භූමියේ පැවති 10 වැනි ජාත්‍යන්තර පාන, තේ, කෝපි සහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රදර්ශනයේ දී (DRINKTECH-2023) සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහනක් 2023 සැප්තැම්බර් 07 සිට 10 දක්වා සාර්ථකව සංවිධානය කරන ලදී.
- සෞදි අරාබියේ රියාද් හි 2 වන ජාත්‍යන්තර තේ වර්ණ ප්‍රදර්ශනය තුළ සිලෝන් තේ ප්‍රදර්ශනය කිරීම. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් තානාපති කාර්යාලය 2 වැනි ජාත්‍යන්තර තේ ප්‍රදර්ශනයට සහභාගි විය. ශ්‍රී ලංකාවේ කලාප 7 ක තේ සහිත ''සිලෝන් තේ කුටිය'' නරඹන්නන්ගේ අවධානයට ලක් විය.
- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2023 දෙසැම්බර් 9 වන දි ඔස්ට්‍රියා Charity Bazaar මධ්‍යස්ථානයේ පැවති ජාත්‍යන්තර උත්සවය සඳහා සම්බන්ධ විය.
- 2023 දෙසැම්බර් 5 වන දින ඔස්ට්‍රියාවේ වියානාහි වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 'Asia Day-2023' හි සිලෝන් තේ ප්‍රවර්ධන සිදු කරන ලදී.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙ COPE28 හි ශ්‍රී ලංකා මණ්ඩපය.
- ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් Chelsea රාජකීය රෝහලේ දී සිලෝන් තේ ලබා දෙමින් සහයෝගිතාවය දැක්විය.
- දකුණු අප්‍රිකාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා හි බෑක්ලින් වෙළඳ සංකීර්ණයේ සිලෝන් තේ ප්‍රදර්ශනය.
- අගය එකතු කළ සිලෝන් තේ සහ සිලෝන් ශිල්පීය තේ සඳහා ඉතාලියේ පැවති ප්‍රවර්ධන වැඩසටහන.
- ටෙහෙරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Iran Charity Bazaar සඳහා සහභාගි විය.
- කසකස්ථානයේ අල්මාති හි Yubileyniy සුපිරි වෙළඳසැලේ පැවති සිලෝන් තේ සන්නාම සක්‍රිය කිරීමේ තෙදින වැඩසටහන (2023 නොවැම්බර් 1 සිට 3 දක්වා) - දිනකට පැය 9. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය 2023 Foodexpo Kazakhstan ට සමගාමීව අල්මාති හි පැවැත්වි
- බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2023 ඔක්තෝම්බර් 18 වන දින බ්‍රසල්ස් ප්‍රෙස් ක්ලබ් හිදී “ ශ්‍රී ලංකා වෙන් බෙල්ජියමට රසය සහ සුවඳ පිළිබඳ ගමනක්” යන මැයෙන් ප්‍රථම වරට සිලෝන් තේ ප්‍රවර්ධන සහ තේ රස බැලීමේ උත්සවය පවත්වන ලදී.
- දකුණු චීනයේ ෆුජියන් පළාතේ ෂමළුයදම හි චීන තේ ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රවර්ධනය සහ Imperial Teas, Sinolan Teas සහ Continental Teas සන්නාමයන් සමග එක්ව සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම.





- ‘නොමිලේ විසා’ සමග ශ්‍රී ලංකාවට පැමිණීම - චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පවත්වන ලද ප්‍රවර්ධන සැසියට සිලෝන් තේ සහභාගිත්වය
- රුසියාවේ සෝචි හි ‘‘කුබන් නත්තල් සල්පිල’’ හි සිලෝන් තේ ප්‍රවර්ධනය
- 2023 දෙසැම්බර් 21 සිට 24 දක්වා රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී සිලෝන් තේ සංග්‍රහයක් ද සමගින් සංවිධානය කරන ලද අතර ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහනේ කොටසක් ලෙස සංචාරක ප්‍රවර්ධන උත්සවය 2023 දෙසැම්බර් 13 දින තානාපති කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට සංචාරක ක්‍රියාකරුවන්, මාධ්‍ය නියෝජිතයින් සහ සමාජ මාධ්‍ය බලපෑම්කරුවන් රැසකගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලැබිණි

## 2.3.8. වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරගකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය යටතට ගැනේ. ඇ.එ.ජ. තේ සංගමය, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර තේ කමිටුව, ජපාන තේ සංගමය සහ කැනඩාවේ තේ සහ ශාකසාර සංගමය හා ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම යන සියළු සංවිධානවල ශ්‍රී ලංකා තේ මණ්ඩලය සාමාජිකත්වය ලබා ඇත. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. පාරිභෝගික දැනුවත් කිරීම සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධන කරනු ලබන තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහි වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරනු ලබයි.

ජපාන තේ සංගමයේ නියෝජිත කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ වගාව, සිලෝන් තේ කෞතුකාගාරය සහ තේ වෙන්දේසිය යනාදිය නරඹන ලදී





- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ ජපානය යන රටවල තේ සංගම්වල වාර්ෂික දායකත්වය අලුත් කරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ වාර්ෂික දායක ගාස්තු- $9,805, කැනඩාව -CAD 17,289 සහ ජපානය - Yen 250,000.
- එක්සත් රාජධානියේ තේ විද්‍යායතනය සමග සිලෝන් තේ සහ ආහාර යුගල කිරීමේ සැසි සාර්ථකව නිම කරන ලදී.

## 2.3.9. භූගෝලීය දර්ශක යටතේ ලංකා තේ, කලාපීය නම් සහ ලාංඡන ලියාපදිංචි කිරීම

සිලෝන් තේ නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත (නුවර එළිය, උඩ පුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව සහ රුහුණ) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කරන ලදී. මෙමගින් විශේෂයෙන්ම කොන්ත්‍රාත් පදනමෙන් කටයුතු කරන විදේශීය ඇසුරුම් කරුවන් විසින් සිලෝන් තේ නාමය සහ කලාපීය තේ නාම අවභාවිත කිරීම වැලැක්වීමට සහායවීම පමණක් නොව භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ශ්‍රී ලංකා තේ සඳහා අගය සහ නියම මිල එකතු කිරීම ද සිදුකෙරේ.

## 2.3.10. සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම

GI ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ‘‘සිලෝන් තේ’’ සඳහා භූගෝලීය දර්ශකයක් සහ අදාළ නත්ත්ව සහ තිරසාර බව සහතික කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමට සහාය වීමයි. එම ඉදිරි දර්ශනය තුළ, ජාතික සහ ජාත්‍යන්තර සහතික කිරීම් සමඟින් බුද්ධිමය දේපළ ආරක්ෂාව, විශේෂයෙන්ම භූගෝලීය දර්ශක ඔස්සේ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ වැඩි දියුණු කළ අගය එකතු කිරීමත් සමග ‘‘සිලෝන් තේ’’ වටිනාකම් දාමය වඩාත් ඵලදායී, අන්තර්කරණ, සහ එහි ආර්ථික, පාරිසරික සහ සමාජීය අංශ ඔස්සේ තිරසාර බවට පත් කරනු ඇත.

නිශ්චිත භූගෝලීය සම්භවයක් හා සුවිශේෂී ලක්ෂණ හෝ එම සම්භවය හේතුවෙන් ගොඩනැගී කීර්තියක් සහිත නිෂ්පාදන භූගෝලීය දර්ශකයක් ලෙස නම් කෙරේ. යම් නිෂ්පාදනයක් භූගෝලීය දර්ශකයක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා නිශ්චිත ස්ථානයක සිට පැමිණෙන බව හඳුනා ගන්නා ලකුණක් අවශ්‍ය වේ.



ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී සිතියම්ගත කිරීම, භූගෝලීය දර්ශක සංකල්පය මත ධාරිතාව ගොඩනැගීම (ඊ-ඒසියා භූගෝලීය දර්ශක පුහුණුව - මාර්ගගත), භූගෝලීය දර්ශක සාමූහික කළමනාකරණ සංවිධානය, සහ භූගෝලීය දර්ශක සංකල්පය මත නිෂ්පාදන පිරිවිතර නිර්වචනය සහ ධාරිතාව ගොඩනැගීම - භූගෝලීය දර්ශක පිළිබඳ උසස් පුහුණුව වැනි ඇතැම් ක්‍රියාකාරකම් දැනටමත් සම්පූර්ණ කර ඇත.


නිම කළ යුතු කාර්යයන් කිහිපයක් ඇති අතර ඒවා නම් පාලන සැලැස්ම සහ සොයා ගැනීමේ පද්ධතිය ස්ථාපිත කිරීම (දැනටමත් ආරම්භ කර ඇත), සිලෝන් තේ භූගෝලීය දර්ශක හා භූගෝලීය දර්ශක ප්‍රවර්ධන ක්‍රමෝපාය ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම සහ අවභාවිතයන්/වංචා නිරීක්ෂණය කිරීම වේ.

සිලෝන් තේ භූගෝලීය දර්ශක පාලන සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා දෙවන වටයේ දී CIRAD විසින් 2023 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රාදේශීය කාර්යාල හතක් ආවරණය වන පරිදි ප්‍රාදේශීය වැඩමුළු පවත්වන ලදී.





## භූගෝලීය දර්ශක සහිත සිලෝන් තේ කරා මාර්ග සිතියම




• බදුරලිය කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා කන්දෙගෙදර උමා ගාර්ඩන් හෝටලයේ දී ඔක්තෝබර් 17 දින පැවැත්වූ වැඩමුළුව.



• මාතර කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා පිටබැද්දර සාරා ග්‍රෑන්ඩ් හෝටලයේ දී ඔක්තෝබර් 18 දින පැවැත්වූ වැඩමුළුව




• ගාල්ල කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා ගාල්ල හසරා හෝටලයේ දී ඔක්තෝබර් 19 දින පැවැත්වූ වැඩමුළුව



• රත්නපුර කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා පැල්මඩුල්ල සිල්වර් රේ හෝටලයේ දී ඔක්තෝබර් 20 දින පැවැත්වූ වැඩමුළුව.



• බණ්ඩාරවෙල කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා බදුල්ල හෙරිටේජ් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ඔක්තෝබර් 23 දින පැවැත්වූ වැඩමුළුව.



• නුවර එළිය කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා නුවර එළිය බ්ලැක් පුල් හෝටලයේ දී ඔක්තෝබර් 24 දින පැවැත්වූ වැඩමුළුව.



• ගම්පොල කලාපයේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා නුවර ඔර්ක් රේ රිජන්සි හෝටලයේ දී ඔක්තෝබර් 25 දින පැවැත්වූ වැඩමුළුව.



## 2.3.11. වෙළඳ සලකුණෙහි සුරක්ෂිත බව

සිලෝන් තේ සිංහ ලාංඡනයේ හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල සිලෝන් තේ සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම /අලුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය මගින් කරනු ලබයි. 2023 වසර වන විට සිංහ ලාංඡනය රටවල් 103ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිත කිරීමේ අධිකාරිය ප්‍රදානයකර ඇත්තේ 100% ක්ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල අවම ප්‍රමිතියට වඩා ඉහළින් වූ අගය එකතුකළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණක් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කරන ලද ඒවා ද විය යුතුයි.

සමාලෝචිත කාලසීමාව තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් බ්‍රසීලයේ නව සිංහ ලාංඡනයක් (Ceylon Tea Symbol of Quality and Lion Device) ලියාපදිංචි කිරීමට මූලිකත්වය ගෙන ඇත. අසර්බයිජානය, ඉන්දියාව සහ බංගලාදේශයේ නව ලියාපදිංචිය නිම කර ඇත. තවද, සිංහ ලාංඡන උපාංගය අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට එය ලයිබීරියාවේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ක්‍රියාත්මක වේ. සියෙරා ලියෝන් හි ලියාපදිංචිය අලුත් කිරීම හමාර කර ඇත. තවද, ප්‍රකාශිත වෙළඳ ලකුණට එරෙහිව නිසි ලෙස සකස් කර ඇති ඉරාකයෙන් ලැබුණු වෙළඳ ලකුණු දැන්වීමට දැනටමත් මුලපුරා ඇත.

**• ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව සහතික සලකුණක් ලෙස ශ්‍රී ලංකාව තුළ ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කර ඇත. මොන්ට්‍රියල් ගිවිසුම (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව බෙදා හැරීමේ අරමුණු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදී. පරිසර හිතකාමී තාක්ෂණයන් අනුගමනය කිරීමත් සහ තේ වතුවල (තවාන්) මෙතිල් බ්‍රෝමයිඩ් භාවිත නොකිරීමත් සමග තේ අංශයේ ව්‍යාපෘතිය 2002 දී සාර්ථකව නිම කරන ලදී. 2007 දී ශ්‍රී ලංකාව Montreal Protocol Implementers සම්මානයෙන් පිදුම් ලැබීය. ලෝකයේ ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කළ පළමු හා එකම ජාතිය ශ්‍රී ලංකාව වේ.

සමාලෝචිත කාල වකවානුව තුළ, "ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ සහ උපාංග (OZONE Friendly Pure CEYLON TEA Device), අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට ලියාපදිංචිය අලුත් කිරීම ඉරානය සඳහා අවසන් කර ඇත.

2023 වසරේ දී තේ අපනයනකරුවන් 11 දෙනෙකු විසින් දෙසැම්බර් මාසය දක්වා සන්නාම දහතුනක් සඳහා ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය භාවිත කිරීමට බලයලත් අයිතිය ලබාගෙන ඇත.

## 2.3.12. විදේශීය තේ ප්‍රවර්ධන කාර්යාල සහ වෙළඳපල ආවරණය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කලාපීය විදේශීය තේ ප්‍රවර්ධන ඒකක දෙකක් ස්ථාපිත කර චීනයේ සහ රුසියාවේ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලවලට අනුයුක්ත කර ඇත. රුසියානු සමූහාණ්ඩුවේ සහ CIS වෙලඳපොලවල තේ ප්‍රවර්ධනය කිරීමේ වගකීම මොස්කව් කාර්යාලයට පවරා ඇත.

වර්ධනය වෙමින් පවතින වෙළෙඳපොළක් වන චීනයේ සිලෝන් තේ වෙළඳපල කොටස පුළුල් කිරීම සඳහා නියෝජිත කාර්යාලයක් 2015 දී බීජිං හි විවෘත කරන ලදී. ඉහත සඳහන් ස්ථානවල සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමේ උත්සාහයන් තේ ප්‍රවර්ධන ඒකක දෙක විසින් සෘජුවම කළමනාකරණය කරන ලදී. මේ අතර, කොළඹ තේ ප්‍රවර්ධන අංශය අනෙකුත් වෙළඳපලවල් වලට අවතීර්ණ වීම සඳහා විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී.

## 2.3.13. තේ අපනයනය තුළින් ඉරානය සමඟ තෙල් සඳහා තේ හුවමාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2012 වසරේ දී මිලදී ගත් තෙල් සඳහා ඉරානයට ගෙවිය යුතු ඩොලර් මිලියන 250ක මුදල පියවීම සඳහා, ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන ලද තේ වලට බොරතෙල් සඳහා කළ යුතු ගෙවීම් හිලවි කිරීමට ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. ඉරානයට සිලෝන් තේ අපනයනය කිරීමට පහසුකම් සැලසීම සඳහා එම මුදල භාවිත කරමින් ශ්‍රී ලංකාවේ වැවිලි අමාත්‍යාංශය සහ ඉරානයේ කර්මාන්ත, පතල් සහ වෙළඳ අමාත්‍යාංශය 2021.12.21 දින ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ජාතික ඉරාන තෙල් සමාගමට හිඟ ඩොලර් 250,925.169 ක මුදලක් ගෙවීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව, හුවමාරු වෙළඳාම සඳහා එකඟ වෙමින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අවම වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 5ක් මාසිකව ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත මුදා හරින ලදී. අවබෝධතා ගිවිසුම 2023 අගෝස්තු මාසයේ සිට සක්‍රිය කර ක්‍රියාත්මක කරන ලදී.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ජාතික ඉරාන තෙල් සමාගමට ගෙවිය යුතු මෙම මුදල අවම වශයෙන් මාස 48ක් සඳහා ඉරානයට අපනයනය කරනු ලබන සිලෝන් තේවලින් ආවරණය වේ. තේ අපනයනකරුවන්ට ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් මුදල් ගෙවනු ලබන්නේ තේවල වටිනාකම අනුවය. එක්සත් ජනපද ඩොලරය හා ශ්‍රී ලංකා රුපියල් අතර විනිමය අනුපාතිකය ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අරමුදල් මාරු කරන දිනයේ දී මහ බැංකුව විසින් නියම කරනු ලබන වටිනාකමයි.

## 2.3.14. ප්‍රවර්ධන/තොරතුරු ප්‍රකාශන

2023 වර්ෂය තුළ ද්වි-මාසික පුවත් ලිපි හයක් නිකුත් කරන ලදී.

## 2.3.15. දේශීය තේ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය වර්ෂය තුළදී දේශීය වෙළඳ ප්‍රදර්ශන බොහොමයකට සහභාගී විය.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා එක්ව කොළඹ ඕඑසිස් පාසලේ දී පැවැත්වූ සිලෝන් තේ රස බැලීමේ සැසිය / දැනුවත් කිරීමේ වැඩසටහන.



- "ගාලු කොටුවේ තේ අමාත්‍යාංශය" - 2023.01.14 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.




- "කර්මාන්ත 2023" ප්‍රදර්ශනය 2023 ජුනි 22 සිට 25 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ විශාලතම ජාතික කාර්මික උත්සවය වූ "කර්මාන්ත 2023" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය "අපනයනාභිමුඛ නිෂ්පාදන ආර්ථිකය කරා" යන තේමාව යටතේ කර්මාන්ත අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව සංවිධානය කරන ලදී. ප්‍රදර්ශනය 2023 ජුනි 22 සිට 25 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

තේ අපනයන අංශය, වැවිලි අංශය, නිෂ්පාදන අංශය, ශිල්පීය තේ නිෂ්පාදන අංශය, කුඩා තේ වතු අංශය යනාදිය සමඟින් "කර්මාන්ත 2023" වෙළඳ ප්‍රදර්ශනයට සහභාගි වන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියැලෙන්නවුන්ට ආරාධනා කරනු ලැබිය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඇතුළුව ප්‍රදර්ශකයින් 16 දෙනෙකුට පහසුකම් සැලසීම සඳහා මණ්ඩප 02ක් (සෑම මණ්ඩපයක්ම කුටි 8කින් සමන්විත වේ) සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රදර්ශන කාලය තුළ සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා තේ කර්මාන්තය සහ සිලෝන් තේ පිළිබඳව ප්‍රදර්ශනය නරඹන්නන් දැනුවත් කිරීම සඳහා ආහාර පාන මණ්ඩපය (ශාලා අංක - ජේ) සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මණ්ඩපය යටතේ තමන්ගේම කුටි පවත්වාගෙන ගියේය. තවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රදර්ශන කුටියේ දී ප්‍රදර්ශන කාලය තුළ උණුසුම් තේ සහ අයිස් තේ පැන් සංග්‍රහයක් සිදු කරන ලදී. තවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මණ්ඩපය තුළ වෙනම කුටියක් පවත්වාගෙන ගිය අතර ප්‍රදර්ශන කාලසීමාව තුළ සිලෝන් තේ නියාමනය, පාලනය කිරීමේ කාර්යයන් සහ ප්‍රවර්ධනය පිළිබඳ තොරතුරු සපයන ලදී.



ජුනි 23 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවති කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ කාර්මික ප්‍රදර්ශනය නැරඹීමට විත නියෝජිතයින් දෙදෙනෙක් පැමිණියහ. නියෝජිතයින් ඔවුන්ගේ සංචාරය අතරතුරදී කර්මාන්ත හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු ආචාර්ය රමේෂ් පතිරණ මහතා ද හමුවිය.



- ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා සහ නවසීලන්ත ජාතික කාන්තා කණ්ඩායම් දෙකම සඳහා තේ සංග්‍රහයක් 2023 ජුලි 2 වන දින ගාලු කොටුවේ ''තේ අමාත්‍යාංශ'' පරිශ්‍රයේදී පවත්වන ලදී.



- සිලෝන් තේවල විවිධත්වය යන මැයෙන් Mystical Rose International ආයතනයේදී පවත්වන ලද සැසිය ප්‍රාදේශීය කාර්යාලය මගින් ගාල්ල වලහන්දුවේ හි පවත්වන ලද යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ අධ්‍යාපනික ප්‍රදර්ශනය.
- ප්‍රාදේශීය කාර්යාලය මගින් මහනුවර කුණ්ඩසාලේ දී පවත්වන ලද කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ අධ්‍යාපනික ප්‍රදර්ශනය.
- සිලෝන් තේ අනුග්‍රහය - ශ්‍රී දළදා පෙරහර
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය තම තේ අපනයනකරුවන්ගේ දෘශ්‍යතාව සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සමග සිය උපාය මාර්ගික සහයෝගිතාව වර්ධනය කර ඇත.
- බණ්ඩාරවෙල ඌව කලාපීය කෘෂිකාර්මික ප්‍රදර්ශනයේ දී තේ දැනුවත් කිරීමේ වැඩසටහන - ප්‍රාදේශීය තේ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.
- හිමිකම් හවුල්කාරිත්වය කොළඹ විශ්ව විද්‍යාලය.
- මහපොළ ප්‍රදර්ශනය තුළ සිලෝන් තේ භාවිතයට තැබීම.
- දොම්පේ ප්‍රාදේශීය සභා ප්‍රදර්ශනය තුළ සිලෝන් තේ භාවිතයට තැබීම.
- දෙසැම්බර් 28 සිට 30 දක්වා ගාල්ල, සමනල පිටියේ පැවති ''කර්මාන්ත 2023 - ගාලු සංස්කරණය'' සඳහා සිලෝන් තේ ලබා දීම.




## 2.3.16. රට අභ්‍යන්තරයේ වූ ප්‍රවර්ධන ව්‍යාපාර (අනෙකුත් ජාතික ආයතන සමග එකාබද්ධ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම- SLTPB, EDB, ශ්‍රී ලංකා එයාර් ලයින්)

- 2023 වැලන්ටයින් දිනයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දී සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- එයාර් චයිනා හට සිලෝන් තේ ලබා දී පිළිගැනීම්
  එයාර් චයිනා 2023 ජුලි 03 වන දින සිට සතියකට ගුවන් ගමන් 3 බැගින් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ චෙන්ග්ඩු ටියැන්ෆු ජාත්‍යන්තර ගුවන් තොටුපළ අතර සේවා යළි ස්ථාපිත කරන ලදී.
- මගින් සඳහා සිලෝන් තේ තෑගි වශයෙන් ලබා දීම.
  සීබර්න් එන්කෝර් (Seabourn Encore), අධි සුඛෝපභෝගී නෞකාව 2023 මාර්තු 27 වන දින මගින් 500+ සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් 350+ රැගෙන කොළඹ වරායට සේන්දු විය. ඔවුන්ගේ කෙටි සංචාරය වෙරළාශ්‍රිත සංදර්ශනයකින් යුත් සාම්ප්‍රදායික නැටුම් ප්‍රසංගයකින් සමන්විත වූ අතර සිලෝන් තේ තෑගි වශයෙන් ඔවුන් සඳහා ලබා දුන් අතර පසුව කොළඹ නගරයේ බස් චාරිකාවක් ද සිදු කරන ලදී.



- ප්‍රින්සස් කෘස් නෞකාව වෙත සිලෝන් තේ පිරිනැමීම
  ප්‍රින්සස් කෘස් නෞකාවේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කාර්ය මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන තොරතුරු කවුළුව මගින් 1900ක් සමග කොළඹ වරායට සේන්දු විය.



- සුඛෝපභෝගී සංචාරක නෞකාවක් වන 'MS Amera' 2023 ජනවාරි 12 වන දින කොළඹ වරායට පැමිණි අතර, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිලෝන් තේ තෑගි වශයෙන් බෙදා දෙන ලදී.



- මත්තල ගුවන්තොටුපළේ සිලෝන් තේ ප්‍රවර්ධනය



- BIA අවුරුදු උත්සවයට සහභාගි වීම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලට පැමිණෙන සංචාරකයින්ට සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දට අදාළ සාම්ප්‍රදායික අවුරුදු රසකැවිලි සමග සිලෝන් තේ රසය අත්විඳීම සඳහා කුඩා උත්සවයක් සංවිධානය කරන ලදී.



- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ''කොරල් ප්‍රින්සස්'' නමැති ප්‍රමුඛ පෙළේ විශාල මගී නෞකාවේ මගීන්ට සිලෝන් තේ තෑගි කරනු ලැබිය. එය මගීන් 2200 ක් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් 800 ක් රැගෙන 2023 ජුනි 20 වන දින කොළඹ වරායට සේන්දු විය.



- ඔක්තෝබර් 2022, මොස්කව් සිට සෘජු ගුවන් ගමන් (Aeroflot, Azur Air සහ Red wings) හරහා ශ්‍රී ලංකාවට රුසියානු සංචාරකයින් 100,000ක් පැමිණීම සැමරීම නිමිත්තෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල වෙත පැමිණි Aeroflot ගුවන් මගීන් සඳහා සිලෝන් තේ ඇසුරුම් ත්‍යාග වශයෙන් ලබා දෙනු ලැබිය.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලේ දී සිලෝන් තේ තෑගි ඇසුරුමක් ලබා දී එයාර් ඇරබියා මගින්ව පිළිගනු ලැබිය.
- සමගාමීව, ආරුගම්බේ සංචාරකයින්ට සිලෝන් තේ තෑගි වශයෙන් ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකාවේ ලෝක සංචාරක දිනය සැමරීම
  සිලෝන් තේ කෝප්පයක් පිළිගැන්වීමෙන් හද උණුසුම් කරවන අත්දැකීමක් නිර්මාණය වූ අතර බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණි සංචාරකයින් සඳහා ත්‍යාග වශයෙන් සිලෝන් තේ ලබා දෙන ලදී.
- ප්‍රථම වරට එස්තෝනියාව සහ ශ්‍රී ලංකාව අතර සෘජු ගුවන් ගමන් අරඹමින් SkyUp ගුවන් සේවයට අයත් U5-9394 ගුවන් යානය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත ළඟා වූ ගුවන් මගීන්ට සිලෝන් තේ පිළිගැන්වීම.

## 2.3.17.තේ කෞතුකාගාරය

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් තේ කෞතුකාගාරය හොඳම සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවලින් එකක් වශයෙන් නම් කර ඇත.

- තුර්කියේ තානාපති Demet Sekercioglu මහත්මිය විසින් 2023 මාර්තු මාසයේදී සිලෝන් තේ කෞතුකාගාරය නැරඹන ලදී.



- දෙරට අතර තේ සංස්කෘතිය සහ තේ ආශ්‍රිත සිදුවීම් ප්‍රවර්ධනය කිරීම සහ සැමරීම සඳහා සිලෝන් තේ කෞතුකාගාරය සහ චීන සංස්කෘතික මධ්‍යස්ථානය අතර සහයෝගිතාව වර්ධනය කිරීම උදෙසා චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ නියෝජිතයින්ගේ සංචාරය.
- USAID හි දුත මණ්ඩල අධ්‍යක්ෂ සහ කණ්ඩායම සිලෝන් තේ කෞතුකාගාරයට පැමිණීම.
- සිලෝන් තේ කෞතුකාගාරය විසින් 2023 මැයි 21 ජාත්‍යන්තර තේ දිනය සැමරීම.
  තිරසාර තේ නිෂ්පාදනයට සහ පරිභෝජනයට හිතකර ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සාමූහික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම මෙන්ම වතු ප්‍රජාවන්ගේ ජීවිත වැඩි දියුණු කිරීම උදෙසා දැනුවත් කිරීමේ දිනය.

- සිලෝන් තේ කෞතුකාගාරය විසින් තේ කර්මාන්තයේ සැබෑ විරයින් සමග නරඹන්නන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වමින් මෙම සුවිශේෂී දිනය සමරනු ලැබිය.




## 2.3.18.වතු කම්කරු ප්‍රජා සංවර්ධනය සහ ස්වභාවික ආපදා සහනාධාර

- මියන්මාරයේ සුළි කුණාටුවෙන් විපතට පත් වූ ජනයාට මානුෂීය ආධාර යටතේ ශ්‍රී ලංකා රජය විසින් මියන්මාරයට සිලෝන් තේ පරිත්‍යාග කරන ලදී.

- සිලෝන් තේ අපනයනකරුවන්ගේ සහයෝගය සහිතව ශ්‍රී ලංකා රජයවිසින් 2023 පෙබරවාරි 10 වන දින තුර්කියේ සිදුවූ විනාශකාරී භූමිකම්පාවෙන් විපතට පත් වූවන්ට ලබා දීම සඳහා කොළඹ සිටින තුර්කියේ තානාපති වෙත සිලෝන් තේ තොගයක් පරිත්‍යාග කරන ලදී.



## 2.3.19. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අලෙවිසැල

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තේ මණ්ඩල තේ අලෙවි මධ්‍යස්ථානය මගින් දේශීය මෙන්ම විදේශීය පාරිභෝගිකයන්ගේ විවිධ තේ රස අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ රසයෙන් යුත් තේ පැකට් අලෙවි කරනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේම ලේබල් සන්නාමයට අමතරව පුද්ගලික අංශයේ සිලෝන් අපනයන සමාගම් 24ක් නියෝජනය කරමින් විවිධ තේ පැකට් වර්ග 1250කට අධික ප්‍රමාණයක් තෝරා ගැනීමට පාරිභෝගිකයාට හැකියාව ඇත.

පුද්ගලික අංශයේ තේ සන්නාම සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන රැසක් ඇතුළත් රුපියල් මිලියන 143.6 ක කැපී පෙනෙන පිරිවැටුමක් 2023 දී අත්කර ගන්නා ලදී. විකුණුම් කවුන්ටරය මගින් ‘‘සිංහ ලාංඡනය’’ සන්නාමය සහිත තේ ප්‍රවර්ධනය කරන අතර සිලෝන් තේ පිළිබඳ තොරතුරු සියලුම පාරිභෝගිකයින් වෙත බෙදා හරිනු ලැබේ.

## 2.3.20.විදේශ දූත මණ්ඩල සඳහා ප්‍රවර්ධන අරමුණු සහිතව තේ බෙදා හැරීම

‘සිලෝන් තේ’ ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහත අවස්ථාවන්හි දී නොමිලේ තේ නිකුත් කරන ලදී.

I. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා නොමිලේ තේ ලබා දීම.
විදේශීය දූත මණ්ඩල සඳහා තිලිණ වශයෙන් තේ නිකුත් කිරීම සඳහා මූල්‍ය අංශය වෙත ඉල්ලීම් 40ක් ඉදිරිපත් කරන ලදී.

II. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවල තේ පැන් සංග්‍රහ පැවැත්වීම හා බෙදා හැරීම.

III.ප්‍රවර්ධන අරමුණ සහිතව ප්‍රභූවරුන්ට / නිලධාරීන්ට තේ ලබා දීම.

# 2.4.තේ රස බැලීමේ ඒකකය

සිලෝන් තේවල තත්ත්ව සහතික කරන ප්‍රධාන ආයතනයක් වශයෙන් මෙම අංශය කටයුතු කරයි. වෙන්දේසි කිරීමට හා අපනයනයට පෙර තේවල ගුණාත්මක බව පිළිබඳ තක්සේරු කිරීම මෙහි වගකීම වේ. විවිධ තේ ප්‍රභේදවල තත්වය ඇගයීමට ලක් කිරීම සඳහා තේ රස බලන්නන් විසින් තේවල රසය, සුවඳ, පෙනුම හා දිවට දැනෙන හැඟීම ආදීය පිළිබඳ තක්සේරුවක් ගැනීමට ගුණාත්මක විශ්ලේශයක් සිදු කරනු ලබයි. එය භෞතික දැනෙන ආකාරය මත ලබා ගන්නා අවබෝධය හා අත්දැකීම මත පදනම් වූ කුසලතා පුර්ණ ක්‍රියාවලියකි. තේ රස බලන්නන් විවිධ තේවල සියුම් රසයන් සහ ගුණාංග හඳුනාගැනීමේ විශේෂඥතාව සහිත පිරිසක් වශයෙන් ප්‍රසිද්ධ වී ඇති අතර, තේ සම්බන්ධයෙන් කාර්යක්ෂම සහ වෘත්තීය තීරණ ඔවුන් විසින් ගනු ලැබේ. අසතුටුදායක මට්ටමක පවතින නියැදි විශ්ලේෂණ විද්‍යාගාරය වෙත වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා යවනු ලබයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රස පරීක්ෂා කිරීමේ කණ්ඩායම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තේ රස පරීක්ෂා කරන්නන්ගෙන් යුත් විශේෂඥ මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් සියලුම පාර්ශව නියෝජනය කරමින්. එනම්, ලංකා තේ වෙළෙඳුන්ගේ සංගමය CTTA, ලංකා බ්‍රෝකර්වරුන්ගේ සංගමය CBA, ලංකා වැවිලි සංගමය, CPA, කුඩා තේ හිමියන්ගේ සංවර්ධන සමිති පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලනය SLFTSHDS තේ අපනයනකරුවන්ගේ සංගමය TEA, ශ්‍රී ලංකා තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය SLTFOA වැනි ආයතනයන් සහ ස්වාධීන සාමාජික මඩුල්ලකින් ද මෙම කණ්ඩායම සමන්විත වේ.

මෙම අංශයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි ලැයිස්තු ගත කළ හැක.

- තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය සහ ISO ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- පුද්ගලික විකුණුම්, සෘජු විකුණුම් හා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා අනුමත කිරීම.
- සන්නාම සහිත නිෂ්පාදන සහ පරිභෝජන ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම.
- නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම.
- ආනයනය කළ තේ නියැදි ඇගයීමට ලක් කිරීම.

## 2.4.1. තේ රස බැලීමේ සංකල්පය හා ක්‍රමවේදය

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවේදක පරීක්ෂණවලදී තේ පිළියෙල කිරීම පිළිබඳ ISO 3103 පිළිගනු ලබයි.

- ශ්‍රී ලංකාවේ තේ රස බැලීම සම්බන්ධයෙන් කළු තේ සඳහා ISO 6078 පාරිභාෂිත වචන මාලාව / ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 - ලංකාවේ තේ නිෂ්පාදනය.

තේ පිළිබඳ විශේෂඥ මණ්ඩලයක සහභාගිත්වයෙන් ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්හි දී සතියකට දෙවරක් සාමාන්‍ය තේ රස බැලීමේ සැසි පවත්වනු ලැබේ. මෙම සැසි අතරවාරයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශයට මගින් ලබාදෙන සහ තේ රස බැලීමේ අංශයට සෘජුව ලැබෙන පහත තේ නියැදි ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

(අ) පූර්ව වෙන්දේසි තේ
(ආ) විශේෂ විමර්ශන තේ
(ඇ) පූර්ව ආනයන නියැදි
(ඈ) සෘජු විකුණුම්
(ඉ) දෛනික ඇගයීමට ලක්කරන බෙදාහැරීමට පෙර කරනු ලබන අධීක්ෂණය නියැදි පිළිබඳ මණ්ඩලයේ තීරණය වැඩි දුර නියාමනය සඳහා තේ කොමසාරිස් අංශයටත්, තේ අපනයන ඒකකයටත් යවනු ලැබේ.
(ඊ) පුද්ගලික විකුණුම් නියැදි
(උ) කොන්ත්‍රාත් නියැදි

වගුව 2.4.1: පරීක්ෂා කරන ලද හා සැක සහිත නියැදි පිළිබඳ විස්තර

| විස්තරය | පරීක්ෂාවට ලක් කළ නියැදි සංඛ්‍යාව | සැකයට බඳුන් කරන ලද නියැදි සංඛ්‍යාව |
|---|---|---|
| දෘශ්‍ය පරීක්ෂණ | 236,822 | |
| පූර්ව වෙන්දේසි නියැදි | | |
| අහඹු ඇගයීම | 3,783 | 392 |
| දියර වර්ග මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වී ඇතැයි යන සැකය හේතුවෙන් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම | | 223 |
| සිලිකාමය කරුණු | | 828 |
| අමු කෙඳි | | 1,391 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### (අ) පූර්ව වෙන්දේසි තේ

විකිණීමට සති දෙකකට පෙර තැරැව්කරුවන් අටදෙනෙකු ඔවුන්ගේ තේ නියැදි වෙන්දේසියට පෙර ඇගයීම සඳහා එවනු ලැබේ. පළමු පියවර ලෙස ඉහළ සහ මධ්‍යම, හොඳින් මල් සහිත, අඩු වැඩුණු පත්‍ර, අඩු වැඩුණු අර්ධ-පත්‍ර, අඩු වැඩුණු කිනිති සහිත/ තත්වයෙන් පහල කුඩා සහ උප වර්ග, කුඩු සහ BOBIA නියැදීන් හඳුනාගැනීම සඳහා දෘශ්‍ය ඇගයීම සිදු කරනු ලැබේ. අහඹු තෝරාගැනීම මත පදනම්ව, තැරැව්කරුවන්ගේ තේ නියැදි තෝරා ගෙන කාබනික ඇගයුම සිදු කරනු ලැබේ. ඇගයීමෙන් පසු තෝරාගත් සාම්පල ඉදිරි වෙන්දේසියේදී ඉදිරිපත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සාමූහික තීරණයක් ගැනීමට මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. තීරණය අපනයන අංශයේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙත දැනුම් දෙනු ලැබේ.

### (ආ) බෙදා හැරීමට පෙර තේ

කළු තේ සඳහා සිංහ ලාංඡනය, ISO 3720 හෝ හරිත තේ සඳහා ISO 11287 පරාමිතීන් භාවිතය හෝ වෙනත් අපවිත්‍රතාවයක් තේ තොගය බෙදා හැරීමට පෙර කරනු ලබන පරීක්ෂාව යටතේ පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම පූර්ව බෙදාහැරීමේ නියාමන ක්‍රමය යටතේ 2023 වර්ෂය තුලදී නියැදි 104,82ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

### (ඇ) පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන තේ

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය හරහා ලැබෙන පූර්ව ආනයන නියැදි සමග අපනයනය සඳහා එහි වූ යෝග්‍යතාවය ඇගයීමට ලක්කිරීම සඳහා ආකෘතියක්ද අඩංගු කර ඇත. සම්භවය, ශ්‍රේණිය සහ අදාල අනෙකුත් තොරතුරු ආදී වශයෙන් සෑම ඉල්ලුම් පත්‍රයකම අදාළ නියැදිය පිළිබඳ විස්තර ඇතුලත්ය. තේ රස බැලීමේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චක්‍රලේඛ අංක OR/1/65 සහ එහි සංශෝධනයන්හි මාර්ගෝපදේශ අනුව තේ නියැදි ඇගයීමට ලක් කරනු ලබයි. 2023 වසර සඳහා තේ රස බැලීමේ අංශය විසින් නියැදි 1,509 ක් පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන වශයෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.

## 2.4.2. පුද්ගලික විකුණුම් අනුමත කිරීම සහ මණ්ඩල තක්සේරු සහතිකය

### අ) පුද්ගලික විකුණුම් අනුමත කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය සමග විකුණුම් තැරැව්කරුවන් විසින් මණ්ඩලය මගින් ලැබෙන තේ නියැදි තේ රසය පිළිබඳ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙහිදී නියමිත සේවා ගාස්තු අදාළවන අතර අනුමත කිරීමේ ගාස්තු වශයෙන් එක් තේ වර්ගයක් සඳහා රුපියල් 500ක් [+ අගය මත එකතු කළ බද්ද (VAT)] අය කරනු ලැබේ. වර්තමානයේදී, ඉහත යෝජනා ක්‍රමය කොළඹ වෙන්දේසි හරහා විකුණනු නොලබන හරිත තේ, කාබනික තේ, විශේෂිත තේ සහ කුඩා පරිමාණයේ ශේණි සඳහා පමණක් සීමා කර ඇත. සමස්ථයක් ලෙස 12,245ක පුද්ගලික විකුණුම් කොටස් ප්‍රමාණයක් 2023 වර්ෂය සඳහා පරීක්ෂා කර අනුමත කරන ලදී.

### ආ) ඉදිරි කොන්ත්‍රාත්තු සහතික කිරීම

ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව තෝරාගත් ලකුණු කිහිපයක් යම් කාල වකවානුවක් සඳහා අනුමත කිරීම සිදු කරන ලදී. විකුණුම්කරු, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විසින් විකිණීමේ කොන්ත්‍රාත්තුව අනුමත කිරීම සිදු කරන ලදී. රු.500ක අනුමත කිරීමේ ගාස්තුවක් [ + අගය මත එකතු කළ බද්ද (VAT)] ඉහත සේවාව සඳහා ද අය කරන ලදී. වර්ෂය තුළ ඉදිරි කොන්ත්‍රාත්තු 2298ක් අනුමත කරන ලදී.

### ඇ) සෘජු විකිණීම අනුමත කිරීම

තම නිෂ්පාදන සෘජුවම විදේශීය ගැනුම්කරුවන්ට විකිණීම සඳහා ඉහත යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදකයාට සහ අපනයනකරුවාට අවසර දෙනු ලබයි. හරිත තේ හැර, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට හැකි විය. සඳුදා දිනයන්හි රැස්වන මණ්ඩලය මගින් සෘජු විකුණුම් අනුමත කරන ලදී. එමෙන්ම, සලකා බලන ලද වර්ෂය සඳහා විකුණුම් තොග 640ක් අනුමත කරන ලද අතර අනුමත කළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 0.768 කි.

## 2.4.3. සිංහ ලාංඡනය සඳහා ලියාපදිංචි වීම

ගුණාත්මකබව සහ ආරම්භක රට පිළිබඳ සංකේතයක් වන සිංහ ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වන අතර සන්නාමගත පාරිභෝගික ඇසුරුම්වල සිංහ ලාංඡනය නිරූපණය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එහිදී ගමනාන්තය සහ වෙළඳපොළ අනුව සන්නාමගත නිෂ්පාදන ඇගයීමට ලක් කරනු ලැබේ. වෙළඳ නාම සඳහා සිංහ ලාංඡන සහතිකයකය වලංගුවන කාලය වසර තුනකි. සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය භාවිත කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවසරය ලබා දෙනු ලබයි. 2023 වසරේදී නව වෙළඳ නාම, අළුත් කිරීම් සහ අමතර ඇසුරුම් සඳහා අයදුම්පත් 504ක් පිළිබඳ කටයුතු කරන ලදී.

ගුණාත්මකබව හා කීර්ති නාමය පවත්වා ගැනීම උදෙසා මෙන්ම ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය වංචනික ලෙස භාවිත කිරීමේ අවස්ථා හඳුනාගැනීම සඳහා විදේශීය වෙළඳපොළවල සහ දේශීය වෙළඳපොළවල සිංහ ලාංඡනය භාවිතය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලින් සිදු කරනු ලැබේ. පූර්ව බෙදාහැරීමේ අධීක්ෂණය අතරවාරයේදී, සිංහ ලාංඡනය සහිත බෙදාහැරීමේ බඩු තොග 80%කට අධික ප්‍රමාණයක් අහඹු නියැදි පදනම මත ඇගයීමට ලක් කෙරේ. ඊට අමතරව, විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ උපදේශකයින් වෙත විදේශීය වෙළඳපොලවල තිබෙන සිංහ ලාංඡනය සහිත ඇසුරුම් ඇගයීම සහ වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දේශීය වෙළඳපොල තුළ සිංහ ලාංඡනය භාවිත කරන වෙළඳ නාම ද අහඹු ලෙස තෝරා ගැනීමෙන් ඇගයීමට ලක් කෙරේ. ප්‍රධාන වශයෙන්, තේ මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින හා සැලකිය යුතු වෙළඳපල කොටසක් හිමි කිර්තිමත් හා දිගුකාලීන ඇසුරුම්කරුවන්ට සිංහ ලාංඡනය භාවිත කිරීමට අවසර ලබා දී ඒ අනුව අධීක්ෂණය කරනු ලැබේ.

# 2.5. විශ්ලේෂණ විද්‍යාගාරය

2023 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරයට තවත් සාර්ථක වසරක් විය. රසායන, ක්ෂුද්‍ර ජීව විද්‍යා සහ පළිබෝධනාශක විද්‍යාගාරය යන රසායනාගාර තුනම මගින් ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා සිය උපරිම දායකත්වය ලබා දෙන ලදී.

පළිබෝධනාශක අවශේෂල ක්ෂුද්‍ර ජීව විද්‍යා සහ රසායන විශ්ලේෂණ සඳහා පර්යේෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් ISO 17025: 2017 ප්‍රතිතනය ලබා ගැනීම කැපී පෙනෙන වැදගත් ජයග්‍රහණයක් විය. ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් 2023 වසරේ ජුනි මාසයේ දී සිදු කරන ලද විගණනයට පසු මෙම ප්‍රතිතනය ලබා ගන්නා ලද අතර එය විද්‍යාගාරය ලද වැදගත් ජයග්‍රහණයකි.

සිංහ ලාංඡනය සහතික කිරීමේ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රසායනාගාරය සිංහ ලාංඡනය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ නිර්ණායක විශ්ලේෂණය කරමින් 2022 හා 2023 වර්ෂ තුළ දී ප්‍රවර්ධන අංශය සමඟ එක්ව සිංහ ලාංඡනය භාවිතය සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට දායක විය. ජපානය වෙත අපනයන කෙරෙහි අවධානය යොමු කරමින්, MCPA, 2-4D, Hexaconazole සඳහා විශ්ලේෂණ ක්‍රමවේද හඳුන්වා දීමට රසායනාගාරයට හැකි විය. එමෙන්ම, ආනයනික තේ සම්බන්ධයෙන් අදාළ පළිබෝධනාශක වන Acephate, Dimethoate, Methidathion, Triazophos, Fipronil, Quinalphos, Propiconazole සහ Profenofos අඛණ්ඩ පර්යේෂණවලට ලක් කරමින් තේ කර්මාන්තයට හඳුන්වා දී ඇත.

වගුව 2.5.1 : විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරන ලද පරීක්ෂණවල සාරාංශය

| පරීක්ෂණයේ නම | පරීක්ෂණ ගණන | |
|---|---|---|
| | 2022 | 2023 |
| **රසායනික විශ්ලේෂණ ඒකකය** | | |
| තේ වල තෙතමනය නිර්ණය කිරීම | 649 | 327 |
| තේ වල අඩංගු සමස්ථ අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 684 | 175 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 673 | 174 |
| තේ වල අඩංගු ද්‍රාව්‍ය අළුවල ඇති අම්ල ප්‍රමාණය නිර්ණය කිරීම | 590 | 174 |
| තේ වල අඩංගු ජලසාරය නිර්ණය කිරීම | 103 | 176 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළුවල ක්ෂාරීයතාව නිර්ණය කිරීම | 643 | 176 |
| තේ වල ඇති අමු කෙඳි ප්‍රමාණය නිර්ණය කිරීම | 339 | 190 |
| මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ | 259 | 242 |
| ශ්‍රේණිය හඳුනා ගැනීමේ පරීක්ෂණ / පෙරන විශ්ලේෂණය | 323 | 41 |
| සිංහ ලාංඡන පරීක්ෂණය | - | 607 |
| **ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය** | | |
| සමස්ථ පට්ටක ගණන නිරණය කිරීම | 750 | 198 |
| යීස්ට් සහ පූස් ප්‍රමාණය නිරණය කිරීම | 757 | 204 |
| තේවල ඇති මැරුණු හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපද්‍රව්‍ය / භාහිර ද්‍රව්‍ය පිළිබඳ අන්වීක්ෂීය පරීක්ෂණය | 487 | 37 |
| තේවල අඩංගු ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMO) නිර්ණය කිරීම | 142 | 113 |
| මළ කොලිෆෝම් සහ එස්චරීචියා කොලි (E.coli) හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 592 | 198 |
| සම්පූර්ණ කොලිෆෝම් හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 598 | 198 |
| සිංහ ලාංඡන පරීක්ෂණය | - | 481 |
| **පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය** | | |
| HPLC RI අනාවරකය භාවිත කරමින් සීනි පිළිබඳ විශ්ලේෂණය | **5205** | **5430** |
| LCMS/MS භාවිතයෙන් ඔයුරෝන් විශ්ලේෂණය | 157 | 354 |
| LCMS/MS භාවිතයෙන් MCPA විශ්ලේෂණය | 175 | 354 |
| LCMS/MS භාවිතයෙන් 2,4 D අපද්‍රව්‍ය විශ්ලේෂණය | 140 | 354 |
| LCMS/MS භාවිතයෙන් Hexaconazole අපද්‍රව්‍ය විශ්ලේෂණය | 269 | 354 |
| LCMS/MS භාවිතයෙන් බහු අපද්‍රව්‍ය විශ්ලේෂණය (Acephate, Imidacloprid, Dimethoate, Methidathion, Triazophos, Fipronil, Quinalphos, Propiconazole & Profenofos) | 1386 | 3906 |
| **එකතුව** | **14921** | **14463** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.5.1. තේ කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා මැදිහත්වීම

පරීක්ෂණ 14,463 ක් සිදු කිරීම සඳහා විශ්ලේෂණ විද්‍යාගාරය වෙතින් ඉල්ලීම් කර ඇති අතර, අවම ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි 1078 ක් හඳුනාගෙන ඇත.

වගුව 2.5.2: ISO ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි ප්‍රමාණය

| විශ්ලේෂණ ඒකකය | අවම තත්ව ප්‍රමිතියට වඩා පහල තේ නියැදි සංඛ්‍යාව |
|---|---|
| ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක | 650 |
| රසායනික | 390 |
| පළිබෝධ නාශක අපද්‍රව්‍ය | 38 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.5.2. පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

2023 වර්ෂය තුළ දී, සිනි (5430), ක්ෂුද්‍ර විද්‍යා පලිබෝධ විශ්ලේෂණ (354), ඩියුරෝන් (354), 2-4D(354),හෙක්සකොනසොල් (354) සහ අපනයන (3906) පිළිබඳ ඉල්ලීම් විශ්ලේෂණය කර ඇති අතර සිදු කළ සමස්ථ සීනි පරීක්ෂණ සංඛ්‍යාවෙන් 38ක ප්‍රතිඵල මගින් අවම ප්‍රමිතියට වඩා අඩුවෙන් පවතින තේ නියැදි හඳුනා ගන්නා ලදී. ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය මගින් 2023 දී සිදු කළ අවසන් විගණනය පරිදි පලිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය විසින් ජාත්‍යන්තරව පිළිගත් පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම හා තේ කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා ISO 17025: 2017 ප්‍රතිතනය ලබා ගැනීම කැපී පෙනෙන වැදගත් ජයග්‍රහණයක් විය. එපමණක් නොව ප්‍රතිතනය ලබා ගැනීමෙන්, වසර තුළ සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාවද වැඩි කරන ලදී.

වගුව 2.5.3: අවම ප්‍රමිතියට අඩුවෙන් ඇති තේ නියැදි හඳුනා ගන්නා ලද පරීක්ෂණ ගණන

| පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට පහල |
|---|---|
| ෆ්‍රක්ටෝස් | 3 |
| ග්ලූකෝස් | 7 |
| සුක්‍රෝස් | 28 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.5.3. ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

වර්ෂය තුළ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ 1429 ක් සිදු කරන ලදී. ඒවායින්, ක්ෂුද්‍ර ජීව පරීක්ෂණ 650 ක් මගින් අපේක්ෂිත ප්‍රමිතියට අඩුවෙන් පවතින හෝ පරිභෝජනයට සුදුසු නොවන තේ හඳුනා ගන්නා ලදී. මෙම නියැදි අභ්‍යන්තර සහතික කරන සේවාව හා සිංහ ලාංඡන සහතිකකරණය මගින් ලබා ගන්නා ලදී.

වගුව 2.5.4: ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

| ක්ෂුද්‍ර විද්‍යා පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට/උපදෙස් මාලාවට පහල |
|---|---|
| සමස්ථ පට්ටක ගණන | 191 |
| යීස්ට් සහ පුස් ප්‍රමාණය | 266 |
| කොලිෆෝම් | 191 |
| ඊකොලි | 2 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.5.4.රසායනික විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

රසායනික විශ්ලේෂණ ඒකකය මගින් පරීක්ෂණ 2282ක් සිදු කරන ලද අතර එයින් නියැදි 390ක් ප්‍රමිතියට පහලින් ඇති බවට හඳුනා ගන්නා ලදී. එම නියැදි අභ්‍යන්තර නියාමන සේවාව හරහා ලබා ගන්නා ලදී.

වගුව 2.5.5: රසායනික විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

| රසායනික පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල |
|---|---|
| අමු කෙඳි ප්‍රමාණය | 72 |
| ක්ෂාරීයතා ප්‍රමාණය | 13 |
| තෙතමනය | 297 |
| ජලයේ ද්‍රාව්‍ය නොවන අළු | 1 |
| සමස්ථ අළු ප්‍රමාණය | 4 |
| ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය | 3 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.5.5. තත්ව පරීක්ෂණ ඒකකයේ කාර්ය සාධනය

ISO/IEC 17025 රසායනාගාර ප්‍රමිතියට අනුව ලේකන පාලන පටිපාටි පවත්වා ගනිමින් අභ්‍යන්තර නියාමන හා බාහිර සහතික කිරීමේ සේවාවන් යන දෙකම සඳහා අදාළ විශ්ලේෂණ ඒකකය වෙතට ලැබෙන, ලියාපදිංචි වන හා පැවරෙන නියැදි මෙම ඒකකය මගින් කළමනාකරණ කරනු ලැබේ. තේ කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය තේ කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම පරිදිල 2023 වසර තුළ, නැවත නියැදි කිරීම වෙනුවෙන් තේ නියැදි 13ක් සඳහා මෙම ඒකකය සහාය ලබා දී ඇත.

# 2.6. පාලන අංශය

සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම පරිපාලන අංශයේ වගකීම් වේ. එමෙන්ම, නෛතික කටයුතු කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුස්තකාලය කළමනාකරණය සහ නඩත්තු කිරීම, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරිපාලන අංශයේ වගකීම් වේ.

වගුව 2.6.1: 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය

| වර්ගය | කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ජේෂ්ඨ මට්ටම | 02 | 02 | 04 (1.6%) |
| තෘතියික මට්ටම | 33 | 20 | 53(21.2%) |
| ද්විතියික මට්ටම | 49 | 90 | 139(55.6%) |
| ප්‍රාථමික මට්ටම | 51 | 3 | 54(21.6 %) |
| **එකතුව** | **135(54%)** | **115 (46%)** | **250(100%)** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වගුව 2.6.2: 2023 වසර සඳහා මානව සම්පත් පිරිවැටුම

| විස්තරය | කාර්යමණ්ඩල සාමාජික සංඛ්‍යාව |
|---|---|
| ඉල්ලා අස්වීම් | 07 |
| විශ්‍රාම ගැනීම් | 10 |
| සේවය අවසන් වීම් | 00 |
| තනතුර හැර යාම් | 01 |
| **එකතුව** | **18** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වගුව 2.6.3: මානව සම්පත් සංවර්ධනය දේශීය පුහුණු (පුද්ගල)

| වර්ගය | පුහුණු වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| ජේෂ්ඨ මට්ටම | 02 |
| තෘතියික මට්ටම | 04 |
| ද්විතියික මට්ටම | 20 |
| ප්‍රාථමික මට්ටම | 00 |
| **එකතුව** | **26** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.6.1.අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

2023 වසර තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ඇත. විධායක කාර්ය මණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය තාක්ෂණික වශයෙන් බලගැන්වීම හා අභියෝගාත්මක පරිසරයක් රටේ පවතින වාතාවරණය තුළ කාර්යක්ෂම මෙන්ම ඵලදායී සේවයක් තේ කර්මාන්තයට ලබා දීම මෙහි අරමුණ විය.

## 2.6.2. දේශීය සංවර්ධන අවස්ථා - අධ්‍යයන කටයුතු (පුද්ගල)

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුහුණු ප්‍රතිපත්තිය අනුව, අදාළ විෂය ක්ෂේත්‍රය තුළ උපාධිය සම්පූර්ණ කළ එක් නිලධාරියෙක් සඳහා රුපියල් 150000ක මුදලක් ගෙවන ලදී.

වගුව 2.6.4: දේශීය පුහුණු වැඩසටහන් (පුද්ගල)

| වර්ගය | පුහුණු වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| ජේෂ්ඨ මට්ටම | 00 |
| තෘතියික මට්ටම | 01 |
| ද්විතියික මට්ටම | 04 |
| ප්‍රාථමික මට්ටම | 00 |
| **එකතුව** | **05** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද දෙදින පුහුණු වැඩමුළුව, කැරොලිනා බීච් හොටෙල් - මීගමුව













කළමණාකරණ සහකාර නිලධාරීන් සඳහා, කැරොලිනා බීච් හොටෙල් - මීගමුව






## 2.7.අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණන අංශයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා රජයේ තේ කම්හල් හිමියන්, තේ වතු හිමියන්, තේ අංශයේ සේවකයන් සහ මහජනතාව වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා එහි මූල්‍ය, පරිපාලන සහ මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම උදෙසා අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමයි. 2023 වසර පුරාවට කාර්යක්ෂමතාව, නිරවද්‍යබව හා අනුකූලතාවය වර්ධනය කරමින් විගණන අංශය විසින් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබේ.

අභියෝග හමුවේ වුවද, තාක්ෂණය භාවිතය, දක්ෂතා වර්ධනය සහ ක්‍රියාශීලි අවදානම් කළමනාකරණය තුළින් තම හැකියාවන් වැඩිදියුණු කිරීමට මෙම අංශය කැපවී කටයුතු කරයි. ඉදිරියටම ගමන් කරමින්, මෙම ජයග්‍රහණ මත සාර්ථකව කටයුතු කරමින් ආයතනික අරමුණු සහ සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා අංශයේ දායකත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට සාමූහික උත්සාහයෙන් කටයුතු කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව තුන් වතාවක් රැස් වූ අතර අවශ්‍යතා පදනම මත කරන ලද ආරාධනයෙන් අදාළ අංශ ප්‍රධානීන් / නිලධාරීන් කමිටුවේ රැස්වීම්වලට සහභාගි විය. සුදුසු නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා වාර්තා සහ පසු විපරම්ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

## 2.8. තොරතුරු තාක්ෂණ ඒකකය

පරිශීලකයින් සඳහා වඩාත් නවීන ආකාරයෙන් තොරතුරු තාක්ෂණ වේදිකා වැඩිදියුණු කිරීම මෙන්ම නියාමන සහ සංවර්ධන විෂය කෙරෙහි අවධානය යොමු කරන මෘදුකාංග සංවර්ධන කටයුතුවල නියැලෙමින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි තොරතුරු තාක්ෂණ හා සම්බන්ධ සියලුම ගැටලු සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සහාය ලබා දෙන ලදී. ප්‍රධාන වශයෙන් වසර තුළ, එක් එක් අංශයට අවශ්‍ය පරිගණක, ලැප්ටොප් සහ මුද්‍රණ යන්ත්‍ර ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ආයතනයට වඩාත් කාර්යක්ෂම හා ලාභදායී යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට තොරතුරු තාක්ෂණ අංශය මගින් තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

අපනයන ඒකකය සහ රසායනාගාරය සඳහා පවතින තේ පද්ධතියේ මොඩියුල සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

• CUSDEC/Blend Sheet Reconciliation
මෙම මොඩියුලය අපනයන ඒකකය සඳහා ඉදිරිපත් කරන ලද ලේඛනවල සත්‍ය අපනයන සහ ආනයන අතර ගැටළු විසඳීම සඳහා හඳුන්වා දී ඇති අතර සංවර්ධිත මොඩියුලය මගින් සියලු තේ ප්‍රමාණයන් තුලනය කරමින් සැසඳුම් සිදු කරයි.

• විශ්ලේෂණ රසායනාගාරයේ තොරතුරු තාක්ෂණ පද්ධතියට මීට පෙර අතින් සිදු කරන ලද සීනි සාම්පල පරීක්ෂා කිරීම විධිමත් කිරීමේ අරමුණින් නව මෘදුකාංග මොඩියුලයක් හඳුන්වා දෙන ලදී.

අනෙකුත් ක්‍රියාකාරකම් වලට සමගාමීව තොරතුරු තාක්ෂණ ඒකකය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ගිවිසුම්ගතව වූ Epic Lanka පුද්ගලික සමගම සමග එක්ව තේ අගය දාම කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරයි. ඉදිරි ප්‍රගතීන් අත්කර ගනිමින්, තේ අගය දාම කළමනාකරණ පද්ධතියේ දෙවන ප්‍රගති මට්ටම අවසන් කරන ලද අතර ව්‍යාපෘතියේ තුන්වන අදියර ආරම්භ කරන ලදී.

තොරතුරු තාක්ෂණ අංශය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙබ් අඩවිය සහ අනෙකුත් සමාජ මාධ්‍ය වේදිකා (facebook, twiter, instergram සහ tiktok) පවත්වා ගෙන යමින් යාවත්කාලීන තොරතුරු, සහ තේ කර්මාන්තයේ ප්‍රවණතා කර්මාන්තයේ පාර්ශවකරුවන්ට සහ පාරිභෝගිකයින්ට හෙළිදරව් කිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

# 3. කර්මාන්ත පැතිකඩ

ශ්‍රී ලංකා ආර්ථිකය 2019 අග භාගයේ පටන් දරුණු අර්බුදයකට මුහුණ දුන් අතර එය අබණ්ඩ අර්බුදයක් ලෙස පැවතුනි. වෙළෙඳපොළ ඉල්ලුම සහ සැපයුම, විනිමය අනුපාත, විදේශ විනිමය ඉපැයීම්, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාත සහ අභ්‍යන්තර දේශපාලන තත්ත්වයන් සියල්ල අහිතකර ලෙස බලපාන ලදී. මෙම තත්ත්වය තේ කර්මාන්තය ඇතුළු ශ්‍රී ලංකාවේ සෑම අංශයකටම පාහේ අහිතකර ලෙස බලපෑවේය.

පොහොර තහනම වැනි නොගැලපෙන ප්‍රතිපත්තිමය තීරණවල බලපෑම තේ නිෂ්පාදනයට දැඩි ලෙස බලපෑවේය. එපමණක් නොව, ජාත්‍යන්තර වශයෙන්, රුසියානු-යුක්‍රේන ගැටුම, ඉරාන සම්බාධක, ගෝලීය උද්ධමනය, ප්‍රවාහන සහ සැපයුම් ගැටළු, විනිමය අනුපාතවල උච්චාවචනයන් සහ ලෝක වෙළඳපොළේ තේ මිල යන සියල්ල තේ කර්මාන්තයට අහිතකර අන්දමින් බලපාන ලදී. කෙසේ වෙතත්, අබණ්ඩව පොහොර සැපයීම සහ වසර පුරා පවතින හිතකර කාලගුණික තත්වයන් සමඟ ඉදිරි වසරවලදී ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2023 වසරේ වාර්තා වූ වාර්ෂික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 256 ක් වූ අතර එය පෙර වසරේ කිලෝග්‍රෑම් මිලියන 252 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 4 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2023 වසරේ සමස්ත අපනයන කිලෝග්‍රෑම් මිලියන 242ක් වාර්තා වී ඇති අතර එය 2022දී කිලෝග්‍රෑම් මිලියන 250ක් හා සසඳන විට අඩුවීමක් පෙන්නුම් කෙරේ. 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ තේ අපනයන ඉපයීම් ප්‍රමාණය බිලියන 428ක් වූ අතර එය 2022 වසරේ අදාළ කාලසීමාව තුළදී රුපියල් බිලියන 411ක් විය. 2022 දී වාර්තා වූ ඇමරිකානු ඩොලර් බිලියන 1.2 (ඇ.ඩො මිලියන 1,259) සිට 2023 දී ඇමරිකානු ඩොලර් බිලියන 1.3 (ඇ.ඩො මිලියන 1,310) දක්වා එක්සත් ජනපද ඩොලර් මිලියන 51 කින් වැඩි විය.

කෙසේ වෙතත් රුපියල් සහ ඩොලර් යන මුදල් ඒකක දෙකෙන්ම අපනයන ආදායමේ 4%ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2022 දී ලබා ගත් කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.234ක් වූ සාමාන්‍ය FOB මිල 2023 දී රුපියල් 1.171 දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇති බව සඳහන් කිරීම වැදගත්ය. තවද එය සමාලෝචිත වසර තුළ දී කිලෝවකට ඇමෙරිකානු ඩොලර් 5.4ක් ලෙස වාර්තා කළේය.

සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය සිලෝන් තේ නිෂ්පාදනයේ ප්‍රධාන අංගය වූ අතර එය 2023 වසර තුළදී කිලෝග්‍රෑම් මිලියන 231ක් වාර්තා කර ඇති අතර, 2022 අනුරූප කාලපරිච්ඡේදය තුළ එය කිලෝග්‍රෑම් මිලියන 227ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත් 2022 හා සැසඳීමේදී එය 2%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2023 වර්ෂය සඳහා CTC නිෂ්පාදනය 0.1% ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එය සමාලෝචිත වසර තුළ දී කිලෝ මිලියන 23 ක් වශයෙන් වාර්තා විය. හරිත තේ නිෂ්පාදනය 2022 දී කිලෝග්‍රෑම් මිලියන 1.8 ක් වූ අතර එය 2023 දී කිලෝග්‍රෑම් මිලියන 2.3 ක් නිෂ්පාදනය කරමින් 26% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කොළඹ තේ වෙන්දේසියේ සමුච්චිත සාමාන්‍ය මිල කිලෝවක් සඳහා ඇ.ඩො. 3.57ක් වූ අතර 2022 වසරේ දී එය ඇ.ඩො 3.82කි විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ තේ වෙන්දේසියේ 2022 දී මිල රු. 1,234 සිට 2023 දී රු. 1,171 දක්වා පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරකම් පාදක වූ වෙළඳපල විවිධාංගීකරණය හේතුවෙන් වැඩි අපනයන වෙලඳපොලවල් විවෘත විය. සමාලෝචිත කාලපරිච්ඡේදයේ වෙලඳපොලවල් අතරින්, ඉරාකය ප්‍රමුඛතම සිලෝන් තේ අපනයන රට වූ අතර එය මුළු අපනයන ප්‍රමාණයෙන් 14%ක් වන අතර එනම් කිලෝග්‍රෑම් මිලියන 33ක් වේ. සිලෝන් තේ සම්බන්ධයෙන් අනෙකුත් ප්‍රධාන අපනයන රටවල් වූයේ තුර්කිය (කිලෝ මිලියන 30.4), රුසියාව (කිලෝ මිලියන 22.6), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (කිලෝ මිලියන 18.4), චීනය (කිලෝ මිලියන 12.30), ලිබියාව (කිලෝ මිලියන 11.1), අසර්බයිජානය (කි.ග්‍රෑම් මිලියන 9.1), චිලි (කිලෝ මිලියන 7.8), සිරියාව (කිලෝ මිලියන 7.0) සහ සෞදි අරාබිය (කිලෝ මිලියන 7) යන රටවල් ය.

## 3.1. තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 267,000කි. කළමනාකරණ නිර්ණායක අනුව මෙම තේ වතු පෞද්ගලික අංශය (60%) සහ රාජ්‍ය අංශය(40%) යනුවෙන් වර්ග කළ හැකිය. මෙරට තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළය. එනම්, ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් හේතුකොටගෙන තෙත් කලාපය ආශ්‍රිතව.


## 3.2. තේ නිෂ්පාදනය

වගුව 3.1: උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය

| උන්නතාංශය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|
| උඩරට | 58,639,860 |
| මැදරට | 42,337,896 |
| පහතරට | 155,110,890 |
| **එකතුව** | **256,088,647** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ප්‍රස්තාරය 3.1: උන්නතාංශය අනුව සමස්ත තේ නිෂ්පාදනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2023 වර්ෂය තුළ මෙරට ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 256ක් ලෙස වාර්තා විය. මෙය 2022 වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 4ක (2%) වැඩිවීමකි. වගා කරන හා නිෂ්පාදනය කරන උන්නතාංශ ප්‍රදේශ මත පදනම්ව ශ්‍රී ලංකාවේ තේ කාණ්ඩ තුනකට වර්ගීකරණය කෙරේ. පහත රට තේ නිෂ්පාදනය කරනු ලබන්නේ මුහුදු මට්ටමේ සිට මීටර් 600 ක් පමණ ඉහළින් වන

අතර ජාතික නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට වඩා (2023 දී 61%) දායක වේ. තවද එය කළු පැහැති පෙනුමක්, තද කෝප්ප වර්ණයක් සහ රසයකින් යුක්තය. මීටර 1200ට වැඩි උස් ප්‍රදේශයක නිපදවන තේ, උසස් තත්ත්වයේ තේ ලෙස හඳුනාගෙන ඇති අතර, ගුණාත්මක බවින් ඉහල ලෙස සලකනු ලබයි. එමෙන්ම, එමගින් සුවඳ සමඟ අද්විතීය රසයක් ලබා දෙයි. 2023 වර්ෂය තුළ ජාතික නිෂ්පාදනය සඳහා උඩරට සහ මැදරට තේ නිෂ්පාදන දායකත්වය පිළිවෙලින් 23% සහ 16% කි.

## 3.2.1. මාසික තේ නිෂ්පාදනය

වසර පුරාම පහතරට තේ නිෂ්පාදනය මගින් ජාතික තේ නිෂ්පාදනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලැබුණි. 2023 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 27ක ඉහළම මාසික තේ නිෂ්පාදනය මැයි මාසය තුළදී වාර්තා වූ අතර කිලෝ ග්‍රෑම් මිලියන 18ක අවම නිෂ්පාදනයක් අගෝස්තු මස තුළ දී වාර්තා විය.

ප්‍රස්තාරය 3.2: උන්නාංශය අනුව මාසික තේ නිෂ්පාදනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.2.2. දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

සමාලෝචිත වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර මහනුවර හා බදුල්ල දිස්ත්‍රික්ක විසින් පිළිවෙලින් දෙවන හා තුන්වන නිෂ්පාදන වාර්තා කරන ලදී. ඉහළම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. ගාල්ල දිස්ත්‍රික්කය දෙවන වැඩිම නිෂ්පාදනය පෙන්නුම් කෙරේ. මෙම දිස්ත්‍රික්ක දෙකම ජාතික තේ නිෂ්පාදනයට 20% කින් සහ 15% කින් පිළිවෙලින් දායක විය. උන්නතාංශ තුනම පිළිබඳ සැලකිමේ දී, ඉහලම නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද පහලම නිෂ්පාදනය මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය.

වගුව 3.2: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 14,315,083 | 10,723,264 | - | 25,038,346 |
| කොළඹ | - | - | 1,233,378 | 1,233,378 |
| ගාල්ල | 4,534 | - | 38,067,233 | 38,071,767 |
| හම්බන්තොට | - | - | 82,564 | 82,564 |
| කළුතර | - | - | 15,870,895 | 15,870,895 |
| මහනුවර | 564,607 | 17,181,391 | 9,446,287 | 27,192,284 |
| කෑගල්ල | - | 245,643 | 7,960,580 | 8,206,223 |
| මාතලේ | - | 1,502,990 | 364,724 | 1,867,714 |
| මාතර | - | 61,170 | 29,323,341 | 29,384,511 |
| මොණරාගල | - | 155 | - | 155 |
| නුවරඑළිය | 43,755,636 | 10,896,549 | 793,643 | 55,445,828 |
| රත්නපුර | - | 1,726,735 | 51,968,246 | 53,694,981 |
| **එකතුව** | **58,639,860** | **42,337,897** | **155,110,891** | **256,088,646** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# 3.2.3.දිස්ත්‍රික්ක අනුව කෘෂි දේශගුණික විශ්ලේෂණය

වගුව 3.3: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | 2023 (කි.ග්‍රෑ)* | 2022 (කි.ග්‍රෑ)* | වෙනස (කි.ග්‍රෑ) | % |
|---|---|---|---|---|
| **නුවරඑළිය** | **3,269,242** | **3,100,723** | **168,519** | **5.4** |
| **බටහිර** | | | | |
| රම්බොඩ | 1,930,540 | 1,769,419 | 161,121 | 9.1 |
| පුඹලු ඔය | 4,288,813 | 3,677,365 | 611,448 | 16.6 |
| ආගරපතන | 4,777,802 | 4,204,143 | 573,660 | 13.6 |
| නානුඔය/ ලිඳුල/ තලවකැලෙ | 7,834,229 | 7,405,439 | 428,790 | 5.8 |
| පතන / කොටගල | 3,240,289 | 2,848,637 | 391,652 | 13.7 |
| හැටන් / දික්ඔය | 6,633,112 | 6,317,777 | 315,336 | 5.0 |
| බගවන්තලාව | 5,140,111 | 4,627,350 | 512,761 | 11.1 |
| අප් කොට් / මස්කෙලිය | 5,095,745 | 4,268,486 | 827,259 | 19.4 |
| **එකතුව - බටහිර** | **38,940,641** | **35,118,616** | **3,822,027** | **10.9** |
| **මධ්‍යම** | | | | |
| වටවල/ ගිනිගත්ගේන/ නෝට්‍රන් බ්‍රිජ් | 1,186,120 | 1,196,123 | (10,003) | (0.8) |
| පුස්සැල්ලාව/ හේවාහැට | 4,818,780 | 4,877,643 | (58,863) | (1.2) |
| කොත්මලේ | 692,560 | 752,867 | (60,307) | (8.0) |
| ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ | 17,147,414 | 17,743,903 | (596,489) | (3.4) |
| නිලඹේ/ හන්තාන/ ගලහ | 1,564,196 | 1,267,816 | 296,380 | 23.4 |
| කඩුගන්නාව | 4,513,099 | 4,551,687 | (38,589) | (0.8) |
| මඩුල්කැලේ / නකල්ස් / රන්ගල | 2,895,633 | 2,645,825 | 249,808 | 9.4 |
| හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස | 1,061,677 | 1,262,310 | (200,633) | (15.9) |
| බලංගොඩ / රක්වාන | 6,611,832 | 7,092,525 | (480,693) | (6.8) |
| **එකතුව - මධ්‍යම** | **40,491,311** | **41,390,699** | **(899,389)** | **(2.2)** |
| **උඩපුස්සැල්ලාව** | | | | |
| උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය | 3,715,557 | 3,614,356 | 101,201 | 2.8 |
| මතුරට | 1,837,490 | 1,729,244 | 108,246 | 6.3 |
| **එකතුව - උඩපුස්සැල්ලාව** | **5,553,047** | **5,343,600** | **209,447** | **3.9** |
| ඌව | | | | |
| කොස්ලන්ද/ හල්දුමුල්ල | 698,485 | 600,444 | 98,041 | 16.3 |
| හපුතලේ | 3,628,187 | 3,681,191 | (53,004) | (1.4) |
| බණ්ඩාරවෙල/ පුනාගල | 2,650,201 | 2,750,843 | (100,643) | (3.7) |
| මල්වත්ත/ වැලිමඩ | 2,443,630 | 2,510,844 | (67,215) | (2.7) |
| දෙමෝදර/ හාලිඇල/ බදුල්ල | 8,555,920 | 8,960,319 | (404,399) | (4.5) |
| ඇල්ල/ නමුනුකුළ | 1,229,201 | 1,148,791 | 80,410 | 7.0 |
| පස්සර/ ඉණුගල | 3,287,497 | 2,877,873 | 409,624 | 14.2 |
| මඩුල්සිම | 2,376,987 | 2,621,201 | (244,214) | (9.3) |
| **එකතුව - ඌව** | **24,870,108** | **25,151,506** | **(281,400)** | **(1.1)** |
| **පහතරට** | | | | |
| දෙනියාය | 11,167,936 | 11,632,515 | (464,579) | (4.0) |
| ගාල්ල | 38,723,674 | 36,177,523 | 2,546,151 | 7.0 |
| කළුතර | 16,566,484 | 16,005,832 | 560,652 | 3.5 |
| කෑගල්ල | 5,494,282 | 5,401,157 | 93,125 | 1.7 |
| කැලණි මිටියාවත | 6,881,943 | 7,453,456 | (571,513) | (7.7) |
| මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 2,608,096 | 2,939,898 | (331,802) | (11.3) |
| මාතර | 12,037,196 | 12,787,487 | (750,292) | (5.9) |
| මොරවක | 5,763,878 | 5,191,127 | 572,752 | 11.0 |
| රත්නපුර | 40,078,843 | 40,033,489 | 45,354 | 0.1 |
| බලන්ගොඩ | 3,641,972 | 4,111,372 | (469,400) | (11.4) |
| **පහතරට එකතුව** | **142,964,304** | **141,733,856** | **1,230,448** | **0.9** |
| **එකතුව** | **256,088,653** | **251,839,000** | **4,249,6512** | **1.7** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දිස්ත්‍රික්ක අනුව ඉහළම කෘෂි දේශගුණික නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් මිලියන 40ක් රත්නපුරයෙන් වාර්තා වූ අතර 2 වැනි ඉහළම නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 38.7ක් ගාල්ලෙන් වාර්තා විය.
සමාලෝචිත වර්ෂය තුළ පහල උන්නතාංශ ප්‍රදේශ තුළින් කිලෝ ග්‍රෑම් මිලියන 142.9ක් නිෂ්පාදනය කර ඇති අතර එය 2022 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද ප්‍රමාණයට වඩා කිලෝග්‍රෑම් මිලියන 1.2ක් (1%) වැඩි විය.

## 3.2.4. සැකසුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

### i) කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2023 වසර තුළදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 2% කින්ද සී.ටී.සී. තේ නිෂ්පාදනය 0.12% කින්ද ඉහල නැගීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 3,776 කින් (1.5%) ඉහල ගොස් ඇත. හරිත තේ නිෂ්පාදනය පෙර වර්ෂය හා සැසඳීමේදි 26% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

වගුව 3.4: සැකසුම් ක්‍රමවේද අනුව තේ නිෂ්පාදන (කි.ග්‍රෑ.)

| | සම්ප්‍රදායික | සී.ටී.සී | හරිත |
|---|---|---|---|
| 2022 | 227,439,132 | 22,589,894 | 1,809,969 |
| 2023 | 231,187,701 | 22,617,364 | 2,283,582 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ii) ක්ෂණික තේ සහ පෙව තේ නිෂ්පාදනය

2022 වසර හා සැසඳීමේ දී 2023 වසර තුළදී ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් 1,268,554 කින් පහල යාමක් පෙන්නුම් කරන අතර පෙව තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 94000ක ඉහල යාමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුළ පෙව තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 1.07ක් වූ අතර එය 2022 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 0.97ක් විය. සමාලෝචිත වර්ෂය තුළ ක්ෂණික තේ නිෂ්පාදනය 3,205,230ක් වශයෙන් වාර්තා විය.

## 3.2.4. අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්ත ශාලාවක තේ දළු අවශ්‍යතාවය ඔවුන්ගේම වතුවලින් මෙන්ම මිලදී ගත් තේ දළුවලින් සපුරා ගනු ලැබේ. සාදන ලද තේ ප්‍රමාණය 4.65න් ගුණකරමින් රැස් කරගන්නා ලද තේ දළු ප්‍රමාණය ගණනය කරන අතර එය තේ කර්මාන්තයේ පිළිගත් සුත්‍රයක් ලෙස භාවිත කෙරේ.

වගුව 3.5: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 66,565,134 | 49,863,176 | - | 116,428,310 |
| කොළඹ | - | - | 5,735,208 | 5,735,208 |
| ගාල්ල | 21,081 | - | 177,012,634 | 177,033,715 |
| හම්බන්තොට | - | - | 383,923 | 383,923 |
| කළුතර | - | - | 73,799,662 | 73,799,662 |
| මහනුවර | 2,625,423 | 79,893,467 | 43,925,232 | 126,444,122 |
| කෑගල්ල | - | 1,142,240 | 37,016,698 | 38,158,938 |
| මාතලේ | - | 6,988,903 | 1,695,967 | 8,684,869 |
| මාතර | - | 284,441 | 136,353,534 | 136,637,975 |
| මොණරාගල | - | 721 | - | 721 |
| නුවරඑළිය | 203,463,708 | 50,668,953 | 3,690,438 | 257,823,099 |
| රත්නපුර | - | 8,029,316 | 241,652,345 | 249,681,661 |
| **එකතුව** | **272,675,346** | **196,871,217** | **721,265,641** | **1,190,812,204** |


මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.2.6. නිමි තේ නිෂ්පාදන වියදම

ඵලදායිතාවය සහ නිෂ්පාදන වියදම එකිනෙකට සම්බන්ධ කාරණාවන අතර නිෂ්පාදන වියදම ඉහළයාම වැවිලි අංශය තුළ බොහෝවිට දැකිය හැකි කණගාටුදායක කරුණක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍යවන හෙයින් ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර දැඩි සම්බන්දතාවයක් පවතී. තේ නිපදවන ප්‍රධාන පෙලේ රටවල් අතර ශ්‍රී ලංකාව තුළ ඉහළ නිෂ්පාදන වියදමක් දැකිය හැක. ගෝලීය සන්දර්භය තුළ රටෙහි පවතින තරඟකාරීත්වය සඳහා මෙම තත්වය බලපා ඇත.

නිමි තේ කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ශ්‍රම පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යාම විශේෂයෙන් නිෂ්පාදන වියදම සඳහා බලපා තිබුණි. 2022/2023 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව තේ කිලෝ ග්‍රෑමයක සඳහා වාර්ෂික නිෂ්පාදන වියදම රුපියල් 885වූ අතර එය 2021/2022 හා සැසඳීමේදි 38%ක වර්ධනයකි.

ප්‍රස්තාරය 3.3: නිමි තේ කිලෝවක සමස්ත පිරිවැය




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

# 3.3.තේ අලෙවිය

තේ වෙන්දේසිවල දී වාර්තා වූ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයන් සමඟ සසඳන විට, 2023 වසරේ මේ දක්වා වාර්ෂික සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,171.29කි (අවමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 974.00ක්, උපරිමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,467.00ක වේ). එය පසුගිය වසරේ සාමාන්‍ය අගය වූ රුපියල් 1,234.24ක අගය හා සැසඳීමේ දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 62.95ක පහල බැසීමකි. ඉහළම විකුණුම් සාමාන්‍යය වාර්තා වූයේ පහත රට තේ මඟින් වන අතර එය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,544 ක් වශයෙනි. 2023 වර්ෂයේ දී වාර්ෂික විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 250ක් වූ අතර 2022 දී එය තේ කිලෝග්‍රෑම් මිලියන 249ක් විය. එනම්, පොදු, පෞද්ගලික සහ සෘජු විකුණුම් ඇතුළුව, සමාලෝචිත වර්ෂය සඳහා කිලෝග්‍රෑම් මිලියන 1ක වර්ධනයක් (0.4%) වාර්තා කරන ලදී. 2023 ජනවාරි මාසය තුළ මේ දක්වා විකුණුම් සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,467ක් වූ අතර එය 2023 වසරේ ඉහලම විකුණුම් ප්‍රමාණය වන කිලෝග්‍රෑම් මිලියන 36 ක් ලෙස වාර්තා විය. ගෙවුණු වසරේ ජුනි මස හැර සෑම මසක දිම සාමාන්‍ය විකුණුම් අගය රුපියල් දහස ඉක්ම විය.

## 3.3.1.අලෙවි ක්‍රම

කර්මාන්තශාලාවල නිපදවන තේ අලෙවි කරන ප්‍රධාන මාදිලිය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2023 වසරේදි තේ කිලෝ ග්‍රෑම් මිලියන 241.4ක ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. පෞද්ගලික විකුණුම් කිලෝ ග්‍රෑම් මිලියන 7.4ක් වූ අතර ඉතිරි කිලෝ ග්‍රෑම් මිලියන 0.8ක ප්‍රමාණය සෘජු විකුණුම් හරහා අලෙවි කරන ලදී. කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වාණිජ මණ්ඩලය මඟින් පවත්වන කොළඹ තේ වෙන්දේසිය 2023 වසර තුළ දී වෙන්දේසි 50ක් පවත්වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණුම් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 0.40ක (0.2%)ක වැඩි වීමක් වාර්තා විය. එම වසර තුළදී සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,170.57ක් ලෙස කොළඹ තේ වෙන්දේසිය තුළ වාර්තා වූ අතර එය පසුගිය වසර හා සැසඳීමේ දී 6%ක මිල පහත බැසීමකි.

## 3.3.2. භූමි උන්නතාංශය අනුව අලෙවිය

උන්නතාංශ තුනම අතුරින්, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී ඉහළ උන්නතාංශ ප්‍රදේශවල වගා කළ තේ විකුණුම් පරිමාවේ 5% ක වැඩිවීමක් දක්නට ලැබුන අතර මධ්‍යම සහ පහල උන්නතාංශ යන ප්‍රදේශ දෙකෙහිම පිළිවෙලින් 0.5% සහ 1%ක ආන්තික අඩුවීමක් වාර්තා විය. පසුගිය වසර හා සසඳන විට සියලුම විකුණුම් පරිමාවන් 0.4% ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළ අතර සංයුක්ත ජාතික සාමාන්‍යය 5%කින් අඩු විය. 2023 වසර තුළදී එය අඩුවෙමින් පැවති අතර ඒ අනුව උන්නතාංශ තුනෙහිම සෘණාත්මකව මිල වෙනස්වීම් පෙන්නුම් කළේය.

වගුව 3.6: භූමි උන්නතාංශය අනුව අලෙවි ප්‍රමාණය හා ඒකක මිල (රු / කිලෝ ග්‍රෑම්)

| උන්නතාංශය | 2023 | 2022 | වෙනස | % | 2023 | 2022 | වෙනස | % |
|---|---|---|---|---|---|---|---|---|
| | අලෙවි ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | | | | දළ ඒකක මිල (රු / කිලෝ ග්‍රෑම්) | | | |
| උඩරට | 56.47 | 53.72 | 2.75 | 5.10 | 1,072 | 1,093 | (21.00) | (1.90) |
| මැදරට | 41.87 | 42.08 | (0.21) | (0.50) | 1,012 | 1,031 | (18.00) | (1.80) |
| පහතරට | 151.31 | 152.84 | (1.53) | (1.00) | 1,252 | 1,340 | (88.00) | (6.50) |
| **මුළු විකුණුම්** | 249.65 | 248.64 | 1.01 | 0.40 | 1,171 | 1,234 | (63.00) | (5.10) |

මූලාශ්‍රය: අලෙවි වාර්තා- භූමි උන්නතාංශය අනුව සියලු විකුණුම් - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# 3.4. තේ අපනයනය


සමාලෝචන වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 242ක් වූ සමස්ත තේ අපනයනය (ප්‍රති අපනයනය ඇතුළුව) 2022 වර්ෂයේ වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 250ට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් 8ක පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. 2022 වර්ෂයේ වාර්තා වූ අපනයන ඉපයීම් වූ රුපියල් බිලියන 411ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රුපියල් බිලියන 17ක වර්ධනයක් සහිතව රුපියල් බිලියන 428ක් අපනයන මගින් උපයා ගන්නා ලදී. 2023 වසර තුළ දී සාමාන්‍ය වාර්ෂික FOB ඒකක මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 1770 ක් වූ අතර සාපේක්ෂව එය පසුගිය වසරේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,643ක් ලෙස වාර්තා විය. එනම් රුපියල් 127ක අඩුවීමකි. ලෝක තේ වෙළෙඳපොළ තුළ තේ අපනයනය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව විකුණුම් ප්‍රමාණය අතින් තුන්වන ස්ථානයේ පසුවන අතර තේ මගින් ආදායම් ලබන රටවල් අතරින් දෙවන ස්ථානය හිමිකරගෙන සිටී. ගෝලීය තේ වෙළඳපොල තුළ ගුණාත්මක තේ සපයනු ලබන රටක් වශයෙන් ඉදිරියට යාමට ශ්‍රී ලංකාව සතු හැකියාව එමගින් පෙන්නුම් කෙරේ.

අනෙකුත් තේ නිපදවන්නන්ගේ ඇති එ දැඩි තරගකාරිත්වය ශ්‍රී ලංකාවේ වෙලඳපොල තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති අතර මෙම තත්වය ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම යන කරුණු හේතුවෙන් වඩාත් උග්‍ර% වී ඇත. ඊට අමතරව ගෝලීය තේ පරිභෝජකයන්ගේ වෙනස්වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් CTC තේවලින් බැහැරව සම්ප්‍රදායික තේ මත ම රැඳීසිටීමෙන් තම වෙළෙඳපොළ කොටස තව දුරටත් අහිමි විය.

## 3.4.1. වර්ග අනුව තේ අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් සලකා බැලීමේදී, තේ දළුවල සම්භවය හා ගුණාත්මකභාවය අනුව තේ සඳහා ඇති රුචිකත්වය සැලකිය යුතු අන්දමෙන් වෙනස් වේ. මැද පෙරදිග සහ පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් ස්වාධීන රටවල් තුළ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන තද රසයක් සහිත පහත රට හා සාම්ප්‍රදායික තේ සඳහා ඉල්ලුමක් පවතී. 2023 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව සමස්ත කළු තේ සහ ක්ෂණික තේ අපනයනය ප්‍රමාණාත්මකව පිළිවලින් 3% කින් හා 9% කින් අඩුවීමක් පෙන්නුම් කරන ලදී. වාර්ෂික හරිත තේ නිෂ්පාදන ප්‍රමාණය 2022 වර්ෂයට සාපේක්ෂව 7%ක වර්ධනය-ක් පෙන්නුම් කළේය. කෙසේනමුත්, සිලෝන් තේ අපනයන මගින් රුපියල් ඉපයීම සමාලෝචිත වර්ෂය තුළ සැලකිය යුතු වශයෙන් වර්ධනය විය. සාමාන්‍යයෙන් සමස්ත තේ අපනයන ප්‍රමාණයෙන් කළු තේ අපනයන ප්‍රතිශතය ආසන්න වශයෙන් සෑම වසරකම 97%ක් වන අතර හරිත තේ ප්‍රතිශතය 2%ක් පමණ හා ක්ෂණික තේ අපනයනය 1%ක් වශයෙන් පවතී. ප්‍රති අපනයනයන් ද සහිතව කිලෝ ග්‍රෑම් මිලියන 8.2ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 3%ක පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. අපනයන සහ ප්‍රති අපනයන වෙන් වෙන් වශයෙන් ප්‍රමාණයෙන් පිලිවෙලින් 4%ක හා 23%ක පහල බැසීමක් පෙන්නුම් කරන ලදී. තවද, අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයෙන් පිළිවෙලින් 3%ක හා 23%ක ඉහල නැගීමක් වාර්තා කරන ලදී. කෙසේවෙතත්, 2022 වසරේදී සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,309.8ක් වූ අතර 2023 වසරේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 1,259 විය. එනම්, 4% වර්ධනයකි.

ප්‍රස්තාරය 3.4: මාසික තේ අපනයන 2023
ප්‍රමාණයන සහ ඒකක - ප්‍රමාණය කිලෝ ග්‍රෑම් හා ඒකක වටිනාකම රුපියල්/ කිලෝග්‍රෑම්




මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

## 3.4.2.වාර්ෂික තේ අපනයනය

ප්‍රස්තාරය 3.7: වාර්ෂික තේ අපනයනය 2023

| වර්ගය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) | වටිනාකම (රු) | FOB (රු./කි.ග්‍රෑම්) |
|---|---|---|---|
| **අපනයනය** | | | |
| **කළු තේ** | | | |
| මළු | 18,261,980 | 55,608,789,092 | 3,045.00 |
| තොග | 101,457,746 | 151,303,094,873 | 1,491.00 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 72,736,826 | 126,843,170,163 | 1,744.00 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 2,014,683 | 3,780,130,682 | 1,876.00 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 10,844,467 | 18,970,994,564 | 1,749.00 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 21,439,279 | 28,053,905,263 | 1,309.00 |
| **සමස්ථ කළු තේ** | **226,754,981** | **384,560,084,637** | **1,696.00** |
| **හරිත තේ** | | | |
| මළු | 803,222 | 4,556,032,692 | 5,672.00 |
| තොග | 372,295 | 783,543,773 | 2,105.00 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 790,634 | 2,627,099,315 | 3,323.00 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 7,608 | 14,982,212 | 1,969.00 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 1,328 | 2,721,102 | 2,049.00 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 12,085 | 34,214,589 | 2,831.00 |
| **සමස්ථ හරිත තේ** | **1,987,172** | **8,018,593,683** | **4,035.00** |
| **ක්ෂණික තේ** | | | |
| මළු | 120 | 596,707 | 4,973.00 |
| ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි) | 2,717,678 | 9,263,891,449 | 3,409.00 |
| **සමස්ථ ක්ෂණික තේ** | 2,717,798 | 9,264,488,156 | 3,409.00 |
| **සමස්ත අපනයන** | **231,459,951** | **401,843,166,476** | **1,736.00** |
| **ප්‍රති අපනයන** | | | |
| **කළු තේ** | | | |
| මළු | 4,978,580 | 11,258,701,870 | 2,261.00 |
| තොග | 1,869,682 | 2,653,642,464 | 1,419.00 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 925,825 | 2,100,416,844 | 2,269.00 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 1,579 | 4,523,589 | 2,865.00 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 200 | 485,780 | 2,429.00 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 54,280 | 119,555,019 | 2,203.00 |
| **සමස්ථ කළු තේ** | **7,830,146** | **16,137,325,566** | **2,061.00** |
| **හරිත තේ** | | | |
| මළු | 1,200,312 | 7,687,117,157 | 6,404.00 |
| තොග | 335,377 | 394,080,067 | 1,175.00 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 922,862 | 1,901,241,686 | 2,060.00 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 230 | 698,830 | 3,038.00 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 55,609 | 133,013,567 | 2,392.00 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 24,187 | 52,148,703 | 2,156.00 |
| **සමස්ථ හරිත තේ** | **2,538,577** | **10,168,300,010** | **4,006.00** |
| **ක්ෂණික තේ** | | | |
| මළු | 398 | 754,013 | 1,895.00 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 1,534 | 3,187,502 | 2,078.00 |
| ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි) | 82,084 | 138,926,051 | 1,692.00 |
| **සමස්ථ ක්ෂණික තේ** | **84,016** | **142,867,566** | **1,700.00** |
| **එකතුව (ප්‍රති අපනයන)** | **10,452,739** | **26,448,493,142** | **2,530.00** |
| **මුළු එකතුව** | **241,912,705** | **428,291,679,825** | **1,770.00** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.4.3. අගය එකතු කළ තේ අපනයන

තේ සඳහා වූ ගෝලීය රුචිකත්වය අගය එකතු කළ තේ කරා සිඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. එහෙයින්, ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළඳපොළ තත්වය ආරක්ෂා කර ගැනීම උදෙසා එකී වෙනස්කම්වලට ශ්‍රී ලංකාව අනුගත විය යුතුය. අගය එකතු කළ තේ ( එනම් කිලෝ ග්‍රෑම් 03 වඩා අඩු ඇසුරුම්, තේ මළු සහ ක්ෂණික තේ) අපනයනය 2023 වසරේ සමස්ත තේ අපනයනයෙන් 44% ක් වූ අතර එමගින් උපයාගත් ආදායම රුපියල් බිලියන 225ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 53% ක් විය.

වගුව 3.8: අගය එකතු කළ තේ අපනයනය

| අපනයන වර්ගය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | FOB (රු/ කි.ග්‍රෑ.) | FOB |
|---|---|---|---|---|
| අපනයනය | කළු තේ | 93,013,489 | 186,232,089,937 | 2,002.21 |
| | හරිත තේ | 1,601,464 | 7,198,114,219 | 4,494.71 |
| | ක්ෂණික තේ | 2,717,813 | 9,264,508,363 | 3,408.81 |
| | **උප එකතුව** | **97,332,765** | **202,694,712,519** | **2,082.49** |
| ප්‍රති අපනයනය | කළු තේ | 5,905,984 | 13,363,642,303 | 2,262.73 |
| | හරිත තේ | 2,123,404 | 9,589,057,673 | 4,515.89 |
| | ක්ෂණික තේ | 84,016 | 142,867,566 | 1,700.48 |
| | **උප එකතුව** | **8,113,404** | **23,095,567,542** | **2,846.59** |
| **එකතුව** | | **105,446,169** | **225,790,280,061** | **2,141.28** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

අගය එකතු කළ තේ හා තොග තේ යන දෙවර්ගයම සඳහා FOB මිල පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ. අගය එකතු කළ තේ සඳහා FOB මිල තොග තේ මිලට වඩා වැඩිය. එබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දේ. සමාලෝචන වර්ෂය තුළ අගය එකතු කළ තේ හා තොග තේ යන දෙවර්ගයම සඳහා FOB මිලෙහි ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කිලෝග්‍රෑම් 3ක් දක්වා අපනයන කාණ්ඩ අගය එකතු කළ තේ වශයෙන් සලකා ඇත.

ප්‍රස්ථාරය 3.5 : අගය එකතු කළ තේ අපනයන හා තොග තේ අපනයන සඳහා FOB මිල




මූලාශ්‍රය: රේගු දත්ත

## 3.4.4. ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතීතයේ දී එක්සත් රාජධානිය, පකිස්ථානය හා රුසියාව තුළ ශ්‍රී ලංකා තේ සඳහා ශක්තිමත් වෙළඳපොලක් පැවතුනි. නමුත්, වත්මනේ දී ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 25 අතර එකි රටවල් නොපවතී. සමස්ත තේ අපනයනයෙන් 13.5% ක් ආනයනය කරමින් ඉරාකය ශ්‍රී ලංකාවේ තේ සම්බන්ධයෙන් ප්‍රධාන අපනයනකරුවා බවට පත් විය. එනම්, 2022 වසර හා සැසඳීමේ දී 24%ක පහත බැසීමකි.

2023 වසරේ දී 12.5%ක අපනයන කොටසක් සහිතව දෙවන අපනයන රට බවට තුර්කිය පත් විය. එය 2022 වසරට සාපේක්ෂව අපනයන ප්‍රමාණයේ 95%ක වර්ධනයකි. සෞදි අරාබිය සඳහා FOB මිලෙහි සාමාන්‍ය අගය 2023 වසරේ දී ඉහළම රටවල් දහය අතරින් ඉහළ මිලක් පෙන්නුම් කළ අතර එය කිලෝ ග්‍රෑමයකට රුපියල් 2,477ක් විය. ප්‍රධාන රටවල් දහය අතර සිටින තුර්කිය, චීනය, චිලි, සිරියාව හා සෞදි අරාබිය යන රටවල් 2022 වසරට වඩා සිලෝන් තේ ආනයනය කළ අතර ඉරාකය, රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලිබියාව හා අසර්බයිජානය තුළ වත්මන් වසරේ සිලෝන් තේ ආනයනයේ අඩුවක් දක්නට ලැබේ. කෙසේවෙතත්, 2023 වසර තුළ ශ්‍රී ලංකාවෙන් තේ ලබා ගන්නා ප්‍රධාන රටවල් 10 විසින් සිලෝන් තේ අපනයනයෙන් 66%ක් සඳහා දායක වී ඇත. සිලෝන් තේ අපනයනයේ ප්‍රධාන රටාවල් 10 අතරින් ඉරාකය තුළ සිලෝන් තේ සඳහා ඉල්ලුම 24% කින් අඩු වූ අතර එයට හේතුව වුයේ එරට තුළ වූ අභ්‍යන්තර ගැටළු ය. එමෙන්ම, නිෂ්පාදනයේ අඩුව හේතුවෙන් 2013 වසරෙන් පසු ලෝකයට සිලෝන් තේ සැපයුමේ ක්‍රමික අඩුවීමක් ඇත.

වගුව 3.9: ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් -2023

| රට | 2023 | | | | 2022 | | | | ප්‍රමාණයේ වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | |
| ඉරාකය | 1 | 32,751,246 | 1,203.06 | 13.54 | 1 | 43,245,924 | 1,092.82 | 17.29 | (24.3) |
| තුර්කිය | 2 | 30,411,858 | 1,676.23 | 12.57 | 4 | 15,595,068 | 1,503.25 | 6.23 | 95.0 |
| රුසියාව | 3 | 22,617,599 | 1,754.35 | 9.35 | 2 | 24,733,188 | 1,638.30 | 9.89 | (8.6) |
| එ.අ.එ.රාජ්‍යය | 4 | 18,460,239 | 1,715.3 | 7.63 | 3 | 22,558,454 | 1,704.39 | 9.02 | (18.2) |
| චීනය | 5 | 12,319,524 | 1,471.02 | 5.09 | 7 | 11,128,882 | 1,401.10 | 4.45 | 10.7 |
| ලිබියාව | 6 | 11,127,949 | 1,226.41 | 4.6 | 6 | 11,200,519 | 1,195.87 | 4.48 | (0.6) |
| අසර්බයිජානය | 7 | 9,176,629 | 1,700.75 | 3.79 | 5 | 12,091,887 | 1,749.26 | 4.83 | (24.1) |
| චිලි | 8 | 7,887,268 | 1,323.77 | 3.26 | 8 | 6,513,522 | 1,394.49 | 2.6 | 21.1 |
| සිරියාව | 9 | 7,083,647 | 1,966.88 | 2.93 | 10 | 6,153,518 | 1,760.51 | 2.46 | 15.1 |
| සෞදි අරාබිය | 10 | 7,012,587 | 2,476.85 | 2.9 | 9 | 6,270,569 | 2,295.16 | 2.51 | 11.8 |
| ප්‍රධාන රටවල් 10 හි එකතුව | | 158,848,546 | 1,579.13 | 65.66 | | 159,491,531 | 1467.9106 | 63.76 | (0.4) |
| **මුළු එකතුව** | | **241,912,705** | **1,770.44** | **100.00** | | **250,171,340** | **1643.093** | **100** | **(3.3)** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ රුසියාවට තෙවන තැන හිමිවී ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යය 8%ක අපනයන ප්‍රමාණයකින් දායක වෙමින් සිව්වන ස්ථානයේ රැඳී සිටීමට සමත්වී ඇත. කලාපයක් වශයෙන් මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ප්‍රදේශය වේ. ඉහල තෙල් මිල හේතුවෙන් ඉල්ලුම විශාල වශයෙන් වැඩි වෙමින් පවතී. ඉපයීම් සම්බන්ධයෙන් ප්‍රධාන රටවල් 10 විසින් සාමාන්‍ය FOB ඒකක මිල සම්බන්ධයෙන් සැලකිය යුතු ඉහළ FOB මිල ගණන් වාර්තා කරන ලදී. එපමණක් නොව, සමස්ත අපනයන ආදායම 2022 ට සාපේක්ෂව 2023 දී ඉහල නැගීමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 428ක් ඉක්මවිය. කෙසේවෙතත්, අනෙකුත් කලාපවල තේ මඳ භාවිත කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තොග තේ අපනයනය මැද පෙරදිග දෙසට යොමු වී ඇත.

වගුව 3.10 ඇසුරුම් ක්‍රමය අනුව ප්‍රධාන රටවල් 20 සඳහා තේ අපනයන ප්‍රමාණයන් හා ශ්‍රේණිගත කිරීම

| රට | මළු | | තොග | | ඇසුරුම් (>කි.ග්‍රෑ. 3) | | ඇසුරුම් (කි.ග්‍රෑ. 1-කි.ග්‍රෑ. 3) | | ඇසුරුම් (කි.ග්‍රෑ. 3-කි.ග්‍රෑ. 5) | | ඇසුරුම් (4 .ග්‍රෑ. -කි.ග්‍රෑ. 1) | | ඇසුරුම් (කි.ග්‍රෑ. 5-කි.ග්‍රෑ. 10) | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය | ප්‍රමාණය | ශ්‍රේණිය |
| ඇ.එ.ජ. | 219,692 | 14 | 4,495,778 | 8 | - | 0 | 147,844 | 4 | 1,043,125 | 3 | 15,368,253 | 1 | 11,476,555 | 1 | 32,751,246 | 1 |
| ලිබියාව | 424,590 | 9 | 6,497,661 | 5 | 720 | 10 | 797,387 | 1 | 4,939,325 | 1 | 13,750,008 | 2 | 4,002,168 | 2 | 30,411,858 | 2 |
| රුසියාව | 1,062,681 | 6 | 17,912,658 | 1 | 3,154 | 7 | - | 0 | 24,895 | 12 | 3,598,681 | 4 | 15,530 | 11 | 22,617,599 | 3 |
| එ.අ.එ.රාජ්‍යය | 310,215 | 11 | 12,225,636 | 2 | 2,367 | 8 | 36,947 | 7 | 248,485 | 4 | 3,333,264 | 5 | 2,303,326 | 3 | 18,460,239 | 4 |
| යුක්‍රේනය | 281,915 | 12 | 10,912,142 | 3 | 45,183 | 2 | 62,747 | 6 | 290 | 15 | 443,425 | 14 | 573,822 | 5 | 12,319,524 | 5 |
| නෙදර්ලන්තය (ඕලන්දය) | 56,879 | 18 | - | 0 | - | 0 | - | 0 | - | 0 | 11,071,070 | 3 | - | 0 | 11,127,949 | 6 |
| සෞදි අරාබිය | 6,457 | 19 | 8,777,442 | 4 | - | 0 | 6,400 | 11 | 13,650 | 13 | 366,779 | 15 | 5,900 | 15 | 9,176,629 | 7 |
| පෝලන්තය | 1,339,297 | 5 | 6,309,248 | 6 | 1,742 | 9 | - | 0 | - | 0 | 231,981 | 16 | 5,000 | 16 | 7,887,268 | 8 |
| චීනය | 715,200 | 8 | 804,894 | 16 | - | 0 | 538,988 | 2 | 3,763,925 | 2 | 1,143,415 | 12 | 117,225 | 7 | 7,083,647 | 9 |
| ඕස්ට්‍රේලියාව | 2,450,539 | 1 | 1,496,006 | 14 | 29,812 | 5 | 14,065 | 8 | 129,134 | 7 | 2,880,866 | 7 | 12,165 | 12 | 7,012,587 | 10 |
| නායිවානය | 714 | 20 | 5,181,547 | 7 | - | 0 | 12,800 | 9 | 134,330 | 6 | 156,142 | 19 | 1,016,300 | 4 | 6,501,833 | 11 |
| එක්සත් රාජධානිය | 165,875 | 15 | 4,156,469 | 9 | 32,284 | 4 | - | 0 | 10 | 17 | 1,788,986 | 11 | 4,107 | 17 | 6,147,731 | 12 |
| ප්‍රංශය | 1,508,700 | 4 | 1,759,643 | 13 | 108,138 | 1 | 903 | 13 | 12,814 | 14 | 1,833,533 | 10 | 25,063 | 9 | 5,248,795 | 13 |
| නයිජීරියාව | 2,004,041 | 2 | - | 0 | 90 | 11 | 85,300 | 5 | 47,500 | 11 | 2,647,797 | 8 | 100 | 18 | 4,784,828 | 14 |
| බෙලරුස් | 736,822 | 7 | 3,838,543 | 10 | 15,235 | 6 | 200 | 14 | 52,864 | 10 | 28,076 | 20 | 91,189 | 8 | 4,762,930 | 15 |
| කැනඩාව | 76,008 | 17 | 3,812,557 | 11 | 43,500 | 3 | 11,203 | 10 | 94,902 | 9 | 227,783 | 17 | 20,224 | 10 | 4,286,177 | 16 |
| උස්බෙකිස්ථානය | 120,075 | 16 | 3,106,275 | 12 | - | 0 | 245,927 | 3 | 117,646 | 8 | 211,210 | 18 | 7,445 | 14 | 3,808,577 | 17 |
| ජර්මනිය | 225,988 | 13 | 56,921 | 17 | - | 0 | - | 0 | - | 0 | 3,242,201 | 6 | - | 0 | 3,525,111 | 18 |
| ඊශ්‍රායලය | 1,655,581 | 3 | 1,157,994 | 15 | 60 | 12 | 4 | 15 | 77 | 16 | 583,378 | 13 | 8,100 | 13 | 3,405,194 | 19 |
| චිලි | 335,946 | 10 | 4,126 | 18 | - | 0 | 1,200 | 12 | 195,262 | 5 | 1,853,761 | 9 | 153,486 | 6 | 2,543,781 | 20 |
| **ප්‍රධාන රටවල් 20 හි එකතුව** | **13,697,216** | | **92,505,540** | | **282,285** | | **1,961,915** | | **10,818,234** | | **64,760,609** | | **19,837,805** | | **203,863,503** | |
| **මුළු එකතුව** | **25,244,612** | | **104,035,100** | | **2,799,762** | | **2,025,634** | | **10,901,604** | | **75,376,161** | | **21,529,831** | | **241,912,705** | |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.4.5. කළු තේ අපනයනය

සමස්ත තේ අපනයනයෙන් 97% (කි.ග්‍රෑ. මි.234.5)ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇති අතර සමස්ත තේ අපනයන ආදායමෙන් 94% (රුපියල් බිලියන 400.7) ක් සඳහා දායකත්වය සපයා ඇත. ශ්‍රී ලංකාව කළු තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් 86%ක් ප්‍රමාණාත්මකව හා 82%ක් වටිනාකමෙන් දායක වී තිබේ. සිලෝන් තේ අපනයනවලින් 14%ක ප්‍රමාණයක් ආනයනය කරමින් 2023 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් ඉරාකය පළමු ස්ථානයේ රැඳුන අතර එම වසර තුළ දී සිලෝන් තේ අපනයනවලින් 13%ක ප්‍රමාණයක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවෙන් කළු තේ දෙවන ස්ථානයට වැඩියෙන්ම ආනයනය කළ රට බවට තුර්කිය පත් විය. කෙසේ වෙතත්, 2013 වසර දක්වා රුසියාව ශ්‍රී ලාංකීය කළු තේ ආනයනය කරන ප්‍රධාන රට වශයෙන් පැවතුන අතර 2014 වසරේදී තුර්කිය ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයේ පළමු ස්ථානයට පත්විය. නැවතත් රුසියාව විසින් ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයෙන් 12% කට දායක වෙමින් 2015 වසර තුළ ශ්‍රී ලංකා කළු තේ ආනයනයේ පළමු ස්ථානයට පත්විය. 2016 වසර තුළදී, සිලෝන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් රුසියාව දෙවන ස්ථානයට පත් වූ අතර ඊළඟ අබණ්ඩ වසර 05 තුළ රුසියාව සිලෝන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් තෙවන ස්ථානයේ රැඳී සිටීමට සමත් විය. 2022 වසර තුළ සිලෝන් තේ කිලෝ ග්‍රෑම් මිලියන 24ක් ආනයනය කරමින් රුසියාව දෙවන ස්ථානයට පැමිණි අතර සමාලෝචිත වසර තුළ එය කිලෝ ග්‍රෑම් මිලියන 22ක් වශයෙන් වාර්තා කරමින් සිලෝන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් තෙවන ස්ථානයේ රැඳී සිටීමට සමත් විය.

වගුව 3.11: කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 20 සහ වෙළඳපොළ කොටස් 2023 (ප්‍රතී අපනයනය සමග)

| ශ්‍රේණිය | රට | ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන) | වටිනාකම (රු.බිලි) | FOB (රු / කි.ග්‍රෑම්) | ප්‍රමාණයේ කොටස (%) | වටිනාකමේ කොටස (%) | 2022ට සාපේක්ෂව 2023 දී ප්‍රමාණයේ වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඉරාකය | 32.74 | 39.37 | 1,202.42 | 13.96 | 9.83 | (24.23) |
| 2 | තුර්කිය | 30.38 | 50.92 | 1,676.19 | 12.95 | 12.71 | 95.01 |
| 3 | රුසියාව | 22.11 | 37.92 | 1,714.68 | 9.43 | 9.46 | (8.83) |
| 4 | එ.අ.ඒ. රාජ්‍යය | 18.03 | 30.75 | 1,705.45 | 7.69 | 7.67 | (18.87) |
| 5 | චීනය | 12.17 | 17.65 | 1,450.25 | 5.19 | 4.40 | 10.64 |
| 6 | ලිබියාව | 10.58 | 12.89 | 1,218.46 | 4.51 | 3.22 | (2.04) |
| 7 | අසර්බයිජානය | 9.17 | 15.58 | 1,699.27 | 3.91 | 3.89 | (24.12) |
| 8 | චිලි | 7.84 | 10.20 | 1,300.47 | 3.34 | 2.55 | 21.77 |
| 9 | සිරියාව | 7.08 | 13.93 | 1,966.84 | 3.02 | 3.48 | 15.19 |
| 10 | සෞදි අරාබිය | 6.77 | 16.47 | 2,433.22 | 2.89 | 4.11 | 10.49 |
| 11 | ඉරානය | 6.50 | 12.21 | 1,878.31 | 2.77 | 3.05 | (50.14) |
| 12 | ජර්මනිය | 6.06 | 11.53 | 1,903.62 | 2.58 | 2.88 | (6.07) |
| 13 | ජෝර්දානය | 4.77 | 9.46 | 1,984.01 | 2.03 | 2.36 | 21.93 |
| 14 | ජපානය | 4.74 | 10.43 | 2,200.53 | 2.02 | 2.60 | (19.61) |
| 15 | ඇ.එ. ජනපදය | 4.56 | 8.61 | 1,888.73 | 1.94 | 2.15 | (20.99) |
| 16 | නායිවානය | 4.14 | 5.88 | 1,419.72 | 1.77 | 1.47 | (14.07) |
| 17 | හොංකොං | 3.80 | 5.88 | 1,548.45 | 1.62 | 1.47 | (0.36) |
| 18 | බෙල්ජියම | 3.51 | 5.10 | 1,454.18 | 1.49 | 1.27 | 21.59 |
| 19 | පෝලන්තය | 3.24 | 7.93 | 2,448.98 | 1.38 | 1.98 | (0.54) |
| 20 | ලෙබනන් | 2.53 | 5.27 | 2,087.45 | 1.08 | 1.32 | 91.19 |
| **ප්‍රධාන රටවල් 20හි එකතුව** | | **200.72** | **327.98** | **1,634.10** | **85.57** | **81.87** | **(3.98)** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 05 සහ අපනයන ප්‍රමාණය ඉහත වගුවෙන් දැක්වේ. වැඩිම කළු තේ අපනයනය කරනු ලබන රට මගින් 14%ක ප්‍රමාණයක් ආනයනය කරන අතර අඩුම කළු තේ ප්‍රමාණයක් ආනයනය කරන රට 5%ක ප්‍රමාණයක් ආනයනය කරනු ලබයි.

## 3.4.6. හරිත තේ අපනයනය

2023 වසරේ දී සමස්ත තේ අපනයනයෙන් 2% (කිලෝ ග්‍රෑම් මිලියන 4.5) ක් සහ ආදායමෙන් 4%ක් (රුපියල් බිලියන 18ක්) සඳහා හරිත තේ මගින් දායක වී තිබේ. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් ප්‍රමාණය අනුව 84% ක් හා වටිනාකම අනුව 79 %ක් සඳහා දායක වේ. ශ්‍රී ලාංකීය හරිත තේ ආනයනය කරන ප්‍රධාන රටවල් අතුරින් ඇමරිකා එක්සත් ජනපදය සැලකිය යුතු ප්‍රමාණයක් එනම් කි.ග්‍රෑම් මිලියන 0.6ක් සඳහා දායක වූ අතර එක්සත් රාජධානිය රුපියල් 8517ක FOB මිලක් 2023 වසරේ දී වාර්තා කර ඇත. අනෙක් අතට, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන පෙළේ සියලු රටවල් 20 ම පාහේ ඉහල FOB මිලක් වාර්තා කරන ලද අතර ලිබියාව තුළ කිලෝ ග්‍රෑමයකට රුපියල් 1500ක මිලක් වාර්තා විය. කෙසේ වෙතත්, 2022 වසර හා සැසඳීමේ දී 2023 වසර තුළ ශ්‍රී ලංකා හරිත තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 20 හි අපනයනයේ 11% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වගුව 3.12: හරිත තේ අපනයනය කරන ප්‍රධාන රටවල් - 2023

| ශ්‍රේණිය | රට | ප්‍රමාණය (කි.ග්‍රෑ) | වටිනාකම (රු.මිලි) | FOB (රු/ කි.ග්‍රෑ) | ප්‍රමාණයේ කොටස (%) | වටිනාකමේ කොටස (%) | 2022 ට සාපේක්ෂව 2023 දී ප්‍රමාණයේ වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඇමරිකා එක්සත් ජනපදය | 583,100 | 3,422,553,900 | 5,869.58 | 12.88 | 18.82 | (0.69) |
| 2 | ලිබියාව | 545,955 | 753,696,333 | 1,380.51 | 12.06 | 4.14 | 37.10 |
| 3 | රුසියාව | 500,755 | 1,753,155,261 | 3,501.02 | 11.06 | 9.64 | 4.80 |
| 4 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 429,349 | 910,617,463 | 2,120.93 | 9.49 | 5.01 | 27.44 |
| 5 | යුක්‍රේනය | 259,054 | 612,992,933 | 2,366.27 | 5.72 | 3.37 | 24.93 |
| 6 | නෙදර්ලන්තය (ඕලන්දය) | 221,510 | 1,580,824,307 | 7,136.58 | 4.89 | 8.69 | (3.68) |
| 7 | සෞදි අරාබිය | 213,547 | 793,701,291 | 3,716.76 | 4.72 | 4.36 | 59.98 |
| 8 | පෝලන්තය | 165,688 | 640,389,021 | 3,865.02 | 3.66 | 3.52 | 36.78 |
| 9 | චීනය | 107,056 | 388,339,615 | 3,627.45 | 2.37 | 2.14 | 80.52 |
| 10 | ඕස්ට්‍රේලියාව | 104,164 | 594,173,942 | 5,704.22 | 2.30 | 3.27 | (10.01) |
| 11 | නායිවානය | 101,705 | 211,295,931 | 2,077.54 | 2.25 | 1.16 | (3.08) |
| 12 | එක්සත් රාජධානිය | 74,390 | 633,580,150 | 8,517.01 | 1.64 | 3.48 | 18.57 |
| 13 | ප්‍රංශය | 72,776 | 482,937,107 | 6,635.97 | 1.61 | 2.66 | 31.05 |
| 14 | නයිජීරියාව | 69,011 | 312,832,240 | 4,533.07 | 1.52 | 1.72 | (27.52) |
| 15 | බෙලරුස් | 65,149 | 185,891,891 | 2,853.35 | 1.44 | 1.02 | (0.78) |
| 16 | කැනඩාව | 62,097 | 327,558,206 | 5,274.93 | 1.37 | 1.80 | 2.00 |
| 17 | උස්බෙකිස්ථානය | 60,994 | 200,471,017 | 3,286.75 | 1.35 | 1.10 | (19.88) |
| 18 | ජර්මනිය | 58,380 | 192,954,130 | 3,305.15 | 1.29 | 1.06 | (35.93) |
| 19 | ඊශ්‍රායලය | 49,781 | 189,135,362 | 3,799.33 | 1.10 | 1.04 | 32.15 |
| 20 | චිලි | 43,670 | 237,527,499 | 5,439.15 | 0.96 | 1.31 | (40.31) |
| | **ප්‍රධාන රටවල් 20හි එකතුව** | **3,788,131** | **14,424,627,599** | **3,807.85** | **83.68** | **79.31** | **11.74** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 3.4.7. ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ ආනයනය කරනු ලබන ප්‍රමුඛ රටක් ලෙස ශ්‍රී ලංකා ක්ෂණික තේ වෙළඳපොල තුළ අයර්ලන්තය ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් මිලියන 2.3 (82%)ක ප්‍රමාණයක් ආනයනය කරමින් මහත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ ක්ෂණික තේ අපනයනය කරනු ලබන ඊළඟ ප්‍රමුඛ රටවල් වන්නේ පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපදය (3.86%), පකිස්ථානය (2.09%), චීනය (1.61%) හා තායිවානය (1.57%) යි. සමාලෝචන වර්ෂය තුළ අපනයනය කළ සමස්ත ක්ෂණික තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 3ක් වන අතර වටිනාකම රුපියල් බිලියන 9ක් වේ. කෙසේ වෙතත් , ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ මිලදී ගන්නා ප්‍රධාන රටවල් සඳහා තේ කිලෝවක් රුපියල් 3000-4000 අතර සාමාන්‍ය මිලකට අලෙවි කරනු ලබයි.

### 3.4.8. ආර්.ටී.ඩී (පානය සඳහා පිළියෙල කළ) තේ අපනයනය

2023 වර්ෂය තුළදී, පානය සඳහා පිළියෙළ කළ සමස්ථ තේ ලීටර් 37,608ක් අපනයනයෙන් රුපියල් මිලියන 22ක අපනයන ආදායමක් ලබා ගත හැකි විය. ශ්‍රී ලංකාවෙන් ලීටර් 21,600ක් ආනයනය කරමින් ලැට්වියාව විසින් පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොලේ වැදගත් භූමිකාවක් ඉටු කරන ලද අතර එමගින් රටට රුපියල් මිලියන 11.6ක අදායමක් ලැබිණි. ඇමරිකා එක්සත් ජනපදය සහ මවුරිටියස් යනු ලංකාවේ පානය සඳහා පිළියෙළ කළ තේ අපනයනයේ අනෙකුත් ප්‍රධාන වෙළඳපොලවල් ය. කෙසේ වෙතත්, පසුගිය වසර දෙක තුළ, ශ්‍රී ලංකා පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොළ තුළ ක්‍රමික පහත වැටීමක් පවතින බව නිරීක්ෂණය විය.

## 3.5.ගෝලීය තේ කර්මාන්තය

තේ යනු ජලයට පමණක් දෙවෙනි වන ලෝකයේ නිතරම පරිභෝජනය කරන උණුසුම් පානවලින් එකකි. ස්වාභාවික පානයක් ලෙස එය ලෝකයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර සහ සෑම වයස් කාණ්ඩයකම පාහේ ජනප්‍රියය. ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන අතර, තේ මගින් ජාතික ආර්ථිකය හා සමාජ සංවර්ධනය සඳහා එහි ඇත ඉතිහාසයේ පටන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් වෙළඳ භාණ්ඩ පදනම් කරගත් නිෂ්පාදන මගින් සපයන අතර තේ කර්මාන්තය ද රටේ විශාලතම සේවා යෝජක කණ්ඩායම අතර සිටියි.

තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් අතර ප්‍රධාන නිෂ්පාදකයින් වන්නේ චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව හා තුර්කිය යි. සමාලෝචිත 2023 වසර තුළ පස්වන ස්ථානයේ රැඳී සිටීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර තුර්කිය සිව්වන ස්ථානයට පැමිණ තිබේ. එමෙන්ම, වියට්නාමය හා ඉන්දුනීසියාව ප්‍රධාන නිෂ්පාදන රටවල් ලයිස්තුවේ ඊළඟ ස්ථානයට පත්විය. මෙම රටවල් පහ ලෝක නිෂ්පාදනයෙන් 86%ක් සහ ගෝලීය අපනයනයෙන් 85%ක් සඳහා දායක වේ (වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන අභිරේකය 2023). ලෝක තේ වගාව ඉහළ නැංවීම සඳහා චීනය ප්‍රමුඛ ලෙස වැදගත් වූ අතර අප්‍රිකානු මහාද්වීපය, විශේෂයෙන් කෙන්යාව විශාල අස්වැන්නක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ පසුබිම සැලකිල්ලට ගනිමින්, 2020, 2021, 2022 වසරවලදී කාර්ය සාධනය අපනයන, නිෂ්පාදනය ආදී ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැලකිල්ලට ගැනීමේ දී මධ්‍යස්ථ මට්ටමක පවතී. කෙසේ වෙතත්, 2023 වසර තුළදී, ගෝලීය තේ අපනයනය තුළ සිලෝන් තේ වෙළඳපොල කොටස 13.7%ක් වූ අතර ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන තේ නිෂ්පාදන රටවල් අතර 5වන ස්ථානයේ රැඳී සිටියේය.

### 3.5.1. ගෝලීය තේ වගාව

2022 වසර අවසානයේදී ලෝකයේ තේ වගාව සහිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 5 ඉක්මවනු ඇතැයි ගණන් බලා තිබේ.

වගුව 3.13: වැඩිම තේ වගා බිම් පිළිබඳ විස්තර

| රට | 2017 (හෙක්) | 2018 (හෙක්) | 2019 (හෙක්) | 2020 (හෙක්) | 2021 (හෙක්) | 2022 (හෙක්) |
|---|---|---|---|---|---|---|
| චීනය | 3,059,000 | 2,985,800 | 3,065,500 | 3,165,130 | 3,264,060 | 3,330,270 |
| ඉන්දියාව | 590,000 | 636,560 | 636,560 | 636,560 | 636,560 | 619,770 |
| ශ්‍රී ලංකා* | 202,540 | 202,540 | 202,540 | 202,540 | 202,540 | 267,186 |
| කෙන්යාව | 232,742 | 234,300 | 269,430 | 269,430 | 269,430 | 276,258 |
| වියට්නාමය | 134,000 | 130,000 | 130,000 | 130,000 | 130,000 | 128,000 |
| ඉන්දුනීසියාව | 116,500 | 115,300 | 114,300 | 113,500 | 113,400 | 111,900 |
| මියන්මාරය | 80,000 | 81,000 | 81,400 | 81,400 | 81,600 | 82,000 |
| තුර්කිය | 77,000 | 83,000 | 83,000 | 83,000 | 83,000 | 81,000 |
| බංගලිදේශය | 59,000 | 59,300 | 61,000 | 65,429 | 65,972 | 66,000 |
| ජපානය | 42,400 | 41,600 | 40,600 | 39,100 | 38,000 | 37,000 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2023

ජාත්‍යන්තර තේ කමිටුවට අනුව වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයෙන් (63%) වන අතර වාර්ෂිකව ඔවුන් තම තේ වගාව සිෂ්‍රයෙන් ව්‍යාප්ත කරමින් සිටි. කෙන්යාව ද 2010 සිට 2022 දක්වා කාලය තුළ හෙක්ටයාර් 276,258ක බිම් ප්‍රමාණයක තේ වගා කරන ලදී. තේ වගා කරනු ලබන ප්‍රමුඛ රටවල් 10 ලොව සමස්ත තේ වගා ව්‍යාප්තියෙන් 94%ක ප්‍රමාණයකට හිමිකම් කියයි.

## 3.5.2.ගෝලීය තේ පරිභෝජනය

2020 - 2022 තෙවසරක කාල වකවානුව තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය අනුව වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේය. එය කි.ග්‍රෑ. මිලියන 2,629ක් ලෙස වාර්තා වී ඇත. ඒක පුද්ගල තේ පරිභෝජනය පහළ අගයක් ගන්නා නමුත් මෙය කිලෝ ග්‍රෑම් 1.86ක් ලෙස වාර්තා විය. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 261.67ක් වශයෙන් පවතින තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.11ක ප්‍රමාණය වාර්තා කරන ලදී. ලිබියාව ද කිලෝග්‍රෑම් 2.07ක් ලෙසට ඉහළ මට්ටමේ ඒක පුද්ගල පරිභෝජනයක් පෙන්නුම් කරයි.

වගුව 3.14: රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන

| රට | 2018-20 | | 2019-21 | | 2020-22 | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | එක පුද්ගල | එකතුව | එක පුද්ගල | එකතුව | එක පුද්ගල |
| ලිබියාව | 15.33 | 2.64 | 14.13 | 2.05 | 14.37 | 2.07 |
| ඇෆ්ගනිස්ථානය | 27.87 | 0.91 | 25.63 | 0.82 | 22.07 | 0.69 |
| තුර්කිය | 263.27 | 3.2 | 269.47 | 3.23 | 261.67 | 3.11 |
| එක්සත් රාජධානිය | 107.6 | 1.61 | 102.25 | 1.52 | 100.74 | 1.5 |
| මොරොක්කෝව | 74.23 | 2.09 | 75.3 | 2.09 | 73.24 | 2.02 |
| අයර්ලන්ත ජනරජය | 10.38 | 2.1 | 9.89 | 1.99 | 8.92 | 1.78 |
| නායිවානය | 36.55 | 1.3 | 36.94 | 1.32 | 36.31 | 1.25 |
| කටාර් | 4.28 | 1.53 | 4.28 | 1.51 | 4.39 | 1.6 |
| ශ්‍රී ලංකාව | 29.53 | 1.36 | 29.59 | 1.35 | 29.76 | 1.34 |
| හොංකොං | 12.37 | 1.65 | 13.73 | 1.83 | 14.63 | 1.97 |
| චිලී | 21.45 | 1.12 | 20.74 | 1.07 | 20.91 | 1.06 |
| සිරියාව | 9.85 | 0.64 | 10.9 | 0.61 | 9.6 | 0.54 |
| ෆිජිතුව | 98.85 | 1 | 100.59 | 1 | 92.93 | 0.91 |
| ඉරාකය | 43.23 | 1.11 | 43.8 | 1.1 | 46.17 | 1.14 |
| ඉරානය | 78.23 | 0.94 | 73.27 | 0.87 | 59.83 | 0.71 |
| චීනය | 2289 | 1.64 | 2489 | 1.78 | 2,629 | 1.86 |
| ඉන්දියාව | 1091 | 0.83 | 1096.73 | 0.81 | 1140.07 | 0.83 |
| ස්වාධීන රාජ්‍ය (CIS) | 239.23 | 0.82 | 237.75 | 0.82 | 233.98 | 0.8 |
| පාකිස්ථානය | 216.34 | 1.01 | 234.9 | 1.08 | 245.18 | 1.12 |
| ඇ.එ.ජ. | 114.09 | 0.35 | 112.54 | 0.34 | 113.34 | 0.34 |
| ජපානය | 100.05 | 0.79 | 97.26 | 0.77 | 92.83 | 0.74 |
| ඉන්දුනීසියාව | 95.33 | 0.36 | 95.67 | 0.35 | 93.67 | 0.34 |
| බංගලිදේශය | 85.17 | 0.51 | 88.17 | 0.52 | 89.33 | 0.53 |
| පෝලන්තය | 38.78 | 1.02 | 39.49 | 1.04 | 40.43 | 1.07 |
| ජර්මනිය | 24.93 | 0.3 | 23.82 | 0.29 | 24.54 | 0.3 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2023

එකතුව: කිලෝ ග්‍රෑම් මිලියන / ඒක පුද්ගල( කිලෝ ග්‍රෑම්)


## 3.5.3. ගෝලීය තේ නිෂ්පාදනය

2023 වසරේ දී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් බිලියන 6.6ක් වූ අතර 2022 වසර හා සැසඳීමේදී එය 1.8%ක වර්ධනයකි. 2023 වසර තුළ දී චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, තුර්කිය, වියට්නාමය සහ ඉන්දුනීසියාව මගින් ගෝලීය තේ නිෂ්පාදනයෙන් 91% ක් පමණ නිෂ්පාදනය කර ඇත. ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයන් වන නමුත් මෙම රටවල් දෙකෙහි තේ පරිභෝජනය සැලකිය යුතු අන්දමින් ඉහල මට්ටමක පවතින හෙයින් ලොව විශාලතම තේ අපනයනකරු බවට කෙන්යාව පත්ව ඇත.

2023 වසර තුළ දී සිලෝන් තේ නිෂ්පාදනයේ ඉහල නැගීමක් සහිතව ශ්‍රී ලංකාව ගෝලීය නිෂ්පාදක ලයිස්තුව තුළ, ලෝකයේ පස් වන විශාලතම තේ නිෂ්පාදකයා බවට පත් වූ අතර තුර්කිය සිව්වන ස්ථානයට පැමිණ තිබේ. කෙසේ වෙතත්, 2023 වසර තුළ ගෝලීය තේ නිෂ්පාදනයේ 4%ක කොසටක් සඳහා ශ්‍රී ලංකාව දායක වී තිබේ.

ලෝක තේ නිෂ්පාදනයෙන් 49%ක කොටසකට හිමිකම් පාමින් කි.ග්‍රෑ. මිලියන 3,250ක් නිපදවමින් චීනය තේ නිෂ්පාදනයේ ඉහළ ම ස්ථානයේ රැඳී සිටින අතර ලෝක තේ නිෂ්පාදනයෙන් 21%ක කොටසකට හිමිකම් කියමින් ඉන්දියාව 2021 වසරේ දී කි.ග්‍රෑ. මිලියන 1,368ක වාර්ෂික නිෂ්පාදනයක් වාර්තා කරමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කිලෝ ග්‍රෑම් මිලියන 570ක් නිෂ්පාදනය කරමින් හා 9%ක කොටසක් හිමිකර ගනිමින් කෙන්යාව තුන්වන ස්ථානයට පත්ව ඇත. ලෝක තේ නිෂ්පාදනයේ සිව්වෙනියා වශයෙන් තුර්කිය 2023 වසරේ දී 4%ක කොටසකට හිමිකම් කියමින් තේ කිලෝ ග්‍රෑම් මිලියන 265ක් නිෂ්පාදනය කර ඇත.

ප්‍රස්තාරය 3.6: ලෝක තේ නිෂ්පාදන සංඛ්‍යාදත්ත




මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2023 අතිරේකය

## 3.5.4. ගෝලීය තේ අලෙවිය

2023 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 3.56ක් වශයෙන් කි.ග්‍රෑ. මිලියන 250ක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත්, 2023 වසර තුළ දී මුම්බාසා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 490ක් පමණ ප්‍රමාණයක් හා කල්කටා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 150ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. ලෝකයේ ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථාන සැලකීමේ දී, පසුගිය වසර කිහිපය තුළ කොළඹ වෙන්දේසිය මගින් ඉහල සාමාන්‍ය මිලක් පවත්වා ගෙන ගිය බව පැහැදිලිව පෙනෙන කරුණකි.

වගුව 3.15: ප්‍රධාන තේ වෙන්දේසි සංඛ්‍යාලේඛන (ප්‍රමාණය - කි.ග්‍රෑ. මිලියන / සාමාන්‍ය ඒකක මිල ඇ.ඩො./කි.ග්‍රෑ)


| වෙන්දේසි මධ්‍යස්ථානය | 2019 | | 2020 | | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල |
| චිතගොං | 85 | 2.31 | 82.99 | 2.05 | 88 | 2.32 | 87 | 2.10 | 88 | 1.71 |
| කොච්චින් | 42 | 1.66 | 41.52 | 1.92 | 48 | 1.92 | 49 | 1.82 | 46 | 1.68 |
| කොළඹ | 298 | 3.07 | 268.24 | 3.39 | 296 | 3.09 | 249 | 3.82 | 250 | 3.56 |
| ගුවාහාති | 150 | 2.09 | 162.52 | 2.69 | 155 | 2.49 | 143 | 2.43 | 142 | 2.28 |
| ජකර්තා | - | - | - | - | - | - | - | - | - | - |
| කල්කටා | 168 | 2.43 | 132.6 | 2.91 | 169 | 2.86 | 157 | 2.96 | 150 | 2.52 |
| ලිම්බෙ | 9 | 1.46 | 5.98 | 1.44 | 13 | 1.38 | 9 | 1.42 | 6 | 1.30 |
| මොම්බාසා | 454 | 2.04 | 516.8 | 1.93 | 504 | 1.97 | 505 | 2.33 | 490 | 2.07 |
| සිලිගුරි | | | | | | | | | 143 | 1.99 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2023 වසර තුළ කොළඹ වෙන්දේසි මධ්‍යස්ථානය තුළ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවූ අතර පසුගිය වසර කිහිපය තුළ දී තේ කිලෝ ග්‍රෑමයක මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවා පවත්වා ගැනීමට එයට හැකි විය. සමාලෝචන කාල වකවානුව තුළදී කල්කටා, ගුවහති සහ මොම්බාසා වෙන්දේසිවල තේ කි.ග්‍රෑ. 01 ක මිල ඇ.ඩො. 2ක් ඉක්මවිය. කල්කටා දෙවැනි ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර ගුවහති තුන්වෙනි තැනට පත්විය.

## 3.5.5. ගෝලීය තේ අපනයනය

ප්‍රස්තාරය 3.7: ප්‍රධාන තේ අපනයනකරුවන්





මූලාශ්‍රය : ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2023 අතිරේකය
සැ.යු. ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යා ප්‍රති අපනයනයන් ඇතුළත් නොකර දක්වා තිබේ.

පසුගිය වසර හා සැසඳීමේදි 2023 වසර තුළ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. 6,797 (0.3%) කින් වර්ධනය විය. පසුගිය වසර හා සැසඳීමේදි ඉන්දියාව, ශ්‍රී ලංකාව, චීනය හා වියට්නාමය සිය අපනයන ප්‍රමාණයෙනගේ සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. 2023 වර්ෂයට සාපේක්ෂව කෙන්යාව විසින් 16%ක වර්ධනයක් සහිතව අපනයන ප්‍රමාණයන්ගේ වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. විශාලතම තේ අපනයනකරුවන් සිව්දෙනා වන කෙන්යාව, චීනය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 77% කට වඩා වැඩි කොටසකට හිමිකම් කියා ඇත.

2022 වසරේ ප්‍රමුඛ පෙළේ තේ අපනයනකරුවන් සහ ඔවුන්ගේ අපනයන ආදායම් අනුව, තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගනු ලැබුයේ චීනය විසිනි. කෙන්යාව තෙවන විශාලම තේ අපනයන අදායම් උපයන්නා බවට පත් විය. දෙවැනි තැනට වැඩිම අපනයන ආදායම් ලබන රට වශයෙන් ශ්‍රී ලංකාවට තම ශ්‍රී ලංකා තේ අපනයනය මගින් ඇ.ඩො. බිලියන 1.3ක් තේ උපයම්න් තේ කර්මාන්තයේ ස්ථානයක පවත්වා ගැනීමට හැකිවිය.

ප්‍රස්තාරය 3.8: ඉහළම අපනයන ආදායම්




මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2023

# 4.තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම




තිරසාර සංවර්ධන ඉලක්ක යනු වසර 2030 වන විට මිනිසුන්ට සමෘද්ධිමත්, සමාන, සාධාරණ සහ සුරක්ෂිත ලෝකයක් සහ සියලු ආකාරයේ දරිද්‍රතාවය අවසන් කිරීම සඳහා වූ ප්‍රබල විශ්වීය එකඟතාවයකි.

අපගේ ලෝකය පරිවර්තනය කිරීමේ අංගයක් වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක 169 සහ දර්ශක 230ක් අඩංගු වේ. වසර 2030 න්‍යාය පත්‍රය 2015 සැප්තැම්බර් මස පැවති ඓතිහාසික එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවේදී සාමාජික රටවල් 193ක් විසින් සම්මත කරන ලද අතර, එය 2016 ජනවාරි 1 දින සිට බලාත්මක විය. තිරසාර සංවර්ධන අරමුණු සකස්කර ඇත්තේ පෙර නොවූ විරූ උපදේශන ක්‍රියාවලියක් මගින් ජාතික ආණ්ඩු සහ ලොව පුරා වාසය කරන මිලියන සංඛ්‍යාත පුරවැසියන් සාකච්ඡා කිරීමට සහ බලාපොරොත්තු සහගත න්‍යාය පත්‍රය අනුගමනය කිරීම සඳහා එක් රොක් කරමිනි.

ස්ථාපිත ඉලක්ක 17 අතරින් ඇතැම් ඉලක්ක තේ කර්මාන්තයට අදාළ වේ. තේ කර්මාන්තයේ තිරසාර බව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ සියලුම පාර්ශ්වකරුවන් දරණ උත්සාහයන් එක් එක් ඉලක්ක යටතේ පහත කෙටියෙන් විස්තර කෙරේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ කර්මාන්තය නියාමනයකින් යුක්තව පවත්වා ගැනීම තුළින් දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කරයි.

- තේ දළුවල ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- දැනට අපනයන FOB මිල වැඩිවීමේ බලපෑම ලියාපදිංචි නිෂ්පාදකයින් හරහා පහල ස්ථරවලට ගලායාමට සැලැස්වීම හරහා තේ දළු ප්‍රමිතිය සහතික කිරීම හා කුඩා වතු හිමියන් සඳහා සාධාරණ මිලක් ගෙවීම සඳහා නිරන්තර අධීක්ෂණ සහ නියාමන යාන්ත්‍රණයක් පවත්වා ගැනීම.
- කුඩා තේ ඉඩම්වල (අක්කර 10ට අඩු) සෘජු රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට රුපියල් 150ක් ලබා දී ඇත.







- සුළි කුණාටුවෙන් විපතට පත් මියන්මාරයේ වැසියන්ට මානුෂීය ආධාර යටතේ ශ්‍රී ලංකා රජය විසින් සිලෝන් තේ පරිත්‍යාග කරන ලදී.
- සිලෝන් තේ අපනයනකරුවන්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකා රජය විසින් 2023 පෙබරවාරි 10 වන දින තුර්කියේ සිදු වූ විනාශකාරී භූමිකම්පාවෙන් විපතට පත් වූවන් වෙත ලබා දීම සඳහා "සිලෝන් තේ" තොගයක් කොළඹ තුර්කි තානාපති වෙත පරිත්‍යාග කරන ලදී.

- කණ්ඩායම් ක්‍රියාකාරකම්, අභිප්‍රේරණය සහ විෂය සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා සියළුම කනිෂ්ඨ මට්ටමේ සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ සියලු සේවකයින් සහභාගී විය. මීට අමතරව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය කළමනාකරණ සහකාරවරුන් සඳහා ඔවුන්ගේ අභිප්‍රේරණය ඉහළ නැංවීම උදෙසා විශේෂයෙන් නිර්මාණය කරන ලද පුහුණු සැසියක් ද විය.








- තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ට ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සලකනු ලබයි. එසේම, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සේවක සේවිකාවන් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ වූ කිසිදු අගතියකින් තොරව සිය කාර්යයේ නිරත වෙති.




- ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2023 වසර තුළ සුර්ය බලශක්ති පොලි සහනාධාර වැඩසටහන සඳහා පොලි සහනාධාර වශයෙන් රුපියල් මිලියන 14.076ක ගෙවීම් සිදු කර ඇත.




- තේ කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇති අතර මේ වන විට රුපියල් මිලියන 16.98ක් වැය කරමින් කර්මාන්ත ශාලා 25ක් ආවරණය කර ඇත.
- තේ නිෂ්පාදනය තිරසාරව පවත්වා ගැනීම සඳහා තේ නැවත වගා කිරීමේ සහනාධාර වැඩසටහනට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් මිලියන 52.47ක් ලබා දෙන ලදී.




- තේ කර්මාන්තශාලා සඳහා තෙතමන මීටර ලබා ගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මූල්‍යාධාර ලබා දුන් අතර එය තේ දළුවල ගුණාත්මක බව ඉහළ නැංවීමට සහ අක්‍රමිකතා අවම කිරීමට සහාය විය.
- තේ අපනයනකරුවන්ගේ යන්ත්‍ර සඳහා සහනාධාර ලබා දීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර 2023 වසර තුළ දී රුපියල් මිලියන 39.37ක් ගෙවන ලදී.




- තේ ඉඩම්වල නිසි වාරිමාර්ග පද්ධතියක් ඇති කිරීම සඳහා වාරිමාර්ග සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- තේ ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෙවන කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.




2012 දී මිලදී ගත් තෙල් සඳහා ඉරානයට ගෙවිය යුතු ඩොලර් මිලියන 250 ක දිගුකාලීන බැරකම පියවීම සඳහා, ඉරානය විසින් ශ්‍රී ලංකාවෙන් කළ තේ ආනයනය වෙනුවෙන් ශ්‍රී ලංකාවට ගෙවීමට තිබෙන මුදලට සරිලන පරිදි බොරතෙල් සඳහා කළ යුතු ගෙවීම හිලව් කර ගැනීමට ශ්‍රී ලංකාව සහ ඉරානය එකඟතාවයකට එළැඹුණි. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ජාතික ඉරාන තෙල් සමාගමට ගෙවිය යුතු මුදල සිලෝන් තේ අපනයනයෙන් අවම වශයෙන් මාස 48ක් තුලදී ඉරානයට ගෙවනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය අපනයනකරුවන්ට ගෙවන්නේ තේවල වටිනාකම අනුවය.

# 5. මූල්‍ය සමාලෝචනය

# මූල්‍ය තත්ව ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | F | 1,607,420,541 | 1,613,886,378 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම් | G | 2,350,952 | 2,427,337 |
| අස්පෘශ්‍ය වත්කම් | H | 28,627,801 | 28,993,877 |
| | | 1,638,399,294 | 1,645,307,592 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | I | 64,559,937 | 34,494,977 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | J | 241,154,800 | 154,529,829 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | K | 54,352,528 | 59,668,267 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | L | 13,640,954,803 | 9,881,196,687 |
| ණය | M | 1,096,820,125 | 1,377,428,764 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | N | 213,989,748 | 388,067,757 |
| | | 15,311,831,941 | 11,895,386,281 |
| **මුළු වත්කම්** | | **16,950,231,235** | **13,540,693,873** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | | 672,012,202 | 672,012,202 |
| රඳවා ගත් ඉපැයුම් | | 218,256,656 | 41,600,571 |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්ද | O | 10,050,041,235 | 9,869,442,654 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1,308,977,885 | 1,275,202,496 |
| **මුළු හිමිකම්** | | **12,249,287,978** | **11,858,257,923** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම් | P | 43,822,237 | 43,699,322 |
| | | 43,822,237 | 43,699,322 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | Q | 175,018,421 | 163,276,674 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | R | 4,480,839,141 | 1,308,577,437 |
| බැංකු අයිරාව | S | 1,263,459 | 215,852 |
| බැංකු ණය | | - | 166,666,666 |
| | | 4,657,121,021 | 1,638,736,629 |
| **හිමිකම් සහ වගකීම්** | | **16,950,231,236** | **13,540,693,874** |

පිටු අංක 68 සිට 79 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 80 සිට 87 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේය.

| Director Finance | Director General | Chairman | Director |
|---|---|---|---|
| Date: 26.02.2024 | Date: 26.02.2024 | Date: 26.02.2024 | Date: 26.02.2024 |

# ආදායම් ප්‍රකාශය

**2023** දෙසැම්බර් **31** දිනට

| | | 2023 (රු.) | 2022(රු.) |
|---|---|---|---|
| **ආදායම** | **A** | **1,020,941,560** | **797,122,462** |
| **වියදම** | | | |
| තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | B | (335,444,475) | (144,658,596) |
| පරිපාලන වියදම් | C | (564,794,804) | (504,880,134) |
| මෙහෙයුම් අතිරික්තය / (හිඟය) | | 120,702,281 | 147,583,732 |
| මූල්‍ය ආදායම් | D | 112,610,616 | 75,129,356 |
| මූල්‍ය වියදම් | E | (247,508) | (174,594) |
| බදු අය කිරීමට පෙර අතිරික්තය / (හිඟය) | | 233,065,389 | 222,538,495 |
| පොළී ආදායම මත ගෙවූ බදු | Q | (38,192,593) | (12,248,758) |
| **බදු අය කිරීමෙන් පසු අතිරික්තය / (හිඟය)** | | **194,872,796** | **210,289,737** |

පිටු අංක 68 සිට 79 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 80 සිට 87 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

# වෙනත් විස්තරාත්මක අදායම් පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය) | 194,872,796 | 210,289,737 |
| සැබෑ තක්සේරුව | (10,674,728) | 24,704,215 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 33,775,389 | 737,979,015 |
| **කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)** | **217,973,457** | **972,972,967** |

පිටු අංක 68 සිට 79 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 80 සිට 87 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

# හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය (රු.) | ප්‍රවර්ධන හා අලෙවි බද්ද(රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රුඟ) | රඳවාගත් ඉපයීම් (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,202 | 9,003,547,467 | 509,766,986 | (117,001,094) | 10,068,325,560 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද - ( සටහන - O) | - | 148,907,390 | - | - | 148,907,390 |
| ගැළපුම් | - | (1,064,340) | - | 411,077 | (653,263) |
| 2020 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 27,456,495 | (21,447,654) | 6,008,840 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,202** | **9,151,390,517** | **537,223,481** | **(138,037,671)** | **10,222,588,527** |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,202 | 9,151,390,518 | 537,223,481 | (138,037,672) | 10,222,588,528 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද ( සටහන - O) | - | 744,046,097 | - | - | 744,046,097 |
| ගැළපුම් | - | (419,410,396) | - | (43,045,374) | (462,455,769) |
| 2021 වර්ෂය සඳහා අතිරික්තය | - | - | - | 8,194,034 | 8,194,034 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,202** | **9,476,026,219** | **537,223,481** | **(172,889,012)** | **10,512,372,890** |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,202 | 9,476,026,219 | 537,223,481 | (172,889,012) | 10,512,372,889 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද ( සටහන - O) | - | 391,720,699 | - | - | 391,720,699 |
| ගැළපුම් | - | 1,695,736 | | (20,504,369) | (18,808,633) |
| සැබෑ ලැබීම් | | | | 24,704,215 | 24,704,215 |
| 2022 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 737,979,015 | 210,289,737 | 244,065,126 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂ** | **672,012,202** | **9,869,442,654** | **1,275,202,496** | **41,600,571** | **11,858,257,923** |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,202 | 9,869,442,654 | 1,275,202,496 | 41,600,571 | 11,858,257,923 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන - O) | - | 213,600,964.06 | - | - | 213,600,964 |
| ගැළපුම් | - | (33,002,383) | 33,775,389 | (7,541,983) | (6,768,978) |
| සැබෑ ලැබීම් | - | - | 0.00 | (10,674,728) | (10,674,728) |
| 2023 වර්ෂය සඳහා අතිරික්තය | - | - | - | 194,872,796 | 194,872,796 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,202** | **10,050,041,235** | **1,308,977,885** | **218,256,656** | **12,249,287,978** |

පිටු අංක 68 සිට 79 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 80 සිට 87 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ | 2023(රු.) | 2022 (රු.) |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය | **194,872,796** | **222,538,495** |
| පහත සඳහන් කාරණා සඳහා ගැලපුම්: | | |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම | 42,901,487 | 42,208,606 |
| දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය හෝ පාඩුව | (1,552,459) | 1,380,288 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 2,385,811 | 2,193,170 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම | 76,385 | 76,385 |
| ස්ථාවර වත්කම් ගැලපුම් | 1,611,300 | (691,683,083) |
| සහන ලැබීම් | (10,674,728) | 24,704,215 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 33,775,389 | 737,979,015 |
| පාරිතෝෂික ගැලපීම | 7,212,000 | (12,348,938) |
| මූල්‍යමය වියදම් | 247,508 | 174,594 |
| මූල්‍යමය ආදායම් | (112,610,616) | (75,129,356) |
| ගැලපුම් | (6,995,828) | (18,808,633) |
| | (43,623,751) | 10,746,263 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | 151,249,045 | 233,284,758 |
| භාණ්ඩ ලැයිස්තුවල අඩුවීම් / (වැඩිවීම්) | (30,064,960) | (1,880,352) |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම් /(වැඩිවීම්) | (86,624,971) | (342,944,171) |
| තැන්පතු සහ පෙර ගෙවුම් අඩුවීම් /(වැඩිවීම් | 5,315,740 | (29,057,348) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ අඩුවීම් /(වැඩිවීම්) | 3,172,261,704 | 599,114,962 |
| ගෙවිය යුතු අදායම් බදුවල අඩුවීම් /(වැඩිවීම්) | (11,741,747) | 128,068,355 |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා ණය | 280,608,639 | 189,268,108 |
| | 3,329,754,404.25 | 542,569,554 |
| **මහෙයුම් කටයුතුවලින් ලද මුදල** | 3,481,003,449 | 775,854,312 |
| ගෙවනු ලැබූ පාරිතෝෂික | (17,763,813) | (2,295,785) |
| ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම | 213,600,964 | 391,720,699 |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල** | 195,837,151 | 389,424,914 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | 3,676,840,601 | 1,165,279,226 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ | - | 195,532 |
| මූල්‍ය ආදායම් | 112,610,616 | 75,129,356 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | (6,735,492) |
| දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (37,904,542) | (58,074,586) |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද ඇතුළු ආයෝජන | (3,759,758,116) | (1,128,609,119) |
| ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | (3,685,052,042) | (1,118,094,308) |
| **මූල්‍ය කටයුතුවලදී භාවිත කරන ලද මුදල් ප්‍රවාහ** | | |
| මූල්‍ය වියදම් | (247,508) | (174,594) |
| බැංකු ණය | (166,666,666) | 166,666,666 |
| ශුද්ධ මුදල් ප්‍රවාහ / මූල්‍ය කටයුතුවලදී (භාවිත කරන ලද) | **(166,914,173.94)** | **166,492,072** |
| ශුද්ධ වැඩිවීම (අඩුවීම) / මුදල් සහ මුදල් හා සමාන දේවල් | **(175,125,615)** | **213,676,990** |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | **387,851,905** | **174,174,915** |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **212,726,289** | **387,851,905** |

පිටු අංක 68 සිට 79 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 80 සිට 87 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයක

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### පොදු

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574" ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.

### මූලික කාර්යයන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම, සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමයි. එයට තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම හා අධිකාරිය පැවරී ඇත. එනම්, තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යනාදී කටයුතු ය. තවද, තේ වෙන්දේසි පැවැත්වීම, ගුණාත්මක තත්වය අධීක්ෂණය කිරීම මෙන්ම තේ විකිණීම, අපනයනය, තැරැව්කරුවන්, ගබඩා සහ තේ බෙදා හැරීම ආදී කටයුතු නියාමනය කිරීම ද එමඟින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ මෙන්ම අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

## 2. පිළියෙළ කිරීමේ පදනම

**2.1.2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) පිළියෙල කිරීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මුදල් වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර) සහ ලංකා ගිණුම් ප්‍රමිති (ලං.ගි.ප්‍ර) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

### 2.2. ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. අන් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට ලබා දී ඇත.

## 3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### ප්‍රතිපත්ති

### 3.1. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පහත සඳහන් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරන ලදී.

### 3.2. දේපළ, පිරියත සහ උපකරණ

කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර, දේපළ, පිරියත හා උපකරණ පිරිවැය යටතේ දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දීර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවන විටදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද පිරිවැයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී.

### 3.3. ක්ෂයවීම

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ පහත ආකාරයේ දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ඇස්තමේන්තුගත සඵල ආයු කාලය මත පදනම්වූ සෘජු රේඛීය ක්‍රමයෙනි.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 50 |
| කාර්යාල උපකරණ | අවුරුදු 02 - 20 |
| ලිඛිඩු සහ සවිකුරු | අවුරුදු 01 - 20 |
| මෝටර් වාහන | අවුරුදු 10 |
| පරිගණක උපාංග | අවුරුදු 05 |
| පුස්තකාල පොත් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 - 10 |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 01 - 10 |

### 3.4. දේපල, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනයක දීම වත්කම් ක්ෂය වීම පිලිබඳ ප්‍රයෝජ්‍ය ආයු කාලය හා ක්‍රමය සමාලෝචනය කරනු ලබයි. ඒවායේ අවිනිශ්චිත භාවයට හේතුවන මෙම අගයන්, අනුපාත හා ක්‍රම පිළිබඳ ඇස්තමේන්තුවක් කළමනාකරණ විසින් සිදු කරනු ලබයිග

### 3.5. ප්‍රත්‍යාගණනය

#### ඉඩම් සහ ගොඩනැගිලි

ගම්පොල, නුවරඑළිය,රත්නපුර සහ බදුරලිය සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ කටයුත්ත තක්සේරු දෙපාර්තමේන්තුවට පවරා ඇත. නුවරඑළිය සහ බණ්ඩාරවෙල යන ප්‍රාදේශීය කාර්යාල ප්‍රති ඇගයීම් වාර්තා 2022 වසර තුළ ලැබී ඇත. රත්නපුර ඇගයීම් වාර්තාව මෙතක් ලැබී නොමැත.

#### රසායනාගාර උපකරණ

අභ්‍යන්තර වශයෙන් අනුමත කමිටුව විසින් රසායනාගාර උපකරණ නැවත ඇගයීම සිදු කරනු ලබයි.

#### අනෙකුත් වත්කම්

සමාලෝචිත කාල සීමාව තුළ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු අනෙකුත් වත්කම් නැවත තක්සේරු කිරීම සිදුකර නොමැත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### 3.6. සිදු වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනට ප්‍රාග්ධනීකරණය නොකරන ලද වර්ෂය තුළ වූ වියදම් සිදු වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ ලෙස දක්වන අතර ප්‍රාග් -ධනීකරණය කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත හා උපකරණ වෙත ලබා දී තිබේ.

### 3.7. කල්බදු ඉඩම්

යම් විධිවිධානයක්, වත්කමක් හෝ කල්බද්දක් ආරම්භක දිනයේ දී විධිවිධානයේ තත්වය මත පදනම් වන්නේ ද,විධිවිධානය සපුරාලීම යම් වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත රඳා පවතින්නේ ද, නැතහොත් එකී විධිවිධානය මගින් වත්කම් භාවිත කිරීමේ අයිතිය ලබා දෙන්නේ ද (එම අයිතිය විධිවිධානයක නිශ්චිතව දක්වා නොමැති වුවද) යන්න තීරණය කෙරේ. කල්බදු වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයු කාලය පහත පරිදි වේ.

කල්බදු ඉඩම - අවුරුදු 50

### 3.8. අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂ- යට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් ඇති කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| අස්පෘශ්‍ය වත්කම් | අපේක්ෂිත සඵල ආයු කාලය |
|---|---|
| SOL Server 2012 ප්‍රමිතිය සඳහා බලපත්‍රය | අවුරුදු 2 |
| Hsenid මෘදුකාංග පද්ධතිය | අවුරුදු 5 |
| Finpac මෘදුකාංග | අවුරුදු 6 |
| B 60 සහනය සඳහා මෘදුකාංග පැකේජය | අවුරුදු 4 |
| Hsenid මෘදුකාංග නිපැයුම MSL/Co. | අවුරුදු 4 |
| Factory Moder / ප්‍රතිරෝපණ මෘදුකාංගය | අවුරුදු 4 |
| Jumla මාදිලියේ වෙබ් අඩවිය | අවුරුදු |
| Finpac ඒකක අනුකලනය | අවුරුදු 6 |
| FINPAC ස්ථාවර වත්කම් මොඩියුලය | අවුරුදු 10 |
| HSenid – TI මොඩියුල මෘදුකාංගය | අවුරුදු 3 |
| DMS- තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය | අවුරුදු 3 |
| Hsenid මානව සම්පත් පද්ධතිය | අවුරුදු 10 |
| DMS - තේ ඉඩම් දත්ත කළමනාකරණ පද්ධතිය | අවුරුදු 5 |
| Hsenid සේවක මොඩියුලය | අවුරුදු 5 |
| POS බඩුතොග පාලන පද්ධතිය | අවුරුදු 10 |

### 3.9. ආදායම් බදු

වත්මන් ආදායම් බදු වත්කම් සහ වත්මන් හා පූර්ව කාලපරිච්ඡේද සඳහා බැරකම් මනිනු ලබන්නේ බදු අධිකාරීන්ගෙන් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අයකර ගැනීමට හෝ ඔවුන් වෙතට ගෙවීමට අපේක්ෂා කරන මුදලෙනි.

ප්‍රමාණය සංසන්දනය කිරීම සඳහා වාර්තා කරන දිනයේ දී බලපැ- වැත්වෙන හෝ සැලකිය යුතු අන්දමෙන් පනවනු ලබන බදු නීති භාවිත කරනු ලැබේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම් සහ වියදම් පිළිබඳ මූලිකාංග මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ගණනය කෙරේ.

### 3.10. භාණ්ඩ ලැයිස්තු

| | | 4,480,839,140 | 1,308,577,437 |

| S. බැංකු ශේෂ - ලංකා බැංකුව | | |
|---|---|---|
| ගම්පොල | 643,355 | - |
| ගාල්ල | 199,675 | 3,970 |
| රත්නපුර | - | 134,533 |
| නුවර එළිය | 343,430 | - |
| මාතර | 76,999 | 35,750 |
| බණ්ඩාරවෙල | - | 41,599 |
| | **1,263,459** | **215,852** |

### ප්‍රාග්ධන හා සංචිත

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ දී අනුදත් ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

### දායක ප්‍රාග්ධනය

2023.12.31 දිනට රුපියල් 672,012,201.85 ක් වූ රජයේ ප්‍රදානවලින් දායක ප්‍රාග්ධනය සකස්වී ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| 1. රසායනාගාර ආදායම | 2023 (රු.) | 2022(රු.) |
|---|---|---|
| ISO 3720 ප්‍රමිති පරීක්ෂණය | 3,107,750 | 4,936,500 |
| රසායනික විශ්ලේෂණ පරීක්ෂණය | - | 6,500 |
| භෞතික පරීක්ෂණය | 774,500 | 1,415,500 |
| ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ පරීක්ෂණය | 2,611,000 | 6,044,796 |
| වෙනත් තේ සාම්පල පරීක්ෂණය | 15,000 | 3,896,000 |
| පලිබෝධක අවශේෂ විශ්ලේෂණ පරීක්ෂණය | 23,166,000 | 3,490,000 |
| තත්ත්ව සහතිකය සහ වෙනත් සහතික නිකුත් කිරීම | 4,250 | 13,500 |
| සිංහ ලාංඡන පරීක්ෂණය(රසායනික හා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක) | 1,911,000 | - |
| | **31,589,500** | **19,802,796** |

| 2. ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ආදායම | | |
|---|---|---|
| වෙළෙඳුන්ගේ බලපත්‍ර ගාස්තු | 9,108,350 | 9,366,500 |
| දඩ | 6,840,034 | 5,654,644 |
| නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තු | 1,265,000 | 2,245,000 |
| ප්‍රතික්ෂේපිත තේ ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1,202,500 | 1,300,130 |
| තේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම | 1,415,000 | 1,100,000 |
| තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,345,000 | 1,035,000 |
| තේ අපනයනකරුවන්ගේ අලුත් කිරීමේ ගාස්තුව | 44,097,500 | 42,150,000 |
| තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීමේ ගාස්තුව | 3,895,000 | 3,765,000 |
| පුද්ගලික විකුණුම් මණ්ඩල තක්සේරුව | 7,271,500 | 5,379,000 |
| සෘජු විකුණුම් සහතික කිරීමේ ගාස්තු | 320,000 | 763,425 |
| තේ ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 34,927,124 | 29,081,969 |
| ආනයන අයදුම්පත් විකිණීම | 14,240 | 15,160 |
| ගබඩා ලියාපදිංචි කිරීම | 720,000 | 575,000 |
| ගබඩාව අලුත් කිරීම | 1,810,000 | 3,050,000 |
| තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම | 480,000 | 330,000 |
| ප්‍රතික්ෂේපිත තේ මිලදී ගැනීමේ අවසර පත්‍රය | 130,969,457 | 42,115,069 |
| තේ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම | 30,000 | 20,000 |
| බැංකු ඇපකර නිදහස් කිරීමේ අවසර පත්‍රය | 514,000 | 414,000 |
| තේ සාම්පල රස බැලීමෙන් ලැබෙන ආදායම | 878,250 | 815,500 |
| තේ ඇසුරුම්/වෙනත් සම්භවයක් ඇති තේ ලියාපදිංචි කිරීම | 771,100 | 314,500 |
| තේ කර්මාන්තශාලා ලියාපදිංචිය අලුත් කිරීම | 4,460,000 | 4,550,000 |
| තේ ආනයනකරුවන් අලුත් කිරීම | 605,000 | 515,000 |
| දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචිය | 790,000 | 401,800 |
| දේශීය ඇසුරුම්කරුවන් අලුත් කිරීම | 731,325 | 785,225 |
| GMP සහතික කිරීමේ ගාස්තුව | 1,250,000 | 2,364,500 |
| තේ සාම්පල පරීක්ෂණ ගාස්තු | 578,405 | 1,439,864 |
| ප්‍රමාද සඳහා දඩ (ලියාපදිංචිය හා ක්‍රියාත්මක නොවීම) | 186,000 | - |
| | **256,474,785** | **159,546,286** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| 3. වාණිජ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ ලාභය | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| තේ අලෙවිය | 26,267,873 | 16,792,380 |
| අපනයන ඇසුරුම් අළෙවියෙන් ලද කොමිස් මුදල | 13,589,764 | 6,744,081 |
| තේ අලෙවිය හා සෞඛ්‍ය පොත | 125,120 | - |
| රෙදි බෑග් විකිණීම | 87,130 | 91,080 |
| විනිමය වෙනස | 347 | 1,097 |
| ප්‍රවර්ධන ද්‍රව්‍ය අළෙවියෙන් ලද ආදායම | 23,215 | 27,365 |
| | **40,093,449** | **23,656,003** |
| තේ සඳහා වියදම | (12,838,576) | (11,728,029) |
| කාර්ය මණ්ඩල දිරි දීමනා | (3,328,146) | (1,004,304) |
| ක්‍රෙඩිට් කාඩ්වලින් ලද කොමිස් මුදල | (2,114,361) | (723,505) |
| වාණිජ ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ ලාභය | 21,812,366 | 10,200,165 |
| **4. නුවර එළිය විකුණුම් කවුන්ටරය සහ සංචාරක බංගලාව** | | |
| විකුණුම් කවුන්ටරය - කුලී ආදායම හා විකිණීමෙන් ලද කොමිස් මුදල | 1,337,955 | 682,954 |
| සංචාරක බංගලාව | 529,350 | 331,000 |
| | **1,867,305** | **1,013,954** |
| **5. වෙනත් ආදායම්** | | |
| කාර්යමණ්ඩල ණය සඳහා පොළිය | 1,586,828 | 1,545,236 |
| විවිධ ආදායම | 8,657,185 | 4,993,316 |
| සංඛ්‍යානමය සාරාංශය විකිණීම | 94,249 | 117,786 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 287,000 | 458,000 |
| පුවත් ලිපිය | 252,000 | 108,000 |
| පෝස්ටර්, නාමාවලි සහ අනෙකුත් දෑ විකිණීම | 19,065 | 12,135 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය | 1,031,133 | 1,380,288 |
| අපනයනකරුවන්ගේ නාමාවලි/ දැන්වීම් ලියාපදිංචි කිරීම | - | 27,000 |
| විශ්ලේෂණ පිරිවැය | - | 14,500 |
| | **11,927,460** | **8,656,261** |
| **6. පරිපාලන වියදම්** | | |
| **6.1. පුද්ගල පඩිනඩි** | | |
| වැටුප් | 121,604,104 | 123,334,154 |
| වෙනත් දීමනා (අන්තර්වාර / වෙනත්) | 21,730,887 | 20,820,170 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 10,830,771 | 7,718,512 |
| දෛනිකව ගෙවන වැටුප | 8,780,806 | 6,287,691 |
| ජීවන වියදම් දීමනා | 22,864,434 | 23,533,120 |
| සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය | 21,897,745 | 19,331,151 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 4,435,788 | 4,484,233 |
| කාර්ය මණ්ඩල පාරිතෝෂික | 7,212,000 | 12,355,278 |
| | **219,356,5345** | **217,864,309** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| **6.2. වෙනත් පරිපාලන වියදම්** | | |
| සාමාජිකත්ව දායකත්වය (වෘත්තිය) | 32,000 | 95,663 |
| කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා | 6,375,000 | 6,325,000 |
| වෛද්‍ය ප්‍රතිලාභ / පුද්ගලික අනතුරු වෙනුවෙන් හිමිකම් ඉල්ලිම් | 42,485,202 | 40,657,400 |
| කාර්ය මණ්ඩලයට සපයන දියර තේ | 5,477,652 | 3,239,792 |
| කාර්ය මණ්ඩලයට සපයන ඇසුරුම් කළ තේ | 9,074,235 | 9,019,111 |
| සේවක සුබසාධනය | 3,439,986 | 2,475,150 |
| මරණ පරිත්‍යාගය | 750,000 | 750,000 |
| ක්‍රීඩා / විනෝදාත්මක පහසුකම් | 500,000 | 250,000 |
| කාර්යමණ්ඩල දේපල ණය සඳහා පොළිය | 702,603 | 769,106 |
| කාර්ය මණ්ඩල පුහුණු / සම්මන්ත්‍රණ / වැඩමුළු | 13,094,140 | 640,030 |
| මණ්ඩල / කමිටු සාමාජිකයින්ට ගාස්තු ගෙවීම් | 1,866,800 | 514,500 |
| මණ්ඩල රැස්වීම් වියදම් | 155,240 | 161,225 |
| විශ්ලේෂණ රසායනාගාරය - පරිභෝජන ද්‍රව්‍ය | 8,803,310 | 3,926,390 |
| විභාග ගාස්තු | 118,729 | 144,561 |
| උපදේශන ගාස්තු | 7,000 | 356,305 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 18,570 | 26,390 |
| | **92,900,4697** | **69,350,623** |
| **7. ගමන් වියදම්** | | |
| ගමන් වියදම් (දේශීය) | 26,617,391 | 21,002,386 |
| | 26,617,391 | 21,002,386 |
| **8. සැපයුම් සහ අවශ්‍යතා** | | |
| මුද්‍රණ ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 2,169,440 | 7,568,552 |
| ඉන්ධන සහ ලිහිසි තෙල | 12,691,509 | 9,819,488 |
| යාන්ත්‍රික, විදුලි හා සාමාන්‍ය භාණ්ඩ | 2,284,305 | 360,772 |
| පොත්, වාර සඟරා සහ පුවත්පත් | 776,714 | 631,930 |
| නිල ඇඳුම් | 3,742,564 | 1,829,935 |
| | **21,664,5312** | **20,210,677** |
| **9. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම** | | |
| වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 4,329,943 | 3,425,900 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව | | 4,294,267 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව | 7,127,765 | 12,933,901 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව | 19,827,854 | 15,364,569 |
| ගෘහ භාණ්ඩ හා සවිකුරු අලුත්වැඩියාව හා නඩත්තුව | | 42,014 |
| වෙනත් උපයෝජන සේවා | | 52,151 |
| සනීපාරක්ෂක සේවය | | 7,844,314 |
| විද්‍යාගාර ප්‍රතිනයය හා උපකරණ නඩත්තු කිරීම | 2,948,371 | 504,391 |
| | **46,582,638** | **44,461,507** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| 10. උපයෝගිතා සහ වෙනත් වියදම් | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| පුවත්පත් දැන්වීම් | 16,105,067 | 8,941,992 |
| දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය | 7,429,792 | 6,955,944 |
| තැපැල් ගාස්තු | 2,611,160 | 1,452,232 |
| විදුලිය | 19,551,505 | 10,095,444 |
| ගාස්තු සහ බදු | 1,842,995 | 1,535,626 |
| කුලිය | 8,546,678 | 10,283,695 |
| රක්ෂණය - ගොඩනැගිලි, වාහන ආදිය | 859,982 | 1,239,478 |
| ආරක්ෂක සේවා | 12,205,657 | 12,568,734 |
| විගණන ගාස්තු | 1,500,000 | 1,228,100 |
| නීති ගාස්තු | 1,986,560 | 945,040 |
| වෙනත් ගාස්තු | 581,290 | 1,457,947 |
| තේ සාම්පල පරීක්ෂණ ගාස්තු | 2,311,692 | 3,037,012 |
| ජල සැපයුම සහ උණුසුම් කිරීම | 4,818,783 | 1,038,038 |
| තේ රස බැලීමේ මණ්ඩල ගාස්තු | 3,207,300 | 3,506,532 |
| විවිධ වියදම් | 2,099,892 | 680,111 |
| වාහන සඳහා බදු කුලී | 25,709,832 | 22,231,371 |
| ඉඩම් සඳහා බදු කුලී | 480,000 | 480,000 |
| තේ රස බැලීමේ කාමර අවශ්‍යතා | 199,000 | - |
| හදිසි අවස්ථා- කෝවිඩ් -19 | - | 1,199,275 |
| රඳවා ගැනීමේ බද්ද | 100,000 | |
| නුවර එළිය වියදම් | 162,373 | 207,099 |
| | **112,309,558** | **89,083,670** |

| 11. තොග | | |
|---|---|---|
| **11.1. රසායනාගාරය** | | |
| රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය | 15,938,448 | 11,797,799 |
| | **15,938,448** | **11,797,799** |
| **11.2. පරිභෝජන ද්‍රව්‍ය** | | |
| ලිපි ද්‍රව්‍ය | 16,508,776 | 8,279,224 |
| ප්‍රවර්ධන ද්‍රව්‍ය | 3,990,969 | 818,272 |
| | **20,499,745** | **9,097,496** |
| **11.3. තේ සහ වෙනත් තොග** | | |
| තේ - ප්‍රධාන ගබඩා | 6,781,662 | 6,455,499 |
| තේ - විකුණුම් කවුන්ටරය | 776,862 | 266,463 |
| කාර්ය මණ්ඩල සඳහා තේ | 539,484 | 711,710 |
| හිස් පෙට්ටි | 18,788,148 | 4,288,556 |
| තේ රැගෙන යන බැග් | 79,994 | 79,994 |
| ගැට ගසන පටිය | 45,000 | 45,000 |
| | **27,011,150** | **11,847,222** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| **11.4. සංක්‍රමණ භාණ්ඩ** | 1,110,594 | 1,752,461 |
| | 1,110,594 | 1,752,461 |
| | **64,559,937** | **34,494,977** |
| **12. ලැබිය යුතු දේ** | | |
| NIPM වාහන සඳහා ණය | - | 1,333,333 |
| විවිධ ලැබීම් | 38,428,556 | 53,505,130 |
| ණය ගැනියන් පාලනය | 16,408,725 | 811,372 |
| ලැබිය යුතු ආදායම | 1,535,770 | 1,303,359 |
| පැකට් කළ තේ අලෙවිය | 329,632 | 328,607 |
| සිලෝන් තේ කෞතුකාගාරය | 960,998 | - |
| හිඟය | 422,103 | 367,790 |
| | **58,085,784** | **57,649,591** |
| **12.1. තානාපති කාර්යාල ගිණුම්** | | |
| චීනය | 84,764 | 84,764 |
| මොස්කව් | 8,699,564 | - |
| ඕස්ට්‍රේලියාව | 47,810 | 47,810 |
| | **8,832,138** | **132,574** |
| **12.2. තේ ප්‍රවර්ධන එකකය - ජංගම ගිණුම්** | | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 8,237,377 | 10,713,769 |
| මොස්කව් | 24,782,144 | 9,330,450 |
| චීනය | 1,223,337 | 3,446,805 |
| | **34,242,858** | **23,491,024** |
| **13. ණය සහ අත්තිකාරම්** | | |
| ඒකාබද්ධ ණය - තේ කොමසාරිස් අංශය | 5,552,660 | 5,251,360 |
| ඒකාබද්ධ ණය - ප්‍රධාන කාර්යාලය | 31,346,263 | 33,405,543 |
| උත්සව අත්තිකාරම් | 383,150 | 435,650 |
| කාර්ය මණ්ඩල තේ ප්‍රතිසාධනය | 200,429 | 46,110 |
| කාර්ය මණ්ඩල ණය ගැනියන් | 30,775 | 16,500 |
| අත්තිකාරම් - කුඩා තේ වතු සවර්ධන අධිකාරිය | 33,470,665 | 33,470,665 |
| කලින් කරන ලද වියදම් - වෙළඳ ප්‍රදර්ශන | 67,820,442 | - |
| කලින් කරන ලද වියදම් | 1,178,179 | 619,352 |
| ණය සහ අත්තිකාරම් - මොස්කව් | | 11,459 |
| | **139,994,022** | **73,256,639** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| 14. තැන්පතු සහ පෙර ගෙවුම් | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| තැන්පතු | 5,707,511 | 6,269,386 |
| මුද්දර තැන්පතු | 160,000 | 160,000 |
| පාර්සල් තැපැල් තැන්පතු | 44,940 | 44,940 |
| තැන්පතු සහ පෙරගෙවුම් - චීනය | 2,176,602 | 372,369 |
| පෙරගෙවුම් | 7,766,434 | 48,273,744 |
| සජීවිකරණ අත්තිකාරම් | 38,497,041 | 4,547,828 |
| | **54,352,528** | **59,668,267** |

| 15. ආයෝජන | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතුව - ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 1,122,898,927 | 536,983,997 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 29,417,656 | 21,285,498 |
| ස්ථාවර තැන්පතුව - ප්‍රවර්ධන හා අළෙවිකරණ බද්ද | 12,217,313,503 | 9,145,424,351 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ප්‍රවර්ධන හා අළෙවිකරණ බද්ද | 271,324,717 | 174,524,300 |
| නිවාස ණය තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | - | 2,978,541 |
| | **13,640,954,803** | **9,881,196,687** |

| 16. මුදල් සහ මුදල් හා සමාන දෑ | | |
|---|---|---|
| **16.1. මුදල්** | | |
| සුළු අක්මුදල් - මුද්දර | 10,000 | 10,000 |
| සුළු අක්මුදල් ඒ පාලන | - | 25,000 |
| අත ඇති විකුණුම් මත එකතු කිරීම | 2,170,561 | 727,371 |
| | **2,180,561** | **762,371** |
| **16.2. බැංකු ශේෂ** | | |
| ලංකා බැංකුව - කොල්ලුපිටිය 2 | 39,389,444 | 144,157,678 |
| ලංකා බැංකුව- ආයතනික (ප්‍රධාන කාර්යාලය) | 22,413,375 | 23,000 |
| ලංකා බැංකුව - බම්බලපිටිය | 91,283,607 | 28,484,916 |
| ලංකා බැංකුව - ආයතනික (තේ කොමසාරිස් අංශය) | 16,515,721 | 6,807,022 |
| ලංකා බැංකුව - නිදහස් චතුරශ්‍රය | 3,495,374 | 124,764,637 |
| ලංකා බැංකුව - තේ සහනාධාරය | 19,236,911 | 18,048,224 |
| මහජන බැංකු ගිණුම් අංක 204-1-001-6-0009866 | 981,593 | 49,777,984 |
| මහජන බැංකුව | 2,776,729 | - |
| | **196,092,754** | **372,063,461** |
| **16.3. ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්** | | |
| ගාල්ල | 213,385 | 535,556 |
| මාතර | 121,447 | 166,650 |
| රත්නපුර | 818,885 | 847,887 |
| මතුගම | 265,893 | 222,569 |
| බණ්ඩාරවෙල | 50,937 | 547,919 |
| ගම්පොල | 168,518 | 77,475 |
| නුවරඑළිය | 148,641 | 208,766 |
| | **1,787,706** | **2,606,822** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| **16.4. ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ එකතු කිරීමේ ගිණුම්** | | |
| ගම්පොල | - | 9,466,261 |
| රත්නපුර | 3,947,879 | - |
| බණ්ඩාරවෙල | 2,610,565 | - |
| මතුගම | 7,370,282 | 2,078,288 |
| නුවරඑළිය | | 43,498 |
| | **13,928,726** | **11,588,047** |
| **16.5. ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්** | | |
| රත්නපුර | - | 113,400 |
| ගම්පොල | - | 290,829 |
| මතුගම | - | 306,502 |
| නුවරඑළිය | - | 188,377 |
| බණ්ඩාරවෙල | - | 147,950 |
| | **-** | **1,047,058** |
| | **213,989,748** | **388,067,757** |
| **17. ණය හිමියන් සහ ප්‍රතිපාදන** | | |
| **17.1. වෙළඳ ගෙවිය යුතු දෑ** | | |
| ගෙවිය යුතු දෑ | 6,102,598 | 7,486,740 |
| ණය හිමි පාලනය | - | 139,325 |
| ණය හිමි තේ ඇණවුම් | 24,642 | 24,643 |
| ණය හිමියන් සහ ප්‍රතිපාදන - චීනය | 177,865 | - |
| ණය හිමියන් සහ ප්‍රතිපාදන - මොස්කව් | 4,157 | 5,563 |
| | **6,309,262** | **7,656,271** |
| **17.2. වෙනත් ගෙවීම්** | | |
| සාමාන්‍ය තැන්පතු | 228,064,247 | 220,454,440 |
| රඳවා ගැනීමේ මුදල් තැන්පතු | 33,799,915 | 32,739,613 |
| ලංකා තේ මණ්ඩලයේ නිල අසුරුම්කරු | 6,396,186 | 7,985,021 |
| කාර්යමණ්ඩලයේ ණය හිමියන් | 6,375,000 | 6,327,395 |
| හිඟ - හරිත පත්‍ර තැන්පතු | 90,304,143 | 92,245,738 |
| CUSDEC තැන්පතුව | 161,400 | 161,400 |
| ආපසු ගෙවීමේ ටෙන්ඩර් තැන්පතු | 10,000 | |
| රඳවා ගැනීමේ දිරි දීමනා - විකුණුම් කවුන්ටරය | 334,860 | 93,985 |
| ගෙවිය යුතු වැට් බදු | 4,707,761 | 3,288,923 |
| | **370,153,512** | **363,296,515** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| **17.3. කල් ඇතිව ලැබීම්** | | |
| නුවරඑළිය - විකුණුම් මධ්‍යස්ථානය | 1,620,000 | 1,620,000 |
| වෙළඳ ප්‍රදර්ශනය | 58,033,810 | 24,275,448 |
| බලපත්‍ර ගාස්තු | 6,985,000 | 7,920,100 |
| ප්‍රතික්ෂේපිත තේ | 850,000 | 887,500 |
| ගබඩාව අලුත් කිරීම | 1,560,000 | 1,280,000 |
| නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,750,000 | 1,250,000 |
| තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 155,000 | 225,000 |
| තේ අපනයනකරුවන් අලුත් කිරීම | 30,565,000 | 32,057,500 |
| තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීම | 2,375,000 | 2,255,000 |
| තේ ගබඩාව ලියාපදිංචි කිරීම | 50,000 | 135,000 |
| අපනයනකරුවන් ලියාපදිංචි කිරීම | 155,000 | 250,000 |
| දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 5,000 | 20,000 |
| තේ ආනයනකරුවන් අලුත් කිරීම | 415,000 | 395,000 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය සඳහා වෛද්‍ය තැන්පතු | 1,125,100 | 910,600 |
| තේ කර්මාන්තශාලා ලියාපදිංචිය, අලුත් කිරීම | 3,820,000 | 1,695,000 |
| දේශීය ඇසුරුම්කරුවන්  අලුත් කිරීම | 280,000 | 192,500 |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්ද | 43,754,775 | 46,694,389 |
| විකුණුම් කවුන්ටරය - කුලී තැන්පතුව | - | 960,000 |
| තැන්පතු - BMF | 345,743 | 345,742 |
| | **153,844,428** | **123,368,779** |
| **17.4. උපචිත වියදම්** | | |
| උපචිත වියදම් | 46,058,429 | 25,098,260 |
| උපචිත වියදම් - ප්‍රවර්ධන හා අලෙවි බද්ද | 19,013,571 | 610,706,415 |
| | **65,072,000** | **635,804,675** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| **17.5. වෙනත් ප්‍රතිපාදන** | | |
| ගමන් | 6,010,664 | 5,643,701 |
| විගණන ගාස්තු | 2,555,700 | 2,228,100 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා මුද්‍රණය කිරීම | 106,000 | 1,051,670 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,058,481 | 664,385 |
| වාර සඟරා සහ පුවත්පත් | 135,620 | 247,550 |
| නඩත්තු වියදම් | 1,621,005 | 680,701 |
| තැපැල් හා සන්නිවේදනය | 1,028,029 | 780,965 |
| විදුලිය සහ ජලය | 1,995,920 | 1,080,078 |
| කුලි සහ දේශීය බදු | 675,000 | 150,000 |
| සනීපාරක්ෂක සේවා | 592,515 | 644,729 |
| ආරක්ෂක සේවා | 1,034,374 | 1,075,623 |
| වෛද්‍ය ප්‍රතිලාභ | 2,944,979 | 3,255,588 |
| අතිකාල සහ දෛනිකව ගෙවන වැටුප | 2,090,581 | 1,609,328 |
| APIT ගෙවීම් | 878 | - |
| නෛතික හා වෙනත් ගාස්තු | 41,500 | - |
| මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා විසිරි ජල බිඳු පද්ධතිය | - | 9,031,600 |
| පෙව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රමය | 49,316,000 | 51,300,000 |
| සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | 39,509 | - |
| යාන්ත්‍රිකකරණය සමග නව වගාව සඳහා සහනාධාර ක්‍රමය | 12,297,900 | 26,708,400 |
| පුවත්පත් දැන්වීම් හා වෙළඳ දැන්වීම් | 277,680 | 3,223,486 |
| ආදර්ශ තේ වතු සහනාධාර යෝජනාක්‍රමය | 20,357,961 | 21,154,461 |
| GMP - තෙතමනය මිටර සහනාධාර යෝජනා ක්‍රමය | - | 2,500,000 |
| තේ තවාන් සංවර්ධන වියදම් සඳහා සහනාධාර | 43,029,000 | 45,025,000 |
| අපනයනකරුවන්ගේ යන්ත්‍රෝපකරණ සංරවක සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | - | 395,833 |
| තේ නැවත වගා කිරීම හා අලුතෙන් වගා කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | 6,224,439 | - |
| | **153,433,737** | **178,451,198** |

| **18. තේ තැරැව්කරුවන් සඳහා අරමුදල් පහසුකම්** | 8% ණය | ණය | එකතුව |
|---|---|---|---|
| ඒසියා සියාකා කොමඩිටිස් සමාගම | 14,987,593 | - | 14,987,593.30 |
| බාර්ටිලිට් ප්‍රොඩියුස් මාර්කටින් පුද් සමාගම | (51,941.69) | 3,333,333.33 | 3,281,391.64 |
| මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් | 2,370,892 | - | 2,370,892.47 |
| සිලෝන් ටී බ්‍රෝකර්ස් | 1,363,926 | - | 1,363,926.39 |
| ෆෝබිස් ඇන්ඩ් වෝකර්ස් පුද් සමාගම | 4 | 22,720,249.00 | 22,720,253.50 |
| ජෝන් කිල්ස් සමාගම | 2,102,646 | - | 2,102,646.16 |
| ලංකා කොමඩිටි බ්‍රෝකර්ස් ලිමිටඩ් | 8,911,087 | 5,332,333.33 | 14,243,420.40 |
| **එකතුව** | **29,684,208** | **31,385,915.66** | **61,070,123.86** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීජඑල්/ඩී/එස්එල්ටීබී/ 1/2023/09

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූලි 24 දින

සභාපති,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 183,520,144 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීම හෝ ගිණුම් වල හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයට අදාළ ගැලපීම් කළ යුතු වුවත්, මණ්ඩලයේ බදු පසු ලාභය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කර තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව රසායනාගාර ආදායම රු.31,589,500 ක් වුවද, රසායනාගාරය විසින් ඉදිරිපත් කළ වාර්තා අනුව එම අගය රු.42,927,750 ක් වූ බැවින් රු.11,338,250 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2024 වර්ෂයේදී රුසියාවේ මොස්කව් හිදී පැවැත්වීමට නියමිත "Prodexpo 2024" ප්‍රදර්ශනයෙහි වීසා සහ ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවූ රු. 5,573,342 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් අධිගණනය වී ඉදිරියට කළ ගෙවීම් අවප්‍රමාණය වී තිබුණි.

(ඉ) පසුගිය වර්ෂයේදී අඩුවෙන් ගිණුම්ගත කළ රු.4,800,000 ක ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීමේ වියදම් ගිණුම්ගත කරනු ලබන ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට ගැලපීම් වෙනුවට රඳවාගත් ගත් ඉපයුම් යටතේ ගැලපීම් කිරීම් තුළින් එම වටිනාකමෙන් රඳවාගත් ඉපයුම් ගිණුම අවප්‍රමාණය වී, ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුම අධිප්‍රමාණය වී තිබුණි.

(ඊ) ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීම වෙනුවෙන් අපනයනකරුවන් 05 දෙනෙකුගෙන් 2021 මූල්‍ය වර්ෂයේදී ලැබූ අත්තිකාරම් මුදලින් රු.586,550 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවීමේදී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට හර කිරීම වෙනුවට ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීමේ වියදම් ගිණුමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් රු. 586,550 කින් අධිගණනය වී තිබුණි.

(උ) "සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනෙහි නිර්මාණාත්මක කාර්යයන් 06 ක් සිදුනොකිරීමට මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී තීරණය කර තිබුණද ඒ සඳහා 2017 වර්ෂයේදී සිදුකරන ලද රු.9,414,411 ක වෙන්කිරීම් නැවත ගැලපීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලෙවි හා ප්‍රවර්ධන උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ජංගම වගකීම් අධිගණනය වී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු අවප්‍රමාණය වී තිබුණි.

(ඌ) මණ්ඩලයෙහි නිමි තේ ඇසුරුම්කරු (SLTB Official Packer) වෙත ගෙවිය යුතු රු.4,534,238 ක් ගෙවියයුතු සේ දෙපාරක් ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයෙහි නිමි තේ ඇසුරුම්කරු විසින් ප්‍රධාන ගබඩාව වෙත සැපයූ රු.2,628,416 ක නිමි තේ තොග තේ අලෙවිසැලෙහි ගැණුම් ලෙස ගිණුම් තබා නොතිබුණු බැවින් එම අගයෙන් වර්ෂයේ අතිරික්තය අධිගණනය වී නිමි තේ ඇසුරුම්කරු වෙත ගෙවිය යුතු වටිනාකම අවප්‍රමාණය වී තිබුණි.

(ඒ) ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රධාන ගබඩාවෙන් නොමිලේ (FOC) සමාලෝචිත වර්ෂය තුළ නිකුත්කර තිබූ රු.905,187 ක ප්‍රවර්ධන ද්‍රව්‍ය (තේ සහ ඇසුරුම් හැර) විදේශ මෙහෙයුම් සඳහා තේ නිකුත් කිරීමේ වියදම් ගිණුමට හර කර, විකුණුම් පිරිවැයට බැර කර තිබුණු බැවින් වර්ෂයේ විකුණුම් පිරිවැය රු.905,187 කින් අඩුවී වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඔ) 2023 දෙසැම්බර් 31 දිනට අවසන් තොග වටිනාකම ගණනය කිරීමේදී ප්‍රධාන ගබඩාවේ පැවති රු.3,774,644 ක රෙදි බෑග් තොග ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ ලිපි ද්‍රව්‍ය යන ගිණුම් ද්විත්වය තුළම ගිණුම්ගත කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනයේ එම ප්‍රමාණයෙන් පරිභෝජන ද්‍රව්‍ය තොග වටිනාකම අධිගණනය වී අතිරික්තය අවප්‍රමාණය වී තිබුණි.

(ඕ) 2023 වර්ෂය ආරම්භයේදී රු.51,300,000ක කාබනික පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීමේ ගිණුමක් පැවතියද, 2023 වර්ෂයේදී එම ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද රු.1,100,000 ක සහනාධාර ප්‍රමාණය වෙන්කිරීමේ ගිණුමට හර නොකර වියදම් ගිණුමට හර කර තිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී කාබනික පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම් අධිගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ

විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි 02 හා 03 වන නියෝග | තේ අපනයනය කිරීම සඳහා ඉඩ දෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු බදු ප්‍රකාශයේ (CUSDEC) අවසරය ලබාදෙන වේලාවේදී සෑම තේ කිලෝග්‍රෑමයක් සඳහා සෑම ලියාපදිංචි තේ අපනයනකරුවකුගෙන්ම රුපියල් 3.50 ක බද්දක් අයකිරීමේ ගැසට් පත්‍රය 2021 දෙසැම්බර් 14 දිනැති, අංක 2258/15 දරන ගැසට් පත්‍රය මගින් අහෝසි කර තිබුණි. එසේ තිබියදී 2021 දෙසැම්බර් 15 සිට 2023 අගෝස්තු 04 දින දක්වා මණ්ඩලය විසින් තේ අපනයන කරුවන්ගෙන් රු.1,003,428,373 ක් අයකර ගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය හා අපනයනය ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදි සියයට 18 ක් වූ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සමාලෝචිත වර්ෂය වන විට සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2023) අනුව නිරීක්ෂණය වුවද වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) "සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ඉහල මට්ටමේ ප්‍රචාරණය සඳහා රූපවාහිනී මාධ්‍යය යොදාගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් රූපවාහිනී වෙළෙඳ දැන්වීම නිර්මාණයට හා එය චීන, ජපන් ,අරාබි,යුක්‍රේන්, ජර්මන් සහ තුර්කි භාෂා මාධ්‍යයන් වලට සිදුකරන ලද පරිවර්තන සඳහාද 2016 සිට 2020 වර්ෂය දක්වා රු.174,332,138 ක වියදමක් දරා තිබුණද එම වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීමේ මූලික අරමුණ වූ රූපවාහිනී මාධ්‍ය තුළ ප්‍රචාරණය සිදුකර ගැනීමට අවශ්‍යය මාධ්‍ය මිලදී ගැනීම හා ඒ සම්බන්ධ සැලසුම් සකස්කර නොතිබුණු බැවින් රූපවාහිනී මාධ්‍ය තුළ ප්‍රචාරණයක් සිදුකර නොතිබුණි. එසේම රු. 39,832,808 ක වියදමින් නිර්මාණය කරන ලද නිර්මාණාත්මක කාර්යයන් 31 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2019 සිට 2023 කාලපරිච්ඡේදය තුළ රු.107,088,740 ක මුදලක් වියදම් කර තිබූ නමුත් සකස් කර තිබූ මාධ්‍ය සැළසුම් අතුරින් විලී රාජ්‍ය සඳහා ඉදිරිපත් කර තිබූ මාධ්‍ය සැලසුම හැරුණු කොට අනෙක් සියලුම රටවල් සඳහා ඉදිරිපත් කර තිබුණු මාධ්‍ය සැළසුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටදී එහි සඳහන් කාලය ඉකුත් වී තිබුණු නමුත් එම කාර්‍යයන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් 2021 සිට 2023 දක්වා වාර්තාකර නොතිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්දියාවට සහ පාකිස්ථානයට සිදුකළ මුළු අපනයන ප්‍රමාණය පිළිවෙලින් සියයට 10 කින් හා සියයට 100 කින් පහළ ගොස් තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) තේ දළු හිමියන් වෙත නියමිත මිල නොගෙවීම නිසා කරන ලද පැමිණිලි වෙනුවෙන් ගෙවීමට සහ තේ කර්මාන්තශාලාවල අයිතිය වෙනස්වීමේදී දළු හිමියන් වෙත ගෙවීම සඳහා තේ කම්හල්හිමියන් විසින් මණ්ඩලයේ තැන්පත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු රු.90,304,143 ක තැන්පතු පැවති අතර ඒ තුළ වසර 5 ඉක්මවූ තැන්පතු ප්‍රමාණය රු. 4,759,784 ක් විය.

(ඊ) තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා රු.53,964,995 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂකගේ (තොරතුරු තාක්ෂණ ) තහවුරුවකින් එකතුව රු.15,716,148 ක් 2023 දෙසැම්බර් 31 වනවිට පුද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මාස 18 කදී කාර්යය නිම කල යුතු වුවද වසර 03 කට ආසන්න කාලයක් ගත වුවද පද්ධතිය සකස් කර නොතිබුණි. මෙම පුද්ගලික ආයතනය විසින් ලබා දුන් රු.26,982,497 ක කාර්යසාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 30 දින අවසන් වී තිබුණද විගණන දින වන විටත් එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වර්ෂ 01ත් 04ත් අතර කාලයක සිට ඉහළ කළමනාකරණ මට්ටමට අයත් අධ්‍යක්ෂ ජෙනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 04 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයෙන් මණ්ඩලයට රු.62,603,006 ක අලාභයක් සිදු වී තිබූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, මේ වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) පොහොර ලබා දීම සඳහා සියයට 8 ක පොළී පදනම මත මණ්ඩලය 2023 වර්ෂය අවසාන වනවිට තේ කර්මාන්තශාලා වෙත එකතුව රු.3,093,468,442 ක ණය ලබාදී තිබුණි. මණ්ඩලය හා අදාල පාර්ශව අතර ඇතිකරගත් ගිවිසුමේ 2.4 වගන්තිය ප්‍රකාරව නියමිත කාල සීමාව අවසානයේ ණය වාරිකය ගෙවීම අපොහොසත් වූ විට ලැබියයුතු ශේෂය මත වාර්ෂිකව සියයට 21ක ප්‍රමාද පොළියක් අයකරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාදවී පියවූ ණය ශේෂයයන් මත කිසිදු ප්‍රමාද පොළියක් මණ්ඩලය විසින් අයකරගෙන නොතිබුණි.

(ඒ) 2012 ජුනි 19 දින පැවති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 11 ප්‍රකාරව මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්

හන්තාන පිහිටි "Ceylon Tea Museum" හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට තීරණය වී තිබුණු නමුත්, වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මේ දක්වා එත්කම් හි අයිතිය පවරා ගැනීමට හෝ, ණය මුදල් ආපසු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රු. 10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු 1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

ඩබ්ලිව්.පී .සී . වික්‍රමරත්න
විගණකාධිපති

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
තැ.පෙ.: 1750, කොළඹ ශ්‍රී ලංකාව
දූ.ක.: 011 2582121 / 011 2583687

ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස: 011 2582122

විද්‍යුත් තැපෑල: ***teaboard@pureceylonte.com***
වෙබ් අඩවිය: ***www. Srilankateaboard.lk***
වෙබ් අඩවියට: ***www.pureceylontea.com***

## සභාපති

දූ.ක: 011 2587814/2590968
ෆැක්ස්: 011 2585701
විද්‍යුත් තැපෑල : ***chairman@pureceylontea.com***

## අධ්‍යක්ෂ ජනරාල්

දූ.ක : 011 2587814/2508991
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: ***dgsltb@pureceylontea.com***

## තේ කොමසාරිස් අංශය

තේ කොමසාරිස
දූ.ක: 0112580182/2580152/2502485/
2584845/2587814/2587773
ෆැක්ස්: 011 2580161
විද්‍යුත් තැපෑල : ***tcd@pureceylontea.com***

## තේ ප්‍රවර්ධන අංශය

අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දූ.ක: 0112583343/2587814/2581418/
2580169
ෆැක්ස් : 011 2587341
විද්‍යුත් තැපෑල : ***promotion@pureceylontea.com***

## තේ අපනයන අංශය

නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දූ.ක: 011 2502485/2584845/2587814/
2504090/2587773
ෆැක්ස්: 011 2584844
විද්‍යුත් තැපෑල : ***exports@pureceylontea.com***

## විශ්ලේෂණ රසායනාගාරය

අධ්‍යක්ෂ (රසායනාගාර)
දූ.ක: 011 2587814/2581576
ෆැක්ස්: 011 2581576
විද්‍යුත් තැපෑල : *lab@pureceylontea.com*

# ප්‍රාදේශීය කාර්යාල

## බදුරලිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281,වතුරන පාර, බදුරලිය
දූ.ක. / ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපෑල: ***atcmathugama@pureceylontea.com***

## බණ්ඩාරවෙල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විශාඛා මාවත, නව බදුල්ල පාර, බණ්ඩාරවෙල
දූ.ක. / ෆැක්ස් : 057-2222812
විද්‍යුත් තැපෑල: ***atcbandarawela@pureceylontea.com***

## ගාල්ල

ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
59/A, ඉහල ඩික්සන් පාර, ගාල්ල
දූ.ක. / ෆැක්ස් : 091-2232052
විද්‍යුත් තැපෑල: ***atcgalle@pureceylontea.com***

## ගම්පොල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගමුව පාර,ගම්පොල
දූ.ක./ෆැක්ස : 081-2352279
විද්‍යුත් තැපෑල: ***atcgampola@pureceylontea.com***

## මාතර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
23, අලුත් මාවත
උයන්වත්ත, මාතර
දුර. / ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපෑල: ***atcmatara@pureceylontea.com***

## නුවර එළිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
10 කෑගල්ල නානුඔය පාර නුවර එළිය
දුර./ෆැක්ස : 0522234658
විද්‍යුත් තැපෑල : ***atcnuwaraeliya@pureceylontea.com***

## රත්නපුර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
61/1, නව නගරය, රත්නපුර
දුර./ෆැක්ස් : 045-2222136
විද්‍යුත් තැපෑල: ***atcrathnapura@pureceylontea.com***

# විදේශීය ශාඛා

## රුසියාව

**3 වන ලේකම් (ප්‍රවර්ධන නිලධාරී)**
සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
තානාපති කාර්යාලය
24, ස්වෙජ්කින විදිය, මොස්කව් 129090
රුසියාව
දුර : 007 495-688-1620
495-68811651/495-688-1463
ෆැක්ස් : 007-495-688-1757
විද්‍යුත් තැපෑල : ***tea@srilankaembassy.ru***

## චීනය

**3 වන ලේකම් (තේ ප්‍රවර්ධන)**
සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය,
අංක. 3, ලාන් හුවා ලු, බීජිං- 100600
මහජන චීන සමුහාණ්ඩුව
දුර : 00-86-10-65322919
ෆැක්ස් : 00-86-10-65325426
විද්‍යුත් තැපෑල : ***ceylontea@slemb.com***

කවරයේ ඡායාරූපය : ජේ. ජයනන්ද තේ පරීක්ෂක - මොරවක තේ පරීක්ෂක කොට්ඨාශය
ග්‍රැෆික් නිර්මාණය : සිවකුමාර් යශෝධා - 0712766223




ශ්‍රී ලංකා තේ මණ්ඩලය
නො : 574, ගාලු පාර
කොළඹ 03

දුරකථන අංකය : +94 11 2587814
ෆැක්ස් : +94 11 2587341
විද්‍යුත් තැපෑල : teaboard@pureceylontea.com
වෙබ් අඩවිය : www.srilankateaboard.lk